ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මුරුතවෙල ජලාශයට යට වන ඉඩ කඩම් හා ගෙවල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දොරවල්වල අයිතිකරුවන් එතුමා පදිංචි කරවීමට බලාපොරොත්තු වන්නේ කොහේද? (ආ) අන් තැනක පදිංචි වී අළුත් ජීවිතයක් ඇරඹීම සඳහා එතුමා මේ අයට දීමට බලාපොරොත්තු වන ආධාර උපකාර මොනවාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) "முருத்த வெல" நீர்த் தேக்கத்தினால் நீரில் மூழ்கும் நிலங்களையும் வீடுகளையும் உடையவர்களுக்கு வேறு நிலம் எவ்விடத்திற் கொடுக்க உத்தேசித்துள்ளார்? (ஆ) வேறு இடத்தில் புதிதாகத் தொடங்கு வதற்கு அவர்களுக்கு எவ்வித உதவி அளிக்க உத்தேசித்துள்ளார்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Where does he propose to settle those whose lands and homesteads will be flooded by the Muruthawela Reservoir? (*b*) What assistance does he propose to give these people, to start a new life elsewhere?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
**(Mr. Seneviratne)**

(අ) ගේ දොර හා ඉඩකඩම් අහිමි වන අය මුරුතවෙල ව්‍යාපාරය යටතේ ඉඩම් කට්ටිවල පදිංචි කරවනු ලැබේ. (ආ) ගෙයට අයිති ඉඩම හා කුඹුරු ඉඩම් සංවර්ධනය කිරීම උදෙසා ජනපදිකයින්ට දෙන සියලුම ආධාර මොවුන්ටද ලබාදෙනු ලැබේ. මෙම ආධාර සහ ඔවුන්ට ලැබෙන ඉඩම්, කට්ටි, ඉඩම් අත්කර ගැනීමේ පරිපාටිය යටතේ ගෙවනු ලබන, වන්දි ප්‍රමාණයට අමතර වය.

## උඩ වලවේ යෝජනා ක්‍රමය: ඉඩම් ඉල්ලූ මුල්කිරිගල වැසියන්

*உட வளவெத் திட்டம்: முல்கிரிகலவில் காணிக்கு விண்ணப்பித்தோர்*

**UDA WALAWE SCHEME: APPLICANTS FOR LAND FROM MULKIRIGALA**

18. **ජයකොඩි මයා.** (ජෝර්ජ් රාජපක්ෂ මයා. වෙනුවට)
*(திரு. ஜயக்கொடி—திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—சார்பாக)*
**(Mr. Jayakody—on behalf of Mr. George Rajapaksa)**

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උඩ වලවේ යෝජනා ක්‍රමය යටතේ ඉඩම් බෙදා දීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳ වූ බව එතුමා දන්නවා ද? (ආ) මුල්කිරිගල ඡන්ද කොට්ඨාශයෙන් ලැබුණු අයදුම් පත් ගණන කීයද? (ඉ) මුල්කිරිගල ඡන්ද කොට්ඨාශයේ මෙම ගොවීන් අතුරෙන්, උඩ වලවේ යෝජනා ක්‍රමය යටතේ ඉඩම් කට්ටි ලැබීම සඳහා තෝරා ගත් ගණන කීයද? (ඊ) කිසිවෙක් තෝරා නොගත්තේ නම්, ඒ මන් ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) "உட வளவெ" யின் கீழ் காணிப்பங்கீட்டிற்கு ஹம்பாந்தோட்டை மாவட்ட கிராம வாசிகளிடமிருந்து மனுக் கள் கோரப்பட்டதை அறிவாரா? (ஆ) "முல் கிறிகல" தேர்தற் றொகுதியிலிருந்து எத்தனை மனுக்கள் கிடைத்தன? (இ) "முல்கிறிகல" தேர்தற்றொகுதிக் கிராமவாசிகளில் எத்தனை பேர் "உட வளவெ" நிலத்துண்டுகளுக்குத் தெரிவுசெய்யப்பட்டுள்ளார்கள்? (ஈ) இல்லை யெனில், ஏன்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that applications were called from the peasants of Hambantota District, for alienation of land under Uda Walawe? (*b*) How many applications were received from the Mulkirigala constituency? (*c*) How many of these peasants in the Mulkirigala constituency have been selected for allotments in Uda Walawe? (*d*) If not, why not?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
**(Mr. Seneviratne)**

(අ) ඔව්. (ආ) 7,224. (ඉ) නැත. (ඊ) මුල්කිරිගල ඡන්ද කොට්ඨාශය පිහිටා ඇති උතුරු හා නැගෙනහිර ගිරුවා පත්තුවෙන් ලත් ඉල්ලුම් පත්‍ර සලකා නොබලන ලද්දේ: (අ) මුරුතවෙල ජලාශ යෝජනා ක්‍රමය යටතේ ඇති ඉඩම් කට්ටි 1,500 ම එම ව්‍යාපාරය පිහිටා ඇති උතුරු හා නැගෙනහිර ගිරුවාපත්තුවේ ඉල්ලුම් කරුවන් සඳහා වෙන් කරන සේ 68.4.16 වෙනි දින ගරු ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමා නියෝග කර තිබීණි ? (ආ) වලවේ ව්‍යාපාරය යටතේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

ඉඩම් කට්ටිවල ප්‍රමාණය අළුත් ජනපද ව්‍යාපාර ප්‍රතිපත්තිය මත මුලින් යෝජිත අක්කර 3 සිට අක්කර 5 දක්වා වැඩි කිරීමත් නිසා වෙන් කළ හැකි ඉඩම් කට්ටි ගණන අඩුවීමත් නිසාය.

## ශෝක ප්‍රකාශය: ඊ. සී. විලර්ස් මහතා

*அநுதாபத் தீர்மானம்: திரு. ஈ. ஸீ. விலர்ஸ்*

## VOTE OF CONDOLENCE: MR. E. C. VILLIERS

අ. භා. 2.13

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**
*(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

Mr. Deputy Speaker, permit me to refer to the death of Mr. E. C. Villiers in England on 27th October 1968. He was a Nominated Member in the State Council from 1932 to 1943.

Mr. Villiers started his planting career in the Uva District in 1912 and he served in the Sabaragamuwa District from 1914 to 1932. During this period he was, for several years, the Chairman of the Sabaragamuwa District Planters' Association. He had the distinction of being the Chairman of the Planters' Association of Ceylon from 1928 to 1930. In recognition of his services he was appointed to the State Council to represent the planting interests. In the State Council he was a useful member of the Executive Committee of Communication and Works and acted for the Minister on two occasions. In 1927 he gave useful evidence before the Royal Commission on Reforms led by Lord Donoughmore.

Mr. Deputy Speaker, on behalf of all the Members of this House I wish to record our deep regret at his passing away, and request that the Acting Clerk of the House be directed to convey our deepest sympathies to the bereaved members of his family.

**ටී. බී. තෙන්නකෝන් මයා. (දඹුල්ල)**
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புளை)*
(Mr. T. B. Tennekoon—Dambulla)

විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් මා ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ආර්. සිංගල්ටන් සැමන් මයා. (පත් කරන ලද මන්ත්‍රී)**
*(திரு. ஆர். சிங்கல்டன்-சமன்—நியமன அங்கத்தவர்)*
(Mr. R. Singleton-Salmon—Appointed Member)

On behalf of the family of the late Mr. E. C. Villiers and of the Planters' Association, I would like to thank the speakers who preceded me for the tributes that they paid to Mr. E. C. Villiers.

He was a very old friend and colleague of mine for the last 42 years. He came of a very distinguished family of the collateral branch of the Earl of Clarendon and descended from George Villiers, Duke of Buckingham. He lived up to that distinguished family's name while he was in Ceylon.

He served the plantation industry for very many years, and, through the plantation industry, the Island of Ceylon in general. He was chairman of my association and represented us in the State Council for about 13 years from 1932 to 1943, when a technical hitch deprived him of his seat.

He and his brother were both planters. His cousin, Sir Thomas Villiers, was a planter and later, in the mercantile sector, Chairman of the Chamber of Commerce. His two nephews were also planters for about 25 years. The family can be considered to have served Ceylon well and faithfully during their careers.

I would thank you, Sir, and would be pleased if a message of condolence could be conveyed to the family.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I wish to associate myself with the sentiments expressed by both sides of the House on the passing away of Mr. E. C. Villiers, *ex*-Member of the State Council. I shall request the Acting Clerk of the House to make a minute of the proceedings of the Meeting today and send a copy thereof to the members of the family of the late Mr. E. C. Villiers.

## ඩී. පී. අතපත්තු මහතා පෞද්ගලිකව කරුණු පැහැදිලි කිරීම

*திரு. டீ. பீ. அத்தபத்து அவர்களது சொந்த விளக்கம்*

## PERSONAL EXPLANATION BY MR. D. P. ATAPATTU

අ. භා. 2.17

**ඩී. පී. අතපත්තු මයා. (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් සහ අධිකරණ ඇමතිගේ වැඩ බලන පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. பீ. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும் நீதி அமைச்சரின் பதில் பாராளுமன்றக் காரியதரிசியும்)*
(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State and Acting Parliamentary Secretary to the Minister of Justice)

Mr. Deputy Speaker, a lot of publicity has been given in the press this morning to an action for which I was not responsible. I have to cite you, Sir, as the best witness to that. The Bill before the House was harmless, an amending Bill introduced by the Hon. Minister of Land, Irrigation and Power. I did not give any serious thought to it because I found that the Hon. Minister was trying to remove from the Irrigation Ordinance some law which had become obsolete by the enactment of the Paddy Lands Act. I gave no serious thought to it at all.

The Ceylon Broadcasting Corporation last night commented on the fact that "Mr. D. P. Atapattu, the Parliamentary Secretary, refrained from voting on this particular Motion." I was shocked to hear this. I really voted with the Government on this particular Motion.

I bring this to your notice because I do not want the public to understand that I was responsible for something I did not do, and I think that the press ought to be a little more careful in these matters. I can excuse them to this extent—that the moment I was counted I sat down. I think everybody observed that. I do not know whether the gentlemen of the press observed that.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I hope the newspapers will take notice of what the hon. Parliamentary Secretary has said, and I hope they will be more careful in future in reporting the proceedings of this House.

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

*சபை அலுவல்*

## BUSINESS OF THE HOUSE

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

With regard to Motion No. 1, the hon. Member for Ambalangoda is not present and the Motion lapses.

Motion No. 2.

**එම්. එස්. අමරසිරි මයා. (හිනිදුම)**
*(திரு. எம். எஸ். அமரசிறி—ஹினிதும)*
(Mr. M. S. Amarasiri—Hiniduma)

I am not moving that Motion because the Ministry has already taken action on that.

අවසර දෙන ලදුව, යෝජනාව ඉල්ලා අස් කර ගන්නා ලදී

பிரேரணை அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.

*Motion by leave, withdrawn.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ගිං ගඟ ගංවතුර ආරක්ෂක හා සංවර්ධන යෝජනා ක්‍රමයක්

## ஜின்கங்கை வெள்ளத்தடுப்பு, அபிவிருத்தித் திட்டம்

## GIN-GANGA FLOOD PROTECTION AND DEVELOPMENT SCHEME

අ. භා. 2.20

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
**(Mr. Amarasiri)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පමම යෝජනාව මා ඉදිරිපත් කරනවා :

"ගිංගඟ ගැලීමෙන් ගාලු දිස්ත්‍රික්කයට සිදුවන විපත වැළැක්වීම සඳහා ගිංගඟ ගංවතුර ආරක්ෂක හා සංවර්ධන යෝජනා ක්‍රමයේ වැඩ වහාම ආරම්භ කළ යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

මෙමම යෝජනාව සම්බන්ධයෙන් මා වචනයක් කියන්නට සතුටුයි. ඉඩම්, වාරි මාර්ග හා විදුලි බල ඇමතිතුමා විසින් සකස් කරන ලද 1965-70 සංවර්ධන සැලැස්මට ගිං ගඟ සංවර්ධන යෝජනා ක්‍රමයක් සහ ගිං ගඟ ගංවතුර ආරක්ෂක යෝජනා ක්‍රම යක් ඇතුළත් කර තිබෙනවා. ගිං ගඟ ගැලීම නිසා ගාලු දිස්ත්‍රික්කයේ හිනිදුම, බද්දේගම, අක්මීමන, බෙන්තර-ඇල්පිටිය, රත්ගම ආදී කොට්ඨාශවල දස දහස් ගණනක් අනාථ වන අතර කුඹුරු අක්කර විසි දහසක පමණ ප්‍රමාණයකට අලාභ හානි සිද්ධ වෙනවා. මේ තත්ත්වය සම්බන්ධ යෙන් රජය විසින් වරින් වර පරීක්ෂණ පවත්වා තිබෙනවා. පසුගිය අවුරුදු විස්ස ඇතුළත ගිං ගඟ ගැලීම පිළිබඳව හා සංවර්ධන යෝජනා ක්‍රමයක් පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නොයෙක් විධියට කරුණු සොයා බලා තිබෙනවා. නමුත් මෙතෙක් ඒ සම්බන්ධව සැලකිය යුතු ක්‍රියා මාර්ගයක් ගෙන නැති බව අපට පෙනී ගියා. එමනිසයි මා මේ යෝජනාව ගරු සභාව ඉදිරිපිට තැබීමට අදහස් කළේ.

ගිං ගඟේ ගංවතුර ගැලීම නිසා අවුරුදු පතා විශේෂයෙන්ම හිනිදුම කොට්ඨාශයේ දහසකට අධික සංඛ්‍යාවක් අනාථ වෙනවා. ඒ සමගම කුඹුරු අක්කර පත් දහසක් පමණ විනාශ වී යනවා. මෙසේ අවුරුදු පතා ඇතිවන ජල ගැල්ම නැවැත්වීමට කිසිම පියවරක් ගෙන නොතිබීම නිසා අවුරුදු පතා සමාජ සේවා දෙපාර්තමේන්තුව ටත් රුපියල් දෙලක්ෂයකට අධික මුදලක් කිසිම ප්‍රයෝජනයක් නැතිව වැය කරන්නට සිද්ධවී තිබෙනවා. සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් දෙන ආධාර මුදල් වලින් අවුරුදුපතා ගැමියන් තාවකාලික ගෙවල් තනා ගත්තත්, ඒවා ස්ථිර ගෙවල් බවට පරිවර්තනය වන්නට පෙර නැවතත් ගංවතුර ඇතිවීමෙන් විනාශ වී යනවා. මේ හේතුව නිසා ගඟ දෙපස ජීවත් වන දහස් සංඛ්‍යාත පිරිසක් නිතරම විශාල අසහනය කින්යි, ජීවත් වෙන්නේ. ගාල්ලේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාවේ මේ කාර ණය සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කර මෙම යෝජනා ක්‍රමයෙහි ඇති අවශ්‍ය තාව ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාං ශයට ඉදිරිපත් කරන්නට යෙදුණා. මුලදී කරන ලද පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශ යෙන් හබරකඩ කියන ප්‍රදේශයේ ගිංගඟ හරහා බැම්මක් බැඳ ජලාශයක් වශයෙන් වතුර රැස් කරගෙන ඒ ජලය ක්‍රමානුකූලව බෙදා හැරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර තිබුණා. එහෙත් මෑතදී ඉංජිනේරු සමාග මක් සමග රජය ගිවිසුමක් අත්සන් කර ඔවුන්ගේ අදහස් අනුව ගිංගඟ හරහා වේල්ලක් නොබැඳ ගිං තොට දක්වා ගඟ දිගේ පහළට ජල ආරක්ෂක බැම් බැඳ වැඩි ජලය ක්‍රමානුකූලව මුහුදට ගලා යාමටත්, ගඟ දෙපස පහත් ප්‍රදේශවල ඇති වන ගං වතුර ඉක්මනින් බැස යාම සඳහා වාරිමාර්ග ක්‍රම සකස් කිරීමටත් වැඩ පිළිවෙලක් සකස් කර තිබෙනවා. මේ කටයුතු සඳහා ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමා සැහෙන වැඩ පිළිවෙලක් යොදා තිබෙන බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. එහෙත් මේ යෝජනා ක්‍රමය ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කළේ නැත්නම් රජයටත් පළාත්වාසීන්ටත් විශාල අසහනයක් ඇති වන බව මා මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් දැනට සකස් කර තිබෙන වාර්තාව අනුව ගිංගඟේ උඩුගම සිට බද්දේගම, අගලිය, ගිංතොට දක්වා ගඟ දෙපස ජල ආරක්ෂක බැම් බැඳ වතුර පොම්ප කිරීමේ මධ්‍යස්ථාන කීපයක් පිහිටුවා ගංවතුර ක්‍රමානුකූලව බැස යාමට විධිවිධාන යෙදීමට පුළුවන් යයි යෝජනා කර තිබෙනවා. ඒ සමගම ගිංතොට මෝය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කට අසල වතුර බැස යාමට පහසු වන අන්දමට ඒ ස්ථානය ශුද්ධ කිරීමටත් යෝජනා කර තිබෙනවා. එහෙම කළ හොත් ඒ වැඩ පිළිවෙල සාර්ථක වන්නට සෑම අතින්ම ඉඩකඩ තිබෙනවා. ඒ ප්‍රදේශවල ගැමියන්ගේ අදහස් අනුව ගිංගඟ සංවර්ධන යෝජනා ක්‍රමයත් ගංවතුර ආරක්ෂක යෝජනා ක්‍රමයත් ඇති කරනතුරු ප්‍රදේශයේ කුඹුරු ගොවිතැන දියුණු කිරීමටත්, ඒවායේ අස්වැන්න වැඩි දියුණු කර ගැනීමටත් කිසිසේත් පුළුවන්කමක් නැහැ. ඒ පළාත්වල ගොවීන් වී වගාව සම්බන්ධයෙන් විශාල උනන්දුවක් දක්වනවා. එසේ ඔවුන් උනන්දුවක් දක්වූවත් අවුරුදුපතා සිදු වන හානිය නිසා ඔවුන් ඉතාම උදාසීන තත්ත්වයකට පත් වෙලයි සිටින්නේ. සාමාන්‍යයෙන් ගාලු දිස්ත්‍රික්කයේ අස්වැන්න ප්‍රමාණය කලින් බුසලකට බුසල් 20 ක් තරම වුණත්, දැන් ඒ ප්‍රමාණය 27 සිට 30 දක්වා වැඩි දියුණු වී තිබෙනවා. ඒ නිසා ජල ආරක්ෂක යෝජනා ක්‍රමයක් ආරම්භ කළොත් ඒ අස්වැන්න ප්‍රමාණය එකට 40 ක් දක්වා වැඩි කර ගන්නට පුළුවන් වන බව ඉන්ජිනේරු විශේෂඥයන්ගේ අදහස බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ඒ අන්දමේ වැඩ පිළිවෙලක් සකස් කළේ නැත්නම් අවුරුදුපතා ජල ගැලීම්වලින් ඇති වන අසහනය නිසා සංවර්ධන කටයුතු සියල්ලම පසු බසිනවා. ඒ වගේම ජල ගැලීම නිසා ප්‍රදේශයේ පාරවල් හා ගඟේ කම්බි පාලම්, අඩි පාලම් ආදිය විනාශ වී යාමෙන් රජයට තවත් පාඩු සිදු වෙනවා. මේ අවුරුද්දේ ජූනි මාසයේ ඇති වූ ගංවතුර නිසා ගිංගඟ ඉහළ ප්‍රදේශයේ මාදුගැට කියන ගමේ රු. 50,000 ක් පමණ වටිනා කම්බි පාලමක් කැඩී ගියා. ඒ වගේම නෙළුව, කොස්වත්ත, මාපලගම, උඩඇලිවිටිය ආදී ගම්වල තිබුණු කම්බි පාලම්ද විනාශ වී ගොස් තිබෙනවා. පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රදේශයේ ගම්සභාවලට දෙන ලද ආධාර මුදල්වලින් තනන ලද පාලම් මේ අන්දමට විනාශ වී යාමෙන් ඒවා අවුරුදුපතා රෙපයේරු කිරීම සඳහාත් අළුත් පාලම් දැමීම සඳහාත් ලක්ෂ සංඛ්‍යාත මුදලක් වැය කරන්නට සිදු වෙනවා. ඒ වාගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නිසි පරිදි ප්‍රදේශයේ ඇලවල් පිරිසිදු නොකිරීම නිසා ගංවතුර පීඩාව තව දුරටත් රඳා පවතිනවා. ගාලු දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම සම්බන්ධීකරණ කාරක සභාව මගින් ගන්නා ලද තීරණයක් අනුව ඇලවල් පිරිසිදු කිරීම සඳහා ඉතා හොඳ වැඩ පිළිවෙළක් යොදා ගෙන යනවා. ඒ අනුව දැන් එම ප්‍රදේශයේ තිබෙන ඇලවල් පිරිසිදු කිරීම නිසා ගොඩ වී තිබෙන ඇලවල් ශුද්ධ පවිත්‍ර වෙනවා. ඒ නිසා පහසුවෙන් වතුර බැස යාමට ඉඩකඩ සැලසෙනවා. ඒ හේතුකොට ගෙන සුළු සුළු ගංවතුර පීඩා වැළැක්වෙන අතරම, ගොවි ජනයාට සිදු වන පාඩු මග හැරවීමටත් කටයුතු සැලසෙනවා. මෙම වර්ෂයේදී ඒ සඳහා විශාල මුදලක් වැය කරන්නටත් කටයුතු යොදා තිබෙනවා. එසේ හෙයින් මෙම සංවර්ධන යෝජනා ක්‍රමය අත්‍යවශ්‍ය දෙයක් හැටියට එම පළාත්වාසීන්ට පෙනී ගොස් තිබෙනවා. ගම්සභා නියෝජිතයන් සහ අනිකුත් සමිති සමාගම්වල නියෝජිතයන් පවා මේ ක්‍රමය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටින බව අපට පෙනෙනවා. ගිංගඟ යෝජනා ක්‍රමය ඇති කළොත් බද්දේගම පළාත්වාසීන්ට ඇති වන අසහනයත් බොහෝ දුරට මග හැරී යාමට ඉඩ තිබෙනවා. මෙම පළාත කලින් නියෝජනය කළ බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් එම අදහස ඉදිරිපත් කර තිබුණා. එහෙත් එම කටයුත්ත ක්‍රියාත්මක කරන්නට ඉඩ ලැබුණේ නැහැ. එසේ හෙයින් පළාතේ ගොවීන්ට සහ ගම්වාසීන්ට විශාල සහනයක් සලසනු සඳහා මෙම සංවර්ධන යෝජනා ක්‍රමය ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කරන ලෙස ගරු ඉඩම් වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

මේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී රුපියල් 2 කෝටි 37 ලක්ෂයක් වැය වන බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් දළ ඇස්තමේන්තුවක් අනුව ප්‍රකාශ කර තිබුණත්, එපමණ මුදලක් වැය නොවන බවයි පළාත වාසීන්ගේ අදහස වන්නේ. ඒ කෙසේ වෙතත්, ඉංජිනේරු මහත්වරුන්ගේ මතය අනුව මෙම කටයුත්ත ඉතා ඉක්මනින් ආරම්භ කිරීමට කටයුතු යොදන ලෙස වාරිමාර්ග අංශය භාර ගරු ඇමතිතුමාගෙන් මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නට කැමතියි. මෙම යෝජනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි මයා.]

ක්‍රමය ක්‍රියාත්මක වීම නිසා ගාලු දිස්ත්‍රික්කයට පමණක් නොව මුළු ලංකාවේම ග්‍රාම සංවර්ධන කටයුතුවලට විශාල රුකුලක් ලැබෙනවා. මේ නිසා පළාත්වාසීන්ගේ අසහනය මග හැරෙනවාත් සමගම කෘෂිකාර්මික කටයුතුවල දියුණුවටත් මග සැලසෙනවා. එම නිසා මෙය ගාලු දිසත්‍රික්කයේ ප්‍රධානතම සංවර්ධන යෝජනා ක්‍රමය වෙනවාට කිසිම සැකයක් නැහැ. ගාලු දිස්ත්‍රික්කයේ තිබෙන සියලුම මන්ත්‍රී කොට්ඨාශවල කෘෂිකාර්මික කටයුතුවලට සැලසෙන දියුණුව නිසා ගාලු දිස්ත්‍රික් සම්බන්ධිකරණ කාරක සභාව මගින්ද මෙම යෝජනාව ඒකමතිකව පිළිගෙන තිබෙනවා. එම නිසා මේ ආදායම් වර්ෂයේදීම මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබුවහොත් ඉන් ප්‍රදේශවාසීන්ට සැලසෙන සහනයත් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් වැය කරන්නට සිදු වන මුදල් ඉතුරුවීමත් නිසා රජයට විශාල සැනසීමක් ලැබෙනවාට කිසිම සැකයක් අත්තේ නැහැ. එසේ හෙයින් මෙම කරුණු මේ සභාවේ විශෙෂ සැලකිල්ලට යොමු කරවමින් මා මෙම යෝජනාව ඉදිරිපත් කරන අතරම, මේ සංවර්ධන යෝජනා ක්‍රමය 1968-69 මුදල් වර්ෂයේදීම ක්‍රියාත්මක කරන්නට ගරු ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමාගේ සැලකිල්ල යොමු වේවායි පතමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 2.30

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
*(திரு. எச். ஜீ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)*
(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,—

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Would you like to speak after the Minister ?

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

මා එතුමාට ප්‍රථමයෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නම්. මා නැගී සිටියේ ගිංගඟ යෝජනා ක්‍රමය පිළිබඳව අපේ සහෝදර හිනිදුම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි මයා.) විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරමින් වචන ස්වල්පයක් කථා කරන්නටයි. ඒ වාගේම ඒ යෝජනා ක්‍රමය පිළිබඳව විශාල ආනදෝලනයක් අදක ඊයෙක සිට නොවෙයි කාලාන්තරයක් තිස්සේම පවතිනවා. අප පුංචි කාලයේ ඇසූ කවියක අන්තිම පදේ මට මතකයි. එනම්, "ගිංතොට නැන්දගෙ දුවරු ගින්දයි ගඟබොඩ පත්තුව වැනසෙන්නේ" යන පදයයි. ඒ අනුව අපට හොඳින්ම තේරුම් ගන්න පුළුවන් එදා සිටම මේ ගිංගඟ නිසා ඒ දෙපස මුළු ප්‍රදේශයම විනාශ වීමේ තර්ජනයකට මුහුණ පා තිබෙන බව. විශෙෂයෙන්ම නිරිත දිග මෝසම් කාලයේදී අවුරුදු පතා ගංවතුර තර්ජනයට මුහුණ පානවා. විශාල වර්ෂාපතනයක් ඇති වීම නිසා පස සෝදා යෑම ඉතාමත් දරුණු අන්දමින් සිදු වෙනවා. දන් අවුරුදු දහස් ගණනක් තිස්සේ හිනිදුම දෙනියාය ප්‍රදේශවලින් අපේ රටේ සාරය මේ ගිංගඟ නිසා මුහුදට සේදී යමින් පවතිනවා. ඉස්සර චීනයේ හොයැංහෝ ගංගාව නිසා මුළු ප්‍රදේශයටම ඇති වී තිබුණ තර්ජනය වැනි තර්ජනයකට ගිංගඟ නිසා අපේ ප්‍රදේශවාසීන් මුහුණ පා සිටිනවා.

අපේ අගමැතිතුමා වගා ව්‍යාපාරය පටන් ගත් සමයේදී මට මතකයි මගේ කොට්ඨාශයේ ගඟබඩ පත්තුවට අයිති ප්‍රදේශයේ මිනිසුන් විශාල වශයෙන් වගා ව්‍යාපාරය පටන් ගත් බව. අවුරුදු සිය ගණනක් තිස්සේ එළිපෙහෙළි නොකර සම්පූර්ණයෙන්ම කැලෑ බවට පත් වී තිබුණ කුඹුරු එළිපෙහෙළි කර, විශාල අස්වැන්නක් බලාපොරොත්තුවෙන් වගා කටයුතු කරගෙන ගියා. එහෙත් මොකක්ද සිද්ධ වුණේ ? ගොයම හොඳට පීදීගෙන එන්න ඔන්න මෙන්න කියා තිබියදී ගංවතුරක් ඇති වීම නිසා අර වගා කළ සියලුම කුඹුරු විනාශ වී ඒ ගොයම් පැල ලාටු බවට පත් වුණා. එදයින් එදා ඒ මිනිසුන් කුඹුරු වැපිරීම නැවතත් අත් හැර දැම්මා. අදත් කරන්නෙ නැහැ.

1956 දී මේ ඇමතිතුමා ඉඩම් ඇමති වශයෙන් පත් වූ අවස්ථාවේදී මේ සම්බන්ධයෙන් සාර්ථක පියවරක් ගන්නා ලෙස අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉල්ලා සිටියා. ඒ තරම් පෙර සිටයි මේ කායඹ සම්බන්ධයෙන් ආන්දෝලනයක් ඇති වී තිබෙන්නෙ. 1960 න් පසුව මා රාජාසන කථාවකට ස්තුති යෝජනාවක් කරන අවස්ථාවේදී, අර පසු ගිය වතාවක ස්තුති යෝජනාව ඉදිරිපත් කළ හිනිදුම ගරු මන්ත්‍රීතුමා වාගේම මමත් ඉල්ලා සිටියා ගිං ගඟ යෝජනා ක්‍රමය වහාම ක්‍රියාත්මක කරන්නය කියා. එකල සිටි හිනිදුම මන්ත්‍රීතුමාත් මේ ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට විශාල ආයාසයක් දැරුවා. ඒ වාගේම මේ මන්ත්‍රීතුමා පත් වී පැමිණි දවසේ සිටම මෙතුමාත් ඒ ගැන බොහෝ වෙහෙසෙන අතර, මට මතකයි, මෙම ව්‍යාපාරය සාර්ථක කරගන්නට බැරි වුණොත් ගිං ගඟට පනිනවාය කියා මහ ජනතාවට පොරොන්දුවක්ද තිබෙන බව. මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් එවැනි බර පතල තත්ත්වයකුයි දැන් ඇති වී තිබෙන්නෙ. මෙය මහජන මන්ත්‍රීවරයකුගේ ජීවිත යක් පිළිබඳ ප්‍රශ්නයක් වී තිබෙනවා.

මේ ගිං ගඟ නිසා අද අපේ ප්‍රදේශයට අවුරුද්දකට හත් අට වතාවක් ගංවතුර එනවා. අපේ හිනිදුම ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී මට එක් දෙයක් පෙනුණා. එනම් දැනට ගිංගඟ සම්බන්ධයෙන් කරන්නට යන ක්‍රමය කලින් අදහස් කළ එකට වඩා වෙනස් එකක් බව. ඉස්සර ඔය ඇමති තුමා අප සමග සිටියදී අපට කියා තිබුණේ, ගිං ගඟේ තැනින් තැන වේලි බැඳ ඒ වේලි මඟින් වතුර රඳවාගෙන ජල විදුලියත් නිපදවීමට හැකි වන විධියේ ක්‍රමයක් සකස් කරන බවයි. එහෙත් අද කරන්නට යන්නේ ගඟ දෙපසේම වේලි දාගෙන ගොස් ගංවතුර බැස්සීම පමණයි. ඒ ක්‍රමය මේ අවුරුද්දේ සිටම පටන්ගෙන ඇගලිය කියන ප්‍රදේශයේ වේල්ලක් දැම්මා. යාර සීයක පමණ සුළු දුර ප්‍රමාණයක දැමූ ඒ කොටසේ වැඩ අවසන් කරන්න ලැබු ණෙත් නැහැ, වතුරට වේල්ල කඩාගෙන ගියා. අද වන තුරු එය හරි ගස්සා නැහැ. එම නිසා එවැනි ක්‍රමයකින් මේ කායඹය ඉෂ්ට කරන්න පුළුවන් වේවිය කියා මා හිතන්නේ නැහැ. අප ඉල්ලා සිටින්නේ මේ ගැන යම් කිසි ස්ථිර ක්‍රමයක් සකස් කළ යුතු බවයි.

අප එසේ ඉල්ලා සිටින්නේ අන් කිසි කරුණක් නිසා නොවෙයි; මේ ප්‍රදේශය මුළු දකුණු දිසාවේම ජීවය රඳා පවතින ප්‍රදේශයක් නිසායි. ගඟබඩ පත්තුව, බෙන්තර-වලල්ලාවිටි කෝරළේ, හිනිදුම් පත්තුව ආදී ප්‍රදේශවල ජීවය සහ සාරය රඳා පවතින්නේ ගිං ගඟේ වතුර හසුරු වන ආකාරය අනුවය කියා මා ප්‍රකාශ කරන්න කැමතියි. ගිං ගඟේ වතුර හසුරු වන සාර්ථක ක්‍රමයක් ඇති කළහොත් අපේ ජාතියේ අනාගතය උදෙසා විශාල මෙහෙයක් කරන්න පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. දැනට සාර්ථක පිය වරක් ගෙන නැති නිසා ජීවිත විශාල ගණ නක් විනාශ වී තිබෙනවා. ඒ බව අපේ පරම්පරාවේදීම අපේ ඇස්වලින්ම දැක තිබෙනවා. අප නොදුටු ලක්ෂ ගණන් ජීවිත විනාශ වී යන්නට ඇති. අල, බතල යනාදි නොයෙක් ආහාර ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් විනාශ වී යන්නට ඇති. නොයෙක් වැවිලි වර්ග විනාශ වී ගොස් තිබෙනවා. අපට කවදාවත්ම සොයා ගන් නට බැරි වන ආකාරයට අපේ රටේ සාර වත් පස සෝදාගෙන මුහුදට ගොස් තිබෙ නවා. මේ සියල්ලක්ම සිදු වුණේ මේ සම් බන්ධයෙන් නිසි වැඩ පිළිවෙළක් නොති බුණු නිසයි. ඒ නිසා ගරු ඇමතිතුමාට මේ අවස්ථාවේ එක් කාරණයක් කියන්නට කැමතියි. මේ යෝජනා ක්‍රමය අතපසු වෙන්ට වෙන්ටම මහ මුහුදට අපේ රටේ ජීවයෙන් කොටසක් සෝදාගෙන යනවා. ඒ නිසා හැකි තාක් ඉක්මණින් වැඩ කළ යුතුව තිබෙනවා.

ගිංගඟ ප්‍රදේශය හා සම්බන්ධ වැඩ කට යුතු පිළිබඳව මහන්සියක් ගන්නා බව පෙනී යන නිසා ඒ සම්බන්ධයෙන් හිනිදුම ගරු මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා. එතුමා පසුගිය රාජාසන කථාව පිළිබඳ ස්තුති යෝජනාව කරන අවස්ථාවේ දීත් මේ ගැන විශාල උද්වේගයකින් ඉල් ලීමක් කළා මට මතකයි. ඒ වෙනුවෙන් මේ විධියට කටයුතු කරගෙන යනවාය කියන නමුත් දැන් කරගෙන යන ආකාර යට වැඩ කටයුතු කරගෙන ගියොත් නම් තවත් පරම්පරා ගණනකටවත් මේ වැඩේ ඉෂ්ට කරන්නට පුළුවන්කමක් ලැබෙන්නේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

නැහැ. 1968-69 ආදායම් වර්ෂයේදී ඉවර කරන්නැයි ඉල්ලා සිටියා. එහෙත් තවමත් තත්ත්වය සතුටුදායක අතට හැරී ඇතැයි කියන්නට පුළුවන්කමක් තිබෙන වාද ? ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නට කැමතියි: ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ තව තවත් ගාලු දිස්ත්‍රික්කයට හානි සිදු වන්නට ඉඩ තබන්නේ නැතිව මේ ඉතාමත් වැදගත් ව්‍යාපාරය මේ මුදල් වර්ෂය තුළදීම අවසන් කරන්නට අවශ්‍ය තරම් ධෛර්‍ය්‍ය දෙනවා නම් එයින් තමුන්නාන්සේගෙන් යුක්තියක් ඉටු වන අතර ලක්ෂ සංඛ්‍යාත ජන කායකට සාධාරණයකුත් ඉටු කළා වෙනවා.

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)

Before the Hon. Minister speaks I would like to make a few comments.—[*Interruption*]. I want to know what the scheme is.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තවම මගේ කථාව ඉවර කෙළේ නැහැ. මට තාවත් වචන ස්වල්පයක් කථා කරන්නට තිබෙනවා. මම ඉක්මනින් මගේ කථාව ඉවර කරන්නම්. ගරු ඇමතිතුමාගෙන් නම් යුක්තියක් බලාපොරොත්තු වන්නට එපායයි කැලණියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. එස්. පෙරේරා මයා.) කියනවා. ඒ කෙසේ වෙතත්, අපේ ගරු ඇමතිතුමා එතුමාට පුළුවන් තරමකින් යුක්තිය ඉටු කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. මීට පෙර නොයෙක් වතාවල ගරු ඇමතිතුමාගෙන් බැගැපත්ව ඉල්ලා සිටියා. බැණලාත් ඉල්ලා සිටියා. ඒවාට ඒ අවස්ථාවල ඇහුම්කන් නුදුන්නත් ඉදිරි අනාගතයේ දී එසේ කරන්නේ නැතිව හැකිතාක් ඉක්මනින් මේ කටයුත්ත ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

මගේ කථාව අවසන් කරන්නට මත්තෙන් තවත් එක් කාරණයක් පමණක් කියන්නට ඕනෑ. තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉතාමත් දක්ෂ, හොඳ දැනුමක් තේරුමක් තිබෙන උදවිය බවට සැකයක් නැහැ. ඒ අය අතර ඉතාමත් දක්ෂ, ඉතාමත් හොඳ වාරිමාර්ග ඉංජිනේරු මහතුන් ඉන්නවා. බලවත් උනන්දුවකින් වැඩ කරන අයත් වෙන්නට පුළුවනි, ඒ අය. එහෙත් මට පෙනී ගොස් තිබෙන කරුණු අනුවයි මෙය කියන්නේ. මා පසුගිය දිනක ගමට ගිය අවස්ථාවක අගලිය වේල්ල ගැන ගම්බද මිනිසුන් සමග සාකච්ඡා කළා. ඒ උදවිය එකතු වෙලා මා සමග කියා සිටියේ කුමක්ද? මේ වේල්ල දමන එක හොඳයි; ඒක හරි. ඒ වුණාට මෙය අගල් නවයක් උස් වුණා නම්, එහෙමත් බැරි නම් අඩු ගණනේ අගල් හයක්වත් උස් වුණා නම් මීට වඩා සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වෙනවා යනුවෙන් ඒ අය කිව්වා. ගංවතුර ගැලීම එතකොට නවතීවියි ඒ අය කිව්වා. එය සැබෑ බව ඉංජිනේරු මහත්වරු පිළිගන්නවා. ඒ නිසා මේ කටයුතු පටන් ගන්න අවස්ථාවක ඒ ගැන ගම්බද මිනිසුන් සමග සාකච්ඡා කරනවා නම් ඔවුන්ගේ අත්දැකීම් වලින් ප්‍රයෝජන ලබා ගන්නට පුළුවන් වෙනවා. එතකොට ඒ කටයුත්ත වඩාත් හොඳින් සාර්ථක ප්‍රතිඵල ලැබෙන අන්දමට කරන්නට පුළුවන් වෙනවා. දෙපැත්තෙන් වේලි බැඳ මේ කටයුත්ත කරන්නට හිතුවත්, වේගයෙන් වතුර නොගලන ගඟකට නම් එය හරි යන්නට පුළුවනි. එහෙත් ගිංගඟ වැනි ගඟක නම් දෙපසින් වේලි බැඳ වැඩ කිරීම අතිසාරයට අමුඩ ගහන්නට උත්සාහ කිරීමක් වැනියි. ඒ නිසා නිසි වැඩ පිළිවෙළක් අනුව වැඩ කර, මේ අවුරුද්ද අවසන් වන්නට පෙර මෙය අවසන් කරන මෙන් ඉල්ලනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Hon. Minister.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

Let the Hon. Minister tell us what the scheme is.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 2.40

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉදිරිපත් වුණේ මේ යෝජනාව පිළිබඳ විවාදය අවසන් කරන්නට නොවෙයි. ගිනිදුම ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව මම භාර ගන්නවා. එහෙත් මේ වැඩේ කෙරෙන්නේ මගේ හිතේ හැටියට නොවෙයි. ඒ වාගේම ගරු මන්ත්‍රීවරයකුගේ අදහසේ හැටියටත් නොවෙයි. මෙය විශාල ව්‍යාපාරයක්. ඉංජිනේරු මහත්වරුන්ගේ, විශේෂඥයන්ගේ, අදහස් අනුවයි මෙය කෙරෙන්නේ. හුඟක් ඉස්සර, ඩී. එස්. සේනානායක අගමැතිතුමා කෘෂිකර්ම සහ ඉඩම් ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදී මේ ව්‍යාපාරය පටන් ගත්තා. වේලි කීපයක් බැන්ද නමුත් ඒවායින් බලාපොරොත්තු වුණු තරම් ප්‍රයෝජනයක් නොලැබුණු නිසා ඒ කාලයේදී ඒ වැඩ පිළිවෙළ නතර වුණා. ඊට පසුත් නොයෙක් විධියේ යෝජනා පිළිබඳව පරීක්ෂණ පවත්වා තිබෙනවා. 1957 දී 1958 දී පමණ ඉඩම් ඇමති අංශයේ ඉංජිනේරු මහත්වරුන්, වැව් දෙකක් බැඳ ගංවතුර නතර කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ සඳහා ස්ථිර සැලැස්මක් පිළියෙළ කිරීමට විදේශික විශේෂඥයන් ගෙන්වා ගන්නට සිදු වුණා. එහෙත් ඒ සඳහා විදේශ විනිමය තිබුණේ නැහැ. දැන් නැවත වරක් මේ ආණ්ඩුව නිරිත දිග ප්‍රදේශය සංවර්ධනය කිරීමේ යෝජනාවක් කර තිබෙනවා. වැඩි වශයෙන් වැස්ස ඇති වී ගංවතුර හානි සිදු වන්නේ, ගිං, කළු, වලවේ, නිල්වලා, බෙන්තර, යන මේ ගංගා පිහිටි ප්‍රදේශ වලටයි. ඒ නිසා එම ගංගා සම්බන්ධව සැලැස්මක් හැදීම සඳහා ටෙන්ඩර් කැඳවා එය ඊ. සී. අයි. නමැති ඇමෙරිකානු කොම්පනියකට බාර දී තිබෙනවා.

ගිං ගඟ සම්බන්ධව මේ අවස්ථාවේදී මා වචනයක් කියන්නට කැමතියි. ගං වතුර ගැලීමෙන් සිදු වන හානිය අතින් ගිං ගඟ වැටෙන්නේ 4 වන තැනටයි. ඒ අතින් පළමුවන තැන ගන්නේ කළු ගඟයි; දෙවැන්න කැලණි ගඟ; තුන්වැන්න මහ වැලි ගඟ; හතරවන තැන ගන්නේ ගිං ගඟ; 5 වළවේ; 6 නිල්වලා. වාරිමාර්ග ඉන්ජිනේරු මහත්වරුන් කියන්නේ වැවක් බැඳ ගඟේ මෝය හැරීම පුළුවන් යන්ත්‍ර මාර්ගයෙන් දැනුත් එය කෙරෙනවා. අතික groyne ක්‍රමයයි. මේ පිළිබඳ සැලැස්මවල් තවම ලැබී නැහැ. දෙසැම්බර් මාසයේදී පමණ එය ලබේයයි බලාපොරොත්තු වෙනවා. එතෙක් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවාද යන වග මට කියන්නට බැහැ. මා ඉංජිනේරුවකු නොවෙයි. ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේදී ඇළ වේලි පවා බැන්ද නමුත් වැඩ කෙරුණේ බාගයයි. දැන් නැවතත් මෙය පරීක්ෂා කොට සැලසුම් හා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම සඳහා විශේෂඥයන් යොදවා තිබෙනවා. තවම ඒවා ලැබුණේ නැහැ. ලැබුණු වහාම මා ඒවා ඇමති මණ්ඩලයට ඉදිරිපත් කරනවා. මේ සැලැසුම් සකස් කිරීම සඳහා 1967-68 අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කර තිබෙන බව මා කියන්නට කැමතියි. ඒ සැලසුම් හා ඇස්තමේන්තු ලැබුණු වහාම මා ඒවා ක්‍රම සම්පාදක අමාත්‍යාංශයටත් ඇමති මණ්ඩලයටත් ඉදිරිපත් කරනවා. ඇස්තමේන්තුව කීයක් වේදැයි දැන්මම කියන්නට මට බැහැ. මට පමණක් නොව මේ අමති පදවියට එන කාටවත් එය කල් තියා කියන්නට බැහැ. මෙය පාළමක් බෝක්කුවක් හදන්නා වාගේ සුළු වැඩක් නොවෙයි. [බාධාකිරීම්] කොතැනින් බැම්මක් බඳියිද, කොතැන වැවක් බඳියිද යන වග මට කියන්නට පුළුවන්කමක් නැහැ. [බාධාකිරීම්] සැලසුම් හා ඇස්තමේන්තු ලැබුණු විට ඒවා ඇමති මණ්ඩලයට ඉදිරිපත් කොට අනුමැතිය ලබාගෙන, මුදල සොයා ගෙන වැඩ පටන් ගත යුතු බව පමණක් මට කියන්නට පුළුවනි. සමහර විට මේ සඳහා කෝටි ගණනක් වියදම් වන්නට පුළුවනි.

අ. භා. 2.47

**නීල් ද අල්විස් මයා.**

*(திரு. நீல் டி அல்விஸ்)*

(Mr. Neal de Alwis)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම ගිං ගඟ යෝජනා ක්‍රමය පටන් ගත්තේ අවුරුදු 20 කට පමණ පෙර ඩී. එස්. සේනානායක මහතාගේ කාලයේයි. ඒ යෝජනා ක්‍රමය පටන් ගන්නා අවස්ථාවේදී පැවැත් වුණු උත්සවයට මාත් සහභාගි වුණා. ඒ දා සකස් කරන ලද සැලැස්ම අනුව මෝය කට ළඟ බැම්මක් බැඳිය යුතුව තිබුණු බව මට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නීල් ද අල්විස් මයා.]

මතකයි. එහෙත් මේ තරම් අවුරුදු ගණනක් ගත වී ඇතත් තවමත් ඒ මෝය කට ළඟ බැම්ම බන්දලා නැහැ. මේක අප කවුරුත් බලාපොරොත්තු වුණු දෙයක්. එහෙත් තවම මේක කෙරුණේ නැහැ.

ගිං ගඟේ පටු තැන් තියෙනවා.

Sir, you allowed the Hon. Minister to speak. Now he is not even listening to us. What is the use of the Debate?

ගරු ඇමතිතුමා නො දන්නා කරුණු ඉදිරිපත් කොට ගිං ගඟ යෝජනා ක්‍රමය සාර්ථක කර ගන්නටයි, අප උත්සාහ කරන්නේ. එහෙත් එතුමා කලින්ම තම කථාව කර, අප කථා කරන කොට පැනල දුවනවා. ඉතින් ඔය විධියට වැඩ කෙරෙන්නේ කොහොමද? යෝජනාව අනුමත කර කථා කළත් ඒවා නිකම් බොරු කථා බව අපට පිළිගන්නට සිදු වන්නේ මේ නිසයි. හිනිදුම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි මයා.) මේ යෝජනාව ඉදිරිපත් කරන්නට පෙර මෑත් උඩුගම මන්ත්‍රීවරයා වශයෙන් සිටියදී මේ ගැන යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. හිනිදුම, බෙන්තර-ඇල්පිටිය, බද්දේගම, රත්ගම යන කොට්ඨාශවල ගංවතුර උවදුරු සම්බන්ධයෙන් අවුරුදු පතා අයවැය ලේඛනයෙන් රුපියල් ලක්ෂ ගණනක් වියදම් වෙනවා. ගිං ගඟ ගලනවා. ගං වතුර විපත් සඳහා වන්දි ගෙවනවා. එහෙත් මේ ඇමතිවරයා දැන් අවුරුදු දොළහක් තිස්සේම මේ ගැන කිසිත් නො කර නිකම් සිටිනවා. කථා කළා මිස කිසි වැඩක් කෙළේ නැත.

ඩී. එස්. සේනානායක ඇමතිතුමා මේ යෝජනා ක්‍රමය පටන් ගත් කාලයේ විශේෂයෙන් කීවේ මෝය කට ළඟ බැම්මක් බඳින්නට වුවමනා බවයි. එදා සකස් කළ සැලැස්ම අනුව ඒ බව පේනවා. ඒ වාගේම ගිං ගඟේ පටු තැන් පළල් කළ යුතු බවත් කියා තිබෙනවා. එහෙත් ඒ වැඩ කෙළේ නැහැ. අවුරුදු ගණනාවක් ගත වුණා. මන්ත්‍රීවරුන් වරින් වර මේ පිළිබඳ යෝජනා ඉදිරිපත් කළා. එහෙත් වැඩක් වුණේ නැහැ. හිනිදුම හිටපු මන්ත්‍රී දිසානායක මහතාත් මේ ගැන ගරු ඇමතිතුමාට යෝජනා ඉදිරිපත් කළා. ඒ කරුණු ඉදිරිපත් කරන අවස්ථාවේදී ගරු ඇමතිතුමා නොයෙක් නොයෙක් පොරොන්දු දුන්නා. පොරොන්දු දෙනවා මිසයි. ඒ අනුව වැඩ කරන්නේ නැහැ. හිනිදුම ගරු මන්ත්‍රීතුමා අවුරුදු දෙකකට පමණ පෙර දීත් මේ ගැන සඳහන් කළ විට මාදුගඟට නැත්නම් තවලම එහෙමත් නැත්නම් හබරකඩ බැම්මක් බැඳ විදුලි බලයත් ලබා ගත හැකි වන වැඩ පිළිවෙළක් සකස් කිරීමට යෝජනා කළා. එහෙත් ගරු ඇමතිතුමා අද කියන්නේ මොනවා ද? හැතැප්ම පහළොවක් පමණ දුරින් ගඟ දෙපැත්තේ බිත්ති බඳින්නට ඕනෑලු. මේක සිනා යන කථාවක්. ගඟ දෙපැත්තේ බිත්ති බැඳීම ගැන මීට කලින් කවුරුන්වත් අහලා තිබෙනවා ද? මීට කලිනුත් එක බැම්මක් නම් බැන්දෙව්වා. ඒකට හුඟක් වියදම් කළා. එහෙත් ඒ බැම්ම බන්දවා මාස කීපයක් යන්නට පෙර එය මහ මුහුදට ගසාගෙන ගියා. ගිං ගඟ උතුරා ගංවතුර ගැලීම ඇත්තෙන්ම ගාලු දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් තුන් හතර දෙනකුට ලොකු ප්‍රශ්නයක් වී තිබෙනවා. ඇමතිතුමා විශේෂඥයකු නොවන බව අද කීවා. එහෙත් එතුමා සමග යමක් සාකච්ඡා කරන්නට ගිය විට එතුමා මේ රටේ සිටින ලොකුම විශේෂඥයා බව පෙන්වමින් තමයි, එතුමා කථා කරන්නේ. තමා විශේෂඥයකු නොවේ යයි ඇමතිතුමා මේ ගරු සභාවේදී කීවා. ඒ වාගේම, විශේෂඥයන් හන්දියක් ගන්දියක් ගාණේ නැති බවත් ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. විශේෂඥයන් තෝරා ගැනීම බොහොම අමාරුයි. හොඳ විශේෂඥයන් ලවා නියම සැලැස්මවල් සම්පාදනය කරවා ගෙන, නියම වැඩ පිළිවෙළක් යටතේ වැඩ කරනවා නම් පමණයි, මෙවැනි යෝජනා ක්‍රම සාර්ථක කර ගන්නට පුළුවන්කම ලැබෙන්නේ. එහෙම නැත්නම් මේ ආණ්ඩුව හෝ වේවා වෙනත් ආණ්ඩු හෝ වේවා මෙවැනි කටයුතු සඳහා වියදම් කරන මුදල් අපතේ යනවා.

මේ තරම් වැදගත් යෝජනාවක් සාකච්ඡා කරන අවස්ථාවේදී මේ ගරු සභාවේ නොසිට ඇමතිතුමා පිට වී ගියේ, එතුමා තුළ අවංකකමක් නැති නිසයි. එතුමා බොරු කරනවා. මෙය විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකුගේ නොව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකුගේ යෝජනාවක්. කල්පනා කර බලන විට, ඇත්ත වශයෙන් මේ යෝජනාව මේසේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට ඕනෑ කරන්නේත් නැහැ. සමහර විට ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම වෙත එතුමා මේ යෝජනාව ඉදිරිපත් කරන්නට ඇති. එහෙත් එහිදී එය සම්මත කර ගන්නට නොලැබුණු නිසා මේ ගරු සභාවට පෞද්ගලික යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන්නට ඇති. මෙවැනි ප්‍රශ්න මතු කරන්නට වුවමනා නිසයි, ඇමතිතුමා කථා කරන්නට කලින් මේ පිළිබඳව කථා කිරීමට මට අවස්ථාවක් දෙන්නැයි මා නියෝජ්‍ය කථානායකතුමා ගෙන් ඉල්ලා සිටියේ. යෝජනාව භාර ගන්නා බව කීවාට මදි. සැලැස්ම මොකක් ද, විශේෂඥයා කවුද, කොපමණ මුදල් වියදම් වෙනවා ද, යෝජනා ක්‍රමය අවසාන වන්නේ කවරදාද යනාදියත් අප දැන ගන්නට ඕනෑ. අපි බබ්බු නොවෙයි. මෙතෙක් සෙල්ලම් කළා වාගේ ඇමතිතුමාට තමාගේ ගමේවත් ඉදිරියට කරන්නට බැරි බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 2.55

**ඩී. ඊ. තිලකරත්න මයා.** (රත්ගම)

*(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)*

(Mr. D. E. Tillekeratne—Ratgama)

නියෝජ්‍ය කථානායකතුමනි, පළමු කොටම මා කැමතියි, බද්දේගම ගරු මන්ත්‍රීතුමාගේ අන්තිම කියමනට පිළිතුරු දෙන්න. ඉඩම් ඇමතිතුමාට දැන් ගමේවත් සෙල්ලම් කරන්නට බැරි යයි එතුමා කීවා. අපත් ඒ ගමේම ඉපදුණු අය නිසා, ඒ ගමේ ඕනෑ තරම් සෙල්ලම් කරන්නට එතුමාට ඉඩකඩ තිබෙන බව ප්‍රකාශ කරන්න කැමතියි.

ගිං ගඟ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් බද්දේගම ගරු මන්ත්‍රීතුමාට, හිනිදුම ගරු මන්ත්‍රීතුමාට හා බෙන්තර-ඇල්පිටිය ගරු මන්ත්‍රීතුමාට මෙන්ම මටත් කථා කිරීමට අයිතියක් තිබෙනවා. ගංවතුර සහනාධාර වශයෙන් මගේ ඡන්දදායක කොට්ඨාශයේ උදවියටත් විශාල වශයෙන් ආධාර කරන්නට ආණ්ඩුවට සිදු වී තිබෙනවා. ගිං ගඟ යෝජනා ක්‍රමයට පළමු වෙන්ම මුදල් සම්මත වුණු අවස්ථාවේදී හිටපු හිනිදුම මන්ත්‍රී හෙන්රි දිසානායක මහතා එය ක්‍රියාත්මක වීම පමා කළා පමණක් නොව, ඇත්ත වශයෙන් නැවැත්වීමට කටයුතු කළා. ඒ මහතා එසේ කටයුතු නොකළා නම් අද ඒ යෝජනා ක්‍රමය හුඟාක් දුරට ක්‍රියාත්මක වී අවසානයි. මේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ යුතු බවට ගාල්ලේ දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභා රැස්වීමේදී අද ඒකමතිකව තීරණය කළා. මේ යෝජනාව ඉක්මණින් ක්‍රියාත්මක කරන බවට ගරු ඇමතිතුමා පොරොන්දු වීම ගැන අප එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ සමගම අපට පෙනී යන කාරණයක් තමයි, මේ රජය යටතේ ඉතා උනන්දු වෙන් මෙවැනි ව්‍යාපාර කෙරීගෙන යන බව. බද්දේගම ගරු මන්ත්‍රීතුමා කීවා වාගේ තාප්ප නොව අවශ්‍ය තැන්වල බැමි බදින බව අප දන්නවා. හැතැප්ම 70 ක් දිගට බැමි නැත්නම් තාප්ප බදින්න බැරි බව අප දන්නවා. හැතැප්ම 70 ක් දිගට තාප්ප බදිනවා යයි යමකු කියනවා නම්, ඇත්ත වශයෙන්ම මෝඩයකු බව පෙනෙන්නේ එසේ කියන නැනැත්තා මිස ඇමතිතුමා නොවෙයි. ඇමතිතුමා විශේෂඥයෙක් නොවෙයි. එතුමා තවමත් ක්‍රියාත්මක කරගෙන යන්නේ මේ ආණ්ඩුවේ සැලැස්මවල් නොව පසුගිය ආණ්ඩුවේ සැලැස්මවලුයි. එහෙම නම් දොස් කිව යුත්තේ මේ රජයට නොව ඒ සැලැස්මවල් සම්පාදනය කළ පසුගිය රජයටයි. ඒ නිසා කාටවත් බැණ වැදීම නොවෙයි අප විසින් කළ යුත්තෙ. අපේ හපන්කම නම් මේ අඩු පාඩුකම් ගැන ඇමතිතුමාට කියා, එතුමාට බැරි නම් රජයට හෝ කියා, නියම විධියේ සැලැස්මක් සකස් කරවා ගෙන කටයුතු කිරීමයි. හිනිදුම මන්ත්‍රීතුමා විසින් මෙවැනි යෝජනාවක් ගෙන ඒම ගැන, මා සතුටු වෙනවා. මා නැගී සිටියේ එතුමාගේ යෝජනාව ස්ථිර කිරීමටයි. නමුත් විරුද්ධ පාර්ශවයේ මන්ත්‍රීවරයෙකු විසින් එම යෝජනාව ස්ථිර කර තිබීම ගැන මා ඉතාමත්ම සතුටු වෙනවා. මෙම යෝජනාව අනුව කටයුතු කිරීමට අපේ සම්පූර්ණ සහයෝගය රජයට දීමට සතුටු බව ප්‍රකාශ කරන්න ඕනෑ. මේ කටයුතු



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. ජී. තිලකරත්න මයා.]

ඉක්මනින්ම ක්‍රියාත්මක කළොත් අප විසින් දැනට කර ගෙන යන වගා ව්‍යාපාරය මීට වඩා දියුණු වෙනවාට කිසිම සැකයක් නැති බවත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 2.58

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව කරන්නට ප්‍රථමයෙන් රත්ගම මන්ත්‍රීතුමාට වචනයක් කිව යුතුව තිබෙනවා. එතුමා විසින් කියන්න යෙදුණා, හිටපු මන්ත්‍රීවරයෙකු වන හෙන්රි දිසානායක මහතාගේ විරුද්ධ වීම නිසා මේ ගිං ගඟ යෝජනා ක්‍රමය අතරමඟ නැවතුනාය කියා. මා කියන්න කැමතියි, මේ ඇමතිවරුන් කටයුතු කරන්නේ මන්ත්‍රීවරුන්ගේ අදහස්වලට අනුව නොව ඒ සම්බන්ධ විශේෂඥයින්ගේ අදහස්වලට අනුවය කියා. මෙතන සිදුවී තිබෙන්නේ මෙයයි. ගරු ඇමතිතුමා විශේෂඥ උපදෙස් පිළිපැදීමට කැමති කෙනෙක් නොවෙයි. බද්දේගම මන්ත්‍රීතුමා විසින් කියන්න යෙදුණා, ගරු ඇමතිතුමා විශේෂඥ උපදෙස්වලට වඩා තමන්ගේම අදහස් හොඳය කියා සලකනවාය කියා. එතුමා කටයුතු කරන්නේ ලොකුම විශේෂඥයා තමාය කියන අදහස ඇතිවයි. ඔන්න ඔය හේතුව නිසා—නොදන්න දේවල් කරන්න යාම නිසා; නොදන්න දෙයට කට දමන්න යාම නිසා—මේ රටේ ඉතාම වැදගැත් ව්‍යාපාරයක් වන ගංගා සංවර්ධන ව්‍යාපාරය අද අතරමඟ නතර වී තිබෙනවා. රටේ ඉතාමත් වැදගත් ධනය වන ජලය අහිංසක ලෙස මුහුදට ගලා යාමට ඉඩ දී තිබෙනවා. ආණ්ඩු ගණනාවකම වාරිමාර්ග ඇමතිවරයා වශයෙන් කටයුතු කළේ මේ ඇමතිතුමායි. අවුරුදු ගණනාවක්ම මේ රටේ ගංගා සංවර්ධන ව්‍යාපාරය භාරව සිටියේ එකම ඇමතිතුමායි. අදත් එය භාරව සිටින්නේ ඒ ඇමතිතුමාමයි. එය තමයි මේ රටේ අද තිබෙන ලොකුම අවාසනාව කියා මෙහිදී මා ප්‍රකාශ කරන්න ඕනෑ. මේ ඇමතිවරයා විසින් ගෙන යන වැඩපිළිවෙළ නිසා තමයි අද කෘෂිකර්ම සංවර්ධනය දියුණු කරන්න බැරි වී තිබෙන්නෙ. කෘෂිකර්ම සංවර්ධනය භාරව සිටින්නේත් එතුමායි. එය තමයි රටේ තිබෙන වැදගත්ම ව්‍යාපාරය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මුළු රටම මේ ඇමතිතුමාට භාරව තිබෙනවය කිව්වත් වරදක් නැහැ. ගංගාවල්, ඉඩම්, විදුලිය, වනාන්තර ආදී හැම දෙයක්ම එතුමා භාරයේයි තිබෙන්නෙ. අපේ රටේ තිබෙන ජාතික සම්පත ඒ ඇමතිතුමා යටතේයි පවතින්නේ. ඒ වගේම පාරවල් තිබෙන්නේත් ඒ ඇමතිතුමා යටතේයි. මේ හැම දෙයක්ම භාරව සිටින්නේ ඉඩම් ඇමතිවරයායි. එහෙත්, අපේ මේ ජාතික සම්පත් ජාතියේ යහපතට යෙදවීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීමට ඉඩම් ඇමතිවරයාට තවමත් බැරි වුණා. ආණ්ඩු ගණනාවකම ඉඩම් ඇමතිවරයා වශයෙන් කටයුතු කර ගෙන ගියත් එවැනි දෙයක් කරන්න තවමත් බැරි වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද හිනිදුම මන්ත්‍රීතුමා විසින් මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එය මහ මෝඩ යෝජනාවක්. මෝඩ යෝජනාවක්ය කියා මා කියන්නේ මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් කිසිම ප්‍රයෝජනයක් නැති නිසයි.

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

ඔය පැත්තේ කෙනෙක් ස්ථිර කළේ.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

එය ඇත්තයි. නමුත් මා එසේ කියන්නේ මෙවැනි යෝජනාවල් මේ ආණ්ඩුව විසින් කවදාවත්ම ක්‍රියාත්මක නොකරන නිසයි. තමුන්නාන්සේ දන්නවා ඇති මා විසින් මේ ගරු සභාවට යෝජනා රාශියක්ම ඉදිරිපත් කර තිබෙන බව. ඒ අවස්ථාවල දී ආණ්ඩු පක්ෂය නිශ්ශබ්දව සිටිනවා; විරුද්ධත්වයක් දක්වන්නේ නැහැ. ආණ්ඩුව ඒවා පිළිගන්නවා. නමුත් ඒ එකක්වත් මේ ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කර නැහැ. ගරු මුදල් ඇමතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොයි විධියට කෑ ගැසුවත් මා මේ අවස්ථාවේදී අසන්න කැමතියි, මෙම ගරු සභාවේ දී සම්මත කරන ලද යෝජනා කීයක් ක්‍රියාත්මක කර තිබෙනවාද කියා. පුළුවන් නම් ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමට දිනයක් වෙන් කර තිබෙනවා. ඒ අයට නොයෙක් නොයෙක් විධියේ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී තිබෙනවා. මන්ත්‍රීවරුනුත් තමන්ගේ ප්‍රදේශවල තිබෙන යම් යම් අඩුපාඩුකම් පිළිබඳ යෝජනා ඉදිරිපත් කරනවා. නමුත් මේ ඇමති මණ්ඩලය එම යෝජනා ගැන අබමල් රේණුවක තරම්වත් සැලකිල්ලක් දක්වා තිබෙනවාද කියා මා අසන්න කැමතියි. මමත් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මෝඩ යෝජනා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඇමතිතුමා ඒවා මෝඩ යෝජනාවල් හැටියට පිළිගත්තත් රටේ ජනතාව සම්බන්ධයෙනුයි—ඒ ඒ ප්‍රදේශවල තිබෙන අඩුපාඩුකම් සම්බන්ධයෙනුයි — එම යෝජනා ඉදිරිපත් කර තිබෙන්නෙ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතර ගුරු අභ්‍යාස විද්‍යාලයක් පිහිටුවිය යුතුය කියා මා මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කළා. එය මෝඩ යෝජනාවක්ය කියා—

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මෝඩ මන්ත්‍රීවරයෙක්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තමුන්නාන්සේ හිතුවත් මම මෝඩ මන්ත්‍රීවරයෙක්ය කියා, මාතර ප්‍රදේශයට ගොස් ඇසුවොත් මමද මෝඩ, එහෙම නැත්නම් රාජ්‍ය ඇමතිතුමාද මෝඩ කියා, එහි ජනතාව උත්තර දේවි, රාජ්‍ය ඇමතිතුමා මෝඩයාය, මාතර මන්ත්‍රීතුමා නුවණක්කාරයාය කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෝඩ යෝජනාවල් කියා කිව්වත් අපි ඉදිරිපත් කරන්නේ ජනතාවගේ ඉල්ලීම් අනුව සකස් කරන ලද යෝජනායි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayawardene)
තමුන්නාන්සේම නේ කිව්වෙ මෝඩ යෝජනාවල්ය කියා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
යෝජනාව මෝඩයි කීවේ මේ ගරු සභාවට ඉදිරිපත් කර සම්මත කළත් එය ක්‍රියාත්මක කරන්නට බැරි නිසයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මා එම ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්නවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු රාජ්‍ය ඇමතිතුමාට මෝඩ ඇමති කියා කී එක මාත් ඉල්ලා අස් කර ගන්නවා. වර්තමාන ඇමති මණ්ඩලයේ සිටින නුවණක්කාරම ඇමති එතුමායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඉඩම් ඇමතිතුමා කිව්වා බඳිනවා, බඳිනවා, බඳිනවා; මේක බඳිනවා, අරක බඳිනවා කියා. එහෙත් මෙතරම් වයස යන තුරුත් එකක්වත් බැඳ ගන්න බැරි වුණා; එක වේල්ලක්වත් බැඳගන්නට බැරි වුණා. ගිංගඟ යෝජනා ක්‍රමය ගැන සඳහන් කර ගරු වාරිමාර්ග ඇමතිතුමා කිව්වා බඳිනවාය කියා. ඒ සමගම තවත් ගංගා දෙකක් ගැනත් සඳහන් කළා.

මේ යෝජනාවට මගේ අනුකූලතාවය දක්වන අතරම ගිංගඟ පමණක් නොවෙයි ලංකාවේ තිබෙන හැම ගංගාවක්ම නියම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

විධියට සංවර්ධනයට යොදා නොගන්නේ ඇයි කියා මා අහනවා. ලංකාවේ පමණක් නොවෙයි ලෝකයේ හැම රටකම තිබෙන ප්‍රධාන ධනය ජලයයි. මනුෂ්‍යයන් ජීවත් වන්නේ ජලය නිසයි. මනුෂ්‍යයාට ජලය අවශ්‍යයි. මනුෂ්‍යයාගේ ගොවිතැනට හා ජීවත් වීමට අවශ්‍ය ජලය නියම අන්දමට ප්‍රයෝජනයට නොගන්නා එකයි අපට තිබෙන ප්‍රශ්නය. ගිංගඟ මෙන්ම මගේ ඡන්ද කොට්ඨාශයට බලපාන නිල්වලාගඟ යෝජනා ක්‍රමයත් මෙයට සම්බන්ධයි කියා ගරු ඇමතිතුමා කීවා. ඒ ගැනත් අපි කාලයක් තිස්සේ කෑගහනවා. විශේෂයෙන්ම අපේ පක්ෂයේ සභාපති අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) මේ ප්‍රශ්නය ගැන මේ ගරු සභාව ඇතුළතත් පිටතත් විශේෂ වශයෙන් කරුණු ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිල්වලාගඟ සංවර්ධනය කිරීම ගැන මාතර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව විශේෂ බලාපොරොත්තුවකින් සිටිනවා. එහෙත් ගරු ඇමතිතුමා හැමදාමත් කියන්නේ කරනවා කරනවා කියන එකයි. හැමදාමත් කියනවා. එහෙත් තවම කිසිවක් කර නැහැ. නොකරන්නේ ඇයි කියා මා දන්නේ නැහැ. මගේ දුක්ගැනවිල්ල මෙයයි: මේ වැදගත් අමාත්‍යාංශය, එනම් රටේ මුළු මහත් ජීවිතයට බලපාන රටේ විශේෂ සම්පත්වල භාරකාරත්වය, එක ඇමතිවරයකුටම දීලා ගෙනයන වැඩ පිළිවෙළ නවත්වන්නේ නැත්නම් මේ රට දියුණු කරන්නට බැහැ. ජල සම්පත්, වන සම්පත්, ඇළ සම්පත් ආදී හැම සම්පතක්ම බාරදී තිබෙන්නේ ඉඩම් ඇමතිතුමාටයි. මේ සම්පත් අනික් ඇමතිවරුන්ටත් බෙදා දෙන්නට බැරි ඇයි? එසේ කළොත් මේ රටේ සංවර්ධනය ඉක්මණින් කරන්නට පුළුවන් වේවි. මේ සම්පත් හැම එකක්ම එක ඇමතිවරයකුට දී තිබෙන්නේ මේ රටේ සංවර්ධනය නවත්වා එය හිර කරන්නටයි. සංවර්ධනය හිර කරන්නට පුළුවන් කෙනෙකුටයි ඒවා බාර දී තිබෙන්නේ. අධිරාජ්‍යවාදීන්ගේ අදහස් උදහස් අකුරටම පිළිපදින, ඒ අනුව ක්‍රියා කරන, ඇමතිවරයකුට මෙවැනි වැදගත් යෝජනා ක්‍රම බාර දීමෙන් තමයි මේ තරම් අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ.

වරින්වර නිල්වලාගඟ ගලනවා. ඒ නිසා විශාල පිරිසකට මහ අමාරුවකට මුහුණ පාන්නට සිදු වෙනවා. අවුරුද්දකට වරක් දෙකක් නොවෙයි තුන් හතර වරක් ගලනවා. මොරවකට වැස්සොත් නිල්වලාගඟ ගලනවා. එක ගංවතුරක් ගැලූ විට සමාජ සේවා දෙපාර්තමේන්තුවට විශාල මුදලක් වියදම් කරන්නට සිදු වෙනවා. මෙවැනි තත්ත්වයක් දිගටම ගෙනයන්නට ඉඩ දෙන්නට පුළුවන්ද? රටේ මහජනතාව අමාරුවට වැටෙද්දී මේ ඉඩම් ඇමතිවරයා කරනවා කරනවා කියනවා. එහෙත් කිසිවක් කෙරෙන්නේ නැහැ. [බාධාකිරීමක්] ලැගගෙන සිටිනවා. කොහේ සිටිනවාද කියා දන්නේ නැහැ. මහජනතාවගේ ප්‍රශ්න සම්බන්ධයෙන් මේ ආණ්ඩුවේ ඇමතිවරයෙක් කරනවා යයි කියමින් නිදිමත විධියට වැඩ කරන එක ගැනයි අපි චෝදනා කරන්නේ. ගංවතුර නිසා සමාජ සේවා දෙපාර්තමේන්තුව විශාල වශයෙන් මුදල් වියදම් කරතත් මහජනතාව ගංවතුරින් බේරා ගන්නට මේ ඉඩම් ඇමතිවරයාට කිසිවක් කරන්නට තවමත් පුළුවන් වී නැහැ. අපි ඉඩමක් ගන්නය කිව්වම ඉඩම් අයිතිකාරයන්ට යට වෙලා ඒ ඉඩම ගැනීම නවත්වනවා. මේ ඇමතිවරයා කටයුතු කරන්නේ ඒ විධියටයි. ඕගේ ඉඩම ගන්නට ඉඩ දෙන්න එපාය කියා එක්සත් ජාතික පක්ෂයේ නායකයන් කිව්වම මේ ඇමතිවරයා ඒවට යටත් වෙලා නිකම් ඉන්නවා. ගංවතුරෙන් පීඩා විඳින දුප්පත් මහජනයාට සහනයක් සැලසීමට මේ ඇමතිවරයා ක්‍රියා කරන්නෙ නැහැ. ඒ නිසා ලොකු කැක්කුමකිනුයි, මා මේ කථා කරන්නේ. දුප්පත් මහජනයා වෙනුවෙන් සේවයක් කරන්නටයි, අප මේ පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙන්නේ. මේ ආණ්ඩුව ගෙන යන ධනවාදී ප්‍රතිපත්තිය නිසා මේ ආණ්ඩුව කරන ඥාති සංග්‍රහය නිසා අපට මේ පාර්ලිමේන්තුවෙන් කිසි දෙයක් කර ගන්නට බැහැ. අප මොන යෝජනාවක් ඉදිරිපත් කළත් එය ක්‍රියාත්මක කරන්නට මේ ඇමති මණ්ඩලය කටයුතු කරන්නෙ නැහැ. ඒ නිසා මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෝජනාව ගැන කථා කිරීම පවා කාලය නිකරුණේ ගත කිරීමක් බව කියන්නට ඕනෑ. මේ යෝජනාවට පක්ෂපාතව මගේ අදහස් ප්‍රකාශ කරන අතර ගිං ගඟ නිම්නය පමණක් නොව ලංකාවේ සෑම ගංගා නිම්නයක්ම සංවර්ධනය කිරීමට වැඩ පිළිවෙළක් ඇති කළ යුතු බව ප්‍රකාශ කරන්නට කැමතියි. එහෙත් ඒ කටයුත්ත කිරීමට මේ ආණ්ඩුවට නම් පුළුවන්කමක් නැහැ. 1970 න් පසු ඇති වන අපේ ආණ්ඩුවෙන් එය කරන බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි.

අ. භා. 3.8

**අමරසිරි මයා.**

*(திரு. அமரசிறி)*

(Mr. Amarasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් නිසා අවසාන වශයෙන් මා වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට සතුටුයි. මාතර ගරු මන්ත්‍රීතුමා බොහොම වේග ස්වරයෙන් කථා කරමින් ගරු ඉඩම් ඇමතිතුමාට චෝදනා කළා. සමහරුන්ට කන්නට වුවමනා වුනාම කබරගොයාත් තලගොයා කර ගන්නවාය, කන්නට වුවමනා නැති වුනාම තලගොයාත් කබරගොයා කර ගන්නවාය කියා කථාවක් තියෙනවා. ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමා අවුරුදු 10ක් ඒ පැත්තෙ ඇමතිවරයකු හැටියට කටයුතු කෙළේ නැද්ද කියා මා මාතර ගරු මන්ත්‍රීතුමාගෙන් (තුඩාවේ මයා.) අහන්නට කැමතියි. එතුමා මේ පැත්තට ආවයින් පස්සෙද මේ තත්ත්වය ඇති වුණේ ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මන්ත්‍රීවරුන් ගරු ඉඩම් ඇමතිතුමාට මේ පිළිවෙළට චෝදනා කිරීම වැරදියි. අවුරුදු 10ක් තිස්සේ ඒ ඇමතිතුමා විරුඬ පාර්ශ්වයේ අයත් සමග එකතුවෙලා කටයුතු කළා. පසුගිය අවුරුදු තුනේ දීයි එතුමා අප සමග එකතු වෙලා කටයුතු කෙළේ. ඒ කාලය තුළදී සෑහෙන ප්‍රතිඵල පෙන්වා තිබෙනවා. ඒ කාලයේදී එතුමා වැඩ කරන්නට අදක්ෂ වුණේ තමුන්නාන්සේලාගේ ඇමතිවරුන් එතුමාට නියම විධියට උපදෙස් නුදුන් නිසා, සහයෝගය නුදුන් නිසා වන්නට ඇති. දැන් එතුමා සෑම ඇමතිවරයකුගේම උපදේශය සහ සහයෝගය ලබාගෙන දක්ෂ ලෙස කටයුතු කරන බව මා කියන්නට කැමතියි.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

එහෙමනම් යෝජනාව ගෙනාවෙ මොකටද ?

**අමරසිරි මයා.**

*(திரு. அமரசிறி)*

(Mr. Amarasiri)

ඒක මම පැහැදිලි කරන්නම්. මෙම යෝජනාව නියම විධියට ගාලු දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවට ඉදිරිපත් කර ඊට පසුවයි, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙළේ. මෙය ජාතික සංවර්ධන යෝජනා ක්‍රමයක් නිසයි, මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කෙළේ. මෙය ගාලු දිස්ත්‍රික්කයට පමණක් නොව මුළු ලංකාවටම බලපාන ප්‍රශ්නයක්. ගංවතුර ප්‍රශ්නය ගාලු දිස්ත්‍රික්කයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මෙන්ම විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ටත් බලපාන ප්‍රශ්නයක්. ඒ පළාත්වල ගංවතුරෙන් වන හානිය ඉතා විශාලයි. ඒ නිසා මේ යෝජනාව ඉක්මනින්ම ක්‍රියාත්මක කරවා ගැනීමටයි, මේ ගරු සභාවට ඉදිරිපත් කෙළේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තියෙන කාලයේදී තමුන්නාන්සේලා පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉදිරිපත් කෙළේ නැද්ද ? එසේනම් මා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම වැරදිය කියන්නට පුළුවන්ද ? මා මේ යෝජනාව ඉදිරිපත් කෙළේ යම්කිසි ප්‍රසිද්ධියක් බලාගෙන නොවෙයි. අපට වුවමනා කරන්නේ මේ කටයුත්ත කෙසේ හෝ කරන්නටයි. මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කෙළේ නැත්නම් මේ පිළිබඳව තමුන්නාන්සේලාගේ අදහස් අප දැනගන්නේ කොහොමද ? මේ පිළිබඳව, බෙන්තර-ඇල්පිටියේ ගරු මන්ත්‍රීතුමා (කාරියවසම් මයා.) වැදගත් කරුණු ඉදිරිපත් කළා. මේ යෝජනාව ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමට ඉදිරිපත් කළා නම් ඒ අදහස් අපට දැනගන්නට ලැබෙන්නෙ නැහැ. මේ ප්‍රශ්නය ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට පමණක් නොව ගාලු දිස්ත්‍රික්කයේ සෑම මන්ත්‍රීවරයකුටම බලපාන ප්‍රශ්නයක් නිසයි, මේ යෝජනාව මෙසේ ඉදිරිපත් කෙළේ. බද්දේගම, බෙන්තර-ඇල්පිටිය, රත්ගම, අක්මීමන, ගාල්ල ආදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි මයා.]

ඡන්ද කොට්ඨාශවල මන්ත්‍රීතුමන්ලාගේත් සහයෝගය ඇතිව මේ කටයුත්ත කර ගන්නටයි; මා බලාපොරොත්තු වුණේ. බද්දේගම මන්ත්‍රීතුමාත් (නීල් ද අල්විස් මයා.) උඩුගම ආසනය නියෝජනය කරන කාලයේදී මේ අදහස ඉදිරිපත් කර තිබෙන බව ප්‍රකාශ වුණා. ඒ කාලයේ සිටම—1947 සිටම—දකුණු පළාතේ තිබෙන දැවෙන ප්‍රශ්නයක් තමයි, මේ ප්‍රශ්නය. පසුගිය අවුරුද්දේ ගංවතුර ගැලූ අවස්ථාවේදී බද්දේගම මන්ත්‍රීතුමාත් මාත් ගාලු දිසාපති කාර්යාලයේ, රෑ නිදි මරමින් අනාථ වූවන්ට සහනාධාර සැලසීමේ කටයුතුවල යෙදුණා. මගේ ආසනයේම පමණක් ගෙවල් එක් දහස් දෙසීයක් පමණ කැඩී ගියා. එසේ කැඩී ගිය සෑම ගෙයක්ම බලන්න මා ගියා. අවුරුදු පතා මේ අන්දමට අනාථ වන, දුක්ඛිත තත්ත්වයට පත් වන අසරණ ජනතාව බේරා ගැනීමේ පරම චේතනාවෙනුයි, යෝජනා ක්‍රමය වහාම ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලමින් මෙම යෝජනාව ඉදිරිපත් කළේ.

පසුගිය වර අයවැය ලේඛනය පිළිබඳ විවාදය පැවති අවස්ථාවේදීත්, රාජාසන කථා විවාදයේදීත් මේ කාරණා ගැන මා සඳහන් කළා. එම නිසා ඉතා ඉක්මනින් සෑහෙන ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඇත්ත වශයෙන්ම මෙබඳු කාර්යයක් ප්‍රමාද වුණා වැඩියි, එම නිසා මේ කාලය තුළදීම වැඩ කටයුතු ආරම්භ කළ යුතුය කියා ඉල්ලීමට මට සිදු වී තිබෙනවා. ගිංගඟ සංවර්ධන යෝජනා ක්‍රමය පමණක් නොවෙයි; ගිංගඟ, නිල්වලා ගඟ සහ කළුගඟ යන ගංගා තුනම ඒකාබද්ධ කර සංවර්ධන යෝජනා ක්‍රමයක් සකස් කිරීමේ ගිවිසුම කට ඇමෙරිකානු ඉංජිනේරු සමාගමක් සමග 1966 ඔක්තෝබර් මාසයේදී අත්සන් තබා තිබෙනවා. ඇමෙරිකන් එන්ජිනියරිං කොන්සල්ටන්ට්ස් කෝපරේෂන් නැමැති ඇමෙරිකානු සමාගමක් සමග අත්සන් තැබූ ගිවිසුම අනුව ඉංජිනේරු මහතුන් කීප දෙනෙකුම මෙරටට පැමිණ පරීක්ෂණ පවත්වා කටයුතු අවසන් කර තිබෙනවා. දැනට ඒ සම්බන්ධයෙන් මූලික වාර්තාවක්ද නිකුත් කර ඇති බව ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. සමහර විට ගරු ඇමතිතුමා එම වාර්තාව දැකලා [illegible] ඇති, නමුත් නොදුටු ලෙසක් කථාවෙන් පෙනී ගිය නිසයි එසේ මා සඳහන් කළේ. දැනට එම සැලැස්මේ කෙටි වාර්තාවක් නිකුත් කර තිබෙනවා. ඒ අනුව කලින් යෝජනා කළ අන්දමට හබරකඩ ගඟ හරහා බැම්මක් බැඳීම අනවශ්‍ය බවත්, ගඟ දෙපැත්තේ වැටි බැඳීම ප්‍රයෝජනවත් බවත් එම වාර්තාවෙන් පෙන්වා දී තිබෙනවා.

බද්දේගම මන්ත්‍රීතුමා අදහස් කර ඇති පරිදි සැතපුම් හැත්තෑ දෙකක ප්‍රමාණයේ බැම්මක් බැඳීම නොවෙයි එයින් අදහස් කර තිබෙන්නේ. සැතපුම් තිස් අටක ප්‍රමාණයේ කඩින් කඩ දෙපැත්තේ බැම් බැඳීමෙන්—පිටාර ගලන කොටස්වල පමණක් බැම් බැඳීමෙන්—වතුර පිටාරය ගැලීම වැළැක්වීමටයි යෝජනා කර තිබෙන්නේ. එපමණක් නොවෙයි, වැඩි වතුර ආපසු ගඟට පොම්ප කිරීමට පොම්ප කිරීමේ මධ්‍යස්ථාන 22 ක් තැනීම අවශ්‍ය බව වාර්තාවේ සඳහන් වී තිබෙනවා. එපමණක් නොවෙයි, අවුරුදු පතා ගංමෝය සුද්ධ කිරීමට රුපියල් අට ලක්ෂයක පමණ මුදලක් වැය කළ යුතු බවද සඳහන් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාක්‍රමය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම ඉතාමත්ම වැදගත්. ඒ නිසා මෙය ජාතික ප්‍රශ්නයක් විසඳාලීමේ පියවරක් හැටියට සලකා ක්‍රියාත්මක කිරීමට ඇමතිතුමා උනන්දුවක් දක්වන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මොන අන්දමේ අදහස් පළ කළත්, අපේ ගරු ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමා පසුගිය අවුරුදු දාහතරක පමණ කාලය තුළ මේ රටේ ජනතාවට විශාල සේවයක් කර ඇති බව කියන්න කැමතියි. සංවර්ධනය වන රටක, දියුණු වේගෙන එන රටක තිබෙන ප්‍රශ්න එක්වරටම විසඳන්න පුළුවන්ය, අවුරුදු දෙක තුනකදී, පහක දහයකදී විසඳන්න පුළුවන්ය කියා යම්කෙනෙකු කල්පනා කරනවා නම් එය වැරදියි. ඇත්ත වශයෙන්ම එබඳු කෙටි කාලයක් තුළදී ජාතියටම බලපාන වැදගත් ප්‍රශ්න නිරාකරණය කරන්න පුළුවන්කමක් නැහැ. ජාතියක් සංවර්ධනය කිරීමේ කාර්යය රැයක් එළිවෙන්න පෙර කරන්න පුළුවන් දෙයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොවෙයි. මහවැලි ගඟ යෝජනා ක්‍රමය, නිල්වලා ගඟ යෝජනා ක්‍රමය, කළු ගඟ යෝජනා ක්‍රමය මේ ආදී යෝජනා ක්‍රම යන් අවුරුදු දෙකකින් තුනකින් අවසන් කරන්න පුළුවන්කමක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දස වර්ෂය තුළදී ගිංගඟ සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ යුතුව තිබුණු නමුත් පසුගිය රජය ඒ ගැන කිසිම උනන්දුවක් නොදැක්වීම කනගාටුවට කරුනක්. [බාධා කිරීමක්] කෙසේ හෝ වේවා මේ රජයේ කාල සීමාව තුළදීම එම කාර්යය ඇරඹීමට පියවර ගන්නා බවට මගේ විශ්වාසයක් තිබෙනවා. සමහර විට ඒ රජය කාලය තුළ දී මෙම යෝජනා ක්‍රමය ගැන සඳහන්ව තිබුණු නමුත් නියම සැලැස්මක් ඇති කිරීමට, සමීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා තිබුණේ නැහැ; ඉංජිනේරු මහතුන්ට නියම කර තිබුණේ නැහැ. මේ පිළිබඳව ටෙන්ඩර් කැඳවා, පසුගිය අයවැය ලේඛනයෙන් රුපියල් හය ලක්ෂයක් ඒ කාර්යය සඳහා වෙන් කරන්න මේ රජයට හැකි වුණ බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. මා කලින් ප්‍රකාශ කළ අන්දමට 1966 ඔක්තෝබර් මාසයේදී ඇමෙරිකානු සමාගමක් සමග ගිවිසුම් ඇති කර ගෙන, 1965-70 වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සංවර්ධන සැලැස්මට මෙය ඇතුළත් කළේ මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ අදහස ඇතුවයි. ඒ අනුව අක්කර දාහතර දහසක ප්‍රදේශයක් සංවර්ධනය කළ හැකි අතර ප්‍රදේශයේ ජනතාවට ගංවතුර ගැලීමෙන් වන හානිය වළක්වා ගත හැකි වෙනවා. මගේ හැඟීමේ හැටියට අක්කර දහසය දහසක පමණ ප්‍රදේශයක පදිංචි ජනතාවට මෙයින් සහනයක් සැලසෙනවා. එම නිසා මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කාර්යය ගරු ඇමතිතුමා භාර ගැනීම ගැන සතුටු වන අතර එතුමාගේ අදහස ඉටු කර ගැනීමට මුළු ඇමති මණ්ඩලයේම සහාය එතුමාට ලැබෙනවා ඇතැයි විශ්වාස කර මින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## උඩුගම – බංගම පාර වැඩි දියුණු කිරීම

*உடுகம—பங்கமப்பாதையைத் திருத்தல்*

## IMPROVEMENTS TO UDUGAMA-BANGAMA ROAD

අ. භා. 3.17

**අමරසිරි මයා.**

*(திரு. அமரசிறி)*

(Mr. Amarasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"හිනිදුම ආසනය හා අකුරැස්ස ආසනය අතර ඇති උඩුගම-බංගම පාරේ බස් සේවාවක් ආරම්භ කිරීම සඳහා එම පාර ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වැඩිදියුණු කළ යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

මෙම පාර වැඩිදියුණු කිරීම සම්බන්ධව මා මෙම සභාව ඉදිරිපිටදී යෝජනා කරන්නට අදහස් කළේ විශේෂයෙන්ම මෙම පාර ගාලු දිස්ත්‍රික්කයත් මාතර දිස්ත්‍රික්කයත් සම්බන්ධ කරන ප්‍රධාන මාර්ගයක් වන නිසයි. උඩුගම සිට බංගම දක්වා ගොස් බංගමින් අකුරැස්ස දක්වා යාමට කෙටි මාර්ගයක් මෙම මාර්ගය සකස් කිරීම නිසා අපට පැදෙනවා. අද උඩුගම සිට අකුරැස්ස දක්වා යන කෙනෙකුට ගාල්ල ඔස්සේයි එම ගමන යාමට සිදු වන්නේ. ඒ අනුව සැතපුම් 50 ක පමණ දුරක් ඒ සඳහා ගෙවන්නට සිදු වෙනවා. එහෙත් මෙම පාර ඇති කිරීමෙන් එම දුර ප්‍රමාණය සැතපුම් 14 කින් කෙටි වෙනවා. මේ පාර සකස් කිරීමෙන් පසු අකුරැස්ස ප්‍රදේශයේ වගා කරන එළවළු වැනි ආහාර ද්‍රව්‍ය පවා උඩුගම ප්‍රදේශයට ගෙන ඒමට පහසුකම් සැලසෙනවා. මේ හේතුකොටගෙන එම ආසන දෙකේ සම්බන්ධතාවය ඇති වීම නිසා එම පළාත් දෙකම සංවර්ධනය වෙනවා. අපේ අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමාගේ (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) යෝජනාවක් අනුව එම ප්‍රදේශයේ පාර තරමක් දුරට කැපී තිබෙන බව දැන ගන්නට ලැබී තිබෙනවා. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් බංගම සිට සැතපුම් 2 ක් දුරට මෙම පාර වැඩි දියුණු කර තිබෙන නමුත් හිනිදුම ආසනයේ උඩුගම සිට ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි මයා.]
කොටස වැඩි දියුණු කළයුතු නිසයි මෙම යෝජනාව මා විශේෂයෙන් ඉදිරිපත් කරන්නේ.

මෙම පාර සංවර්ධනය කිරීම ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් භාර ගෙන තිබෙන බව පෙනී යනවා. එම කට යුත්ත කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට සිදු වෙනවා. එම වැඩ පිළිවෙළ ප්‍රමාද වූ විට නිසි පරිදි වැඩ කටයුතු ක්‍රියාත්මක වන්නේ නැහැ. එසේ හෙයින් ඉඩම් අත්පත් කර ගැනීමේ වැඩ පිළිවෙළ ඉතා ඉක්මණින් ක්‍රියාවට යෙදිය යුතුව තිබෙනවා. උඩුගම සිට හෝමදොල වතුයාය මැදින් සැතපුම් 5ක් පමණ දුර ගොස් එතැන සිට සැතපුම් 5ක් පමණ දුරට ඝණ කැලෑව මැදින් මෙම පාර කැපීමට යෝජනා කර තිබෙනවා. කැලෑව මැදින් සැතපුම් 5ක් පමණ දුරට මෙම පාර කැපෙන විට ඒ අවට අක්කර 14,000 ක පමණ බිම් ප්‍රමාණයක් සංවර්ධනය කිරීම සඳහා සංවර්ධන ව්‍යාපාරයක් ආරම්භ කරන්නට පුළුවන් වෙනවා.

එම ප්‍රදේශයේ පස ඉතාම සාරවත්. උස් බිම් ජනපද ඇති කිරීමට මෙන්ම තේ, කුරුඳු වැනි වගාවන් වැඩි දියුණු කිරීමටත් එම ප්‍රදේශය ඉතා හොඳයි. එසේ හෙයින් මෙම පාර ආරම්භ කිරීමෙන් ඒ ප්‍රදේශයේ දියුණුව සැළසෙන අතරම අකුරැස්ස හා උඩුගම ප්‍රදේශ දෙක සම්බන්ධ වීම නිසා වෙළ හෙළඳාම් කටයුතුවලටත් ගමනාගමන කටයුතුවලටත් ඉතා හොඳ යුගයක් උදා වෙනවා ඇති. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මෙම පාරේ වැඩ ආරම්භ කරන්නට යෝජනා කර තිබෙන නිසා ඉතා ඉක්මණින් එහි වැඩ කටයුතු කරන්නට අවශ්‍ය පියවර ගන්නා හැටියට ගරු ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

අ. භා. 3.20

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම යෝජනාව ස්ථිර කරමින්ම වචන ස්වල්පයක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. ඇල්ලකර ප්‍රදේශය, ඒ කියන්නේ මහලම්බඩ ප්‍රදේශය, ඉතා නොදියුණු ප්‍රදේශයක්. ඒ හැරෙන්නට දකුණු පළාතේ අභ්‍යන්තර ප්‍රදේශයන් ඉතා නොදියුණු බව කියන්නට ඕනෑ. එම ප්‍රදේශයන්හි මංමාවත්වල තත්ත්වය ඉතා දුර්වලයි. එම ප්‍රදේශවල විශාල ඝන කැලෑ පිහිටා තිබෙනවා. හිනිදුම කෝට්ඨාශය වාගේම බෙන්තර-ඇල්පිටියේ උතුරු කෝට්ඨාශයත් මීට සම්බන්ධයි. හිනිදුම ගරු මන්ත්‍රීතුමා මොනවා කීවත් විශේෂයෙන් මෙවැනි පාරවල් වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්නට සිදු වී තිබෙන්නේ ඉඩම් අමාත්‍යාංශයේ නොසැළකිල්ල නිසායි. 1965 වන විට කපා ගෙන යමින් තිබුණු පාරවල් ඒ නැවැත්වූ තැන්වල ම අදත් තිබෙන බව පෙනෙනවා. බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ හිනිදුම් කඳුවැටිය අද්දර එවැනි ස්ථාන අදත් දකින්නට තිබෙනවා. සමහර කම්කරුවන් සංගුවේ හඩ ඇසෙන විට ඉස්සූ උදැල්ල බිම නොගසා ආපසු ගෙනියනවායැයි අප අතර කතාවක් තිබෙනවා. අන්න ඒවාගේ ආණ්ඩුව වැටෙනවාත් සමගම නවත්වා දැමූ වැඩ අදත් ඒ අයුරින්ම තිබෙනවා. පාරවල් කැපීම, පාරවලට අවශ්‍ය පාලම් දැමීම, පාරවලට තාර දැමීම වැනි කටයුතු ඒ පිළිවෙළටම ඇනහිට තිබෙනවා. හිනිදුම-බඹරවාන පාර එවැනි එකක් බව කියන්නට ඕනෑ. එම පාරේ වැඩ නැවැත්වූ ගමන්ම තිබෙනවා. හිනිදුම ගරු මන්ත්‍රීතුමා කීවා වාගේ එම ප්‍රදේශය විශාල සංවර්ධන ව්‍යාපාරයක් ආරම්භ කළ ප්‍රදේශයක්. වැවීගෙන යන ප්‍රදේශයක්; හිනිදුම කඳු වැටිය අයිනෙ ඉතාම හොඳ සශ්‍රීක ප්‍රදේශයක්. අද ඒවා අත්හැර දමා තිබෙනවා. ඒ ප්‍රදේශයේ කැපූ මංමාවත් අද සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබෙනවා. මත්තක-පොරවගම පාර එහෙම අත්හැර දමූ පාරක්. ඒ වාගේම ඉහළ හේවැස්ස-බඹරවාන පාරත් අත්හැර දමා තිබෙනවා. මේ විධියට යම් යම් ස්ථානවල කැපූ පාරවල් අද සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබෙනවා. නමුත් අනාගතයේදී යම්කිසි සංවර්ධනයක් ගෙන යන්නට පුළුවන් තත්ත්වයක් තිබෙන්නෙ, ඉඩකඩම් තිබෙන්නේ, මේ කියන ප්‍රදේශවලයි.

මේ උඩුගම-බංගම පාර ගැන මා දන්නවා. යම් විධියකින් ඒ පාර දියුණු කළොත් හිනිදුම ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මුළු රටටම ඉතාම විශාල සේවයක් අත් වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද ශීඝ්‍රයෙන් ජනගහනය වැඩි වේගෙන යනවා. නමුත් මේ ඉඩම් ඇමතිතුමාගෙන් කෙනෙකුට ඉඩම් අක්කර පහක් හයක් ගන්නට හරිම අමාරුයි. ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේත් ඉඩම් ලබා දීම බොහොම අමාරුවෙන්, බොහොම ආයාසයෙන් කරන දෙයක් හැටියටයි, මේ ඇමතිතුමා පෙන්වන්නෙ. අපේ ප්‍රදේශවල ජනගහනය අද ඉතාම උග්‍ර වී තිබෙනවා. මැටිවිඩිය කියන ගමේ ජනගහනය පිළිබඳ ප්‍රශ්නය කොයි තරම් උග්‍ර වී තිබෙනවාද කියනවා නම්, අද ඒ ගමේ මිනිසුන්ට තමන්ගේ දරුවකු නැත්නම් නෑයකු මළොත් මිනිය වළලන්නටවත් තැනක් නැහැ. සම්පූර්ණ බලතල පාවිච්චි කර ඒ ගමට ඉඩම් අක්කරයක් අත්පත් කර දෙන්නට ගම් කාර්‍ය සභාව ඉදිරිපත් වූ අවස්ථාවේදී ඉඩම් ඇමතිතුමා මොකක්ද කළේ? ඒක නවතා දැමුවා. මේ විධියේ තත්ත්වයක් තිබෙන්නෙ.

හිනිදුම ගරු මන්ත්‍රීතුමනි, මහජනතාව වෙනුවෙන් අපි කොතරම් මෙවැනි යෝජනා ඉදිරිපත් කළත් මේවා ක්‍රියාත්මක වේවිය කියා මා සිතන්නේ නැහැ. ඇමතිතුමා නම් අදත් මේවා ක්‍රියාත්මක කරනවාය කියනවා. නමුත් මා තමුන්නාන්සේට එකක් කියන්නට සතුටුයි. මේ ඉඩම් ඇමතිතුමා සිටියොත් තව අවුරුදු විසිපහක් ගත වුණත් ඔය පාරේ වැඩ අවසන් වන්නේ නැහැ. නමුත් තමුන්නාන්සේගේ සිතට සැනසීමක් දෙන්නට පුළුවනි. ඔය වැඩේ මේ ඇමතිතුමා නොකළොත් 1970 න් පසු අපිවත් කර දෙන්නම්. හිනිදුම ගරු මන්ත්‍රීතුමා සමහර විට මේ යෝජනාව ඉදිරිපත් කරන්නට ඇත්තේ ඉක්මනින් මේක කරවා ගැනීමේ අදහසින් වෙන්නට ඇති. ඇමතිතුමාට කිව්වාට එතුමා මේවා ක්‍රියාත්මක කරන්නේ නැහැ. එම නිසා වෙන්නට ඇති හිනිදුම ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාවට මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නෙ.

ඇත්ත වශයෙන්ම මේ විධියට යෝජනා ඉදිරිපත් කර සම්මත කළත් අපේ ප්‍රදේශවල වැඩ කටයුතු කරවා ගන්නට බැහැ. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාවත් දෙතුන් වර යෝජනා සම්මත කර එවනවා. නොයෙකුත් දේවල් ගැන, පාරවල් ගැන, ඉඩම් ගැන, තැපැල් කාර්යාල ගැන යෝජනා සම්මත කර එවනවා. නමුත් ඒවා එකක්වත් ක්‍රියාත්මක වන්නේ නැහැ. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභා රැස්වීම්වලින් කිසිම පලක් නැහැ, නිකම් කථා කරනවා පමණය කියා මා පසුගිය වතාවේ දිසාපතිවරයාට කිව්වා. ඇමතිවරුන් වැඩ කරන්නේ නැහැ. සාමාන්‍ය මහජනතාව වෙනුවෙන් වැඩ කරන්නේ නැහැ. මීට වඩා යමක් කියන්නට මා අදහස් කරන්නෙ නැහැ. හිනිදුම ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව මා ඉතා ඕනෑකමින් ස්ථිර කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අ. භා. 3.25

**අමරසිරි මයා.**

(திரு. அமரசிறி)

(Mr. Amarasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බෙන්තර-ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමා හිනිදුම-බඹරවාන පාර සම්බන්ධව මතක් කළා. ඒ සම්බන්ධයෙන් මා වචනයක් කියන්නට සතුටුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මාපලගම-හබරකඩ පාර තනාගෙන යනවා. එය හිනිදුම-බඹරවාන පාරට යා කිරීමටත් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරගෙන යනවා.

මා දැන් ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව සම්මත වී මෙය ක්‍රියාත්මක කිරීමට ගරු ඇමතිතුමා කටයුතු කරාවිය කියා අප විශ්වාස කරනවා. ඒ සම්බන්ධයෙන් ඇමතිතුමා තුළ අපේ සම්පූර්ණ විශ්වාසය තිබෙනවා. 1970 දී නොව අපේ කාලයේදීම වැඩ ආරම්භ කර සැහෙන ප්‍රතිඵල පෙන්වීමට ඇමතිතුමා කටයුතු කරාවිය යන විශ්වාසය ඇතිව මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## විජේබාහු කන්ද පාර

### விஜேபாகுகந்தப் பாதை

### VIJEBAHUKANDA ROAD

අ. භා. 3.27

**ඩී. බී. රණතුංග මයා.** (කොත්මලේ)
*(திரு. டீ. பி. ரணதுங்க—கொத்மலே)*
(Mr. D. B. Ranatunga—Kotmale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"කොත්මලේ විජේබාහු කන්ද පාරේ බෙරමාන සිට විජේබාහු කන්ද විහාරය දක්වා ගම්මුන් විසින් ශ්‍රමදානයෙන් කපා ඇති පාරේ සැතපුමකට බෝක්කු බැඳ ඇති අතර එම කොටස, රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් පවරාගෙන එයට ගල් අතුරා තාර දැමිය යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

දැන් ආණ්ඩු පක්ෂයේ අප යෝජනා ඉදිරිපත් කරන විට විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්, මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) එහෙම අසන්නට පුළුවනි, අප මෙවැනි යෝජනා ඉදිරිපත් කරන්නේ මක් නිසාද කියා.

එහෙත්, නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මාතර ගරු මන්ත්‍රීතුමා (බී. වයි. තුඩාවෙ මයා.) මොහොතකට පෙර අපේ ඉඩම් ඇමතිතුමා කෙරෙහි විරුද්ධ පක්ෂයේ ඇති පිළිකුලත්, අප්‍රසාදයත්, භීතියත් පළ කළා. අප පිළිගන්නවා ඒක සාධාරණයි කියා. එසේ සාධාරණයි කියා මා කිව්වේ විශේෂයෙන් ඒ තත්ත්වය උද්ගත වුණේ 1964 දෙසැම්බර් මාසයේ පමණ සිට නිසායි. ඊට කලින් අපට මතකයි අවුරුදු 9 ක් 10 ක් පමණ කාලයක් තිස්සේ තමුන්නාන්සේලා මේ ඇමතිතුමා දේවත්වයේලා සැලකූ කාලයක් තිබුණ බව. මේ කාරණය මා මේ අවස්ථාවේදී මතක් කෙළේ විශේෂයෙන්ම මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිණිස මෙම ගරු සභාවට ඇනුම් දුන්නාට පසුව මේ පාර සම්බන්ධයෙන් විශාල වෙනසක් සිදු වී තිබෙන නිසයි. මා ඉදිරිපත් කර ඇති මේ යෝජනාව, නුවර එළිය, නාවලපිටිය, කොත්මලේ යන ඡන්ද කොට්ඨාශ තුනටම බල පාන යෝජනාවක්. එවැනි වැදගත්, ප්‍රයෝජනවත් මාර්ගයක් නිසායි මා මෙය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කෙළේ.

යෝජනාව පිළිබඳව ඇනුම් දුන්නාට පසුව—ගරු ඉඩම් ඇමතිතුමාට මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙන්න ඕනෑ—මෙම පාර ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට භාරගෙන රුපියල් 45,000 ක් පමණ වියදම් කර ඉතාමත් සැලකිය යුතු තත්ත්වයකට පාර මට්ටම් කිරීම් ආදී කටයුතු කර අවසන් කර තිබෙනවා. ඒ නිසා මා විශෙෂයෙන් රජයේ වැඩ ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා, මෙම පාර නුවරඑළිය දක්වා ඇති මහා මාර්ගය හැතැප්ම 15කින් කෙටි කළ හැකි ප්‍රධාන මාර්ගයක් බවට පත් කරන්න පුළුවන් නිසා කරුණාකර මෙය රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පවරාගෙන ඒ මගින් ගල් අතුරා තාර දමා සකස් කර දෙන්නය කියා. මෙයින් කොත්මලේ ආසනයට පමණක් නොව, නුවරඑළිය, නාවලපිටිය ආදී කොට්ඨාශ කීපයකටම ලොකු සේවයක් සිදු වෙනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම මාර්ගය පිළිබඳ වැදගත්කම රඳා ඇති තවත් සැලකිය යුතු කාරණයක් තිබෙනවා. එනම් විජේබාහු කන්දේ අක්කර 500කට වැඩි ගණනක වෙල් යායකට පොහොර ගෙන යෑම, එයින් ලැබෙන අස්වැන්න පිටට ගෙන යෑම ආදී කටයුතු සඳහා මෙම මාර්ගය ඉතාමත් වැදගත් බවයි. ඒ නිසා ගොවි ජනතාවට අත දෙන, ගොවි තැනට විශේෂ තැනක් දෙන ජාතික රජය මේ පාර සකස් කර දී කොත්මලේ ගොවි ජනතාවටත් ලොකු සේවයක් සලස්වා දෙන ලෙස ඉල්ලමින් මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කරනවා.

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)

**විසින් ස්ථිර කරන ලදී.**
ஆமோதித்தார்.
*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප. භා. 3.30

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

The hon. Member for Kotmale wants the road referred to in this Motion to be taken over by the Public Works Department. Now, Sir, I have got a minute on this particular road. It is correct to state that this road has been cut by the people of the area. And generally under those circumstances the Government makes it a point to be of some assistance when the Public Works Department is aware of the fact that a lot of effort has been made by the people of the area in cutting a road.

The approximate cost of works to be done to bring the road up to class 'C' standard for half a mile is Rs. 65,000. At the moment this road branches off at the 4th mile of the Bogahawatte - Wijebahukanda - Maldeniya Public Works Department Road. [*Interruption*]. That is another road? Half a mile of the road has been cut. Whatever that may be, I am perfectly prepared to discuss this matter with the hon. Member. He also stated that this is leading to a large agricultural area and I can assure him that I shall do everything possible at least to make it a Class 2 Public Works Department Road in view of the importance of that road to feed the agricultural area. I think the request of the hon. Member is a reasonable one. I am prepared to discuss this matter to see what can be done as early as possible. If the hon. Member would see me we can settle this matter.

Now, this gives me an opportunity of mentioning to the hon. Members of this House that a sum of 9.8 million dollars has been negotiated with the World Bank and the International Development Fund and that this sum is now forthcoming. It was only the other day that the Cabinet approved utilizing this money for the improvement of our roads. I am making this point on this occasion because I think Members of Parliament are appreciative of the fact that cutting of roads in modern times needs better and new equipment. The equipment that we have had in the past was of very poor standard and it was only recently, Sir, that this Government was able to get Rs. 17 million worth of equipment.

When I became the Minister of Public Works there were only 126 road rollers that were roadworthy, and even today we do not have enough road rollers in this country. We were able to get about 65 road rollers and when you add that 65 to the 126 roadworthy road rollers that we have we do not yet arrive at anything more than 1.25 per cent. per district. Normally, one would expect at least two road rollers per electorate; otherwise we cannot cope with the work because a road roller is a slow moving machine. Until we reach at least a target of 300 road rollers in this country, which are modern and which do not necessarily break down, as it was the case in the past, we cannot be quite happy.

Therefore, one reason for this loan is to obtain the latest equipment and to mechanize the road building programme of our country. This loan has already been granted and the Cabinet has approved this loan being utilized for road building. It is quite a big sum—9.8 million dollars—and we hope to take up the whole of Southern Province to start with. The reason for selecting the Southern Province is because of the various terrains. You get the Udugama, Baddegama and Morawaka Korale areas. That is a pilot project.

We are going in for direct labour. In other words, we are proposing to do away with the overseer system in the shortest possible time and to have a department for highways and a department for buildings which will undertake specialized work. That is to say, there will be one specialized branch for buildings and one specialized branch for roads. When that equipment comes we shall be able to do much more than we have done in the past.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

Apart from his reply to the Motion moved by the hon. Member for Kotmale (Mr. Ranatunga), the Hon. Minister spoke about his policy.

I remember about two years ago the Minister enunciated his new policy in the House and he then spoke about the need for new equipment. The Opposition did not stint him then: we gave him all the money he needed. That was two years ago. But I am sorry to say that nothing spectacular has happened.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

The rollers are just coming in.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I wish to tell the Minister that in 1967 a sum of about Rs. 37,000 was passed for the metalling and tarring of Hirigalketiya-Poddala Road in my electorate.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

That is the rupee budget. This is foreign exchange.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I am talking of the way in which the Public Works Department is doing its work.

The metalling and tarring of one mile of road has not yet been completed. When I wrote to the department they informed me that no cylinders were available for the culverts. I then asked why they estimated for cylinders when they were not available and why they could not build the vulverts. The department then wrote back that cylinders would be available somewhere in February. I then asked that till the cylinders were available the work on surfacing be proceeded with.—[*Interruption*].

I wish to ask, what is the use of waiting for up-to-date machinery when you cannot handle the jobs with the machinery available? It is an absolute waste of time. If they cannot handle the old equipment that they have been used to for donkey's years, how on earth are they going to work with new and up-to-date machinery?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I agree that when there are no cylinders we should not delay construction work. Our engineers go in for cylinders because they are more modern. We had some difficulty: these cylinders are made by the Bridges Section of the P. W. D. and are also available at a private firm, The Indian Hume Pipe Company. Anyway, I shall certainly look into this, and, if we have no cyiinders, I shall see that culverts are built. What is the name of the road?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

Hirigalketiya-Poddala Road.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## සන්ගිලි පාලම — මලහැව පාර වැඩිදියුණු කිරීම

*சங்கிலிப்பாலம-மாலஹேவ பாதையைத் திருத்தல்*

## IMPROVEMENTS TO SANGILIPALAMA-MALAHEWA ROAD

අ. භා. 3.39

**රණතුංග මයා.**
*(திரு. ரணதுங்க)*
(Mr. Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ඊළඟ යෝජනාව මා දැන් ඉදිරිපත් කර නවා:

" කොත්මලේ සන්ගිලිපාලම සිට රජ්ගම මලහැව

දකවා ශ්‍රමදානයෙන් කපා බෝක්කු බැඳ තිබෙන පාර රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පවරාගෙන එය වැඩි දියුණු කළ යුතුයයි මෙම මන්ත්‍රි මණ්ඩලය අදහස් කරයි."

මෙම යෝජනාව සම්බන්ධයෙන් අදහස් ස්වල්පයක් ඉදිරිපත් කරන්නට මත්තෙන් අපේ ප්‍රදේශයේ පාරවල් සම්බන්ධයෙන් පසු ගිය කාලය තුළදී ඇති වී තිබෙන දියුණුව ගැන රජයේ වැඩ ඇමති තුමාට ස්තුතිවන්ත විය යුතුව තිබෙනවා. බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් (නිල් ද අල්විස් මයා.) මාතර ගරු මන්ත්‍රීතුමාත් (තුඩාවෙ මයා.) කියන විධියට මුහුදුකරේ ප්‍රදේශවල මොන තත්ත්වයක් තිබෙන වාද කියා මා දන්නේ නැහැ. එහෙත් ඇත්ත වශයෙන් උඩ රට ප්‍රදේශයේ නුවරඑළිය, ගම්පොළ, කොත්මලේ, නාවල පිටිය ආදී පළාත්වල මා දන්නා තරමින් නම් පසු ගිය අවුරුදු 4ක් පමණ වූ කාලය ඇතුළත පාරවල් සම්බන්ධයෙන් දියුණු තත්ත්වයක් ඇති වී තිබෙනවාය කියා කිසිම බියක් නැතිව කියන්න පුළුවන්. කාලාන්තරයක් තිස්සේ කිසිම වැඩක් නොකෙරී තිබුණ ගම්පොළ, කොත්මලේ, නාවලපිටිය ආදී ආසනවල ප්‍රධාන මාර්ග රාශියක වැඩ පසු ගිය කෙටි කාලය ඇතුළත ගරු රජයේ වැඩ ඇමතිතුමාගේ උනන්දුව නිසාම කෙරී ඇති බව ප්‍රශංසා මුඛයෙන් සඳහන් කළ යුතුව තිබෙනවා.

එවැනි වැඩ කොටසක් රජයෙන් කෙරී තිබෙන අතර ඊට අතිරේක වශයෙන් ශ්‍රම දානයෙන් කපා තිබෙන සන්ගිලිපාලම සිට රජ්ගම මලහැව දක්වා වැටී ඇති පාරද අක්කර දහස් ගණනක කුඹුරු ප්‍රමාණය කට සේවය කෙරෙන පාරක් නිසාත්, ඒ වාගේම අවට ගම්වාසීන්ට ප්‍රයෝජනවත් පාරක් නිසාත්, එය ලබන වර්ෂයේ ඇස්ත මේන්තුවලට ඇතුළත් කර රජයෙන් නඩත්තු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැනට මෙම පාර ග්‍රාම සං වර්ධන දෙපාර්තමේන්තුවෙන් පාලනය වන නමුත්, එය නිසියාකාර නඩත්තු කර ගෙන යාමට පුළුවන් තත්ත්වයක් එම දෙපාර්තමේන්තුවට නැති නිසා එම පාර රජයට පවරාගෙන වැඩි දියුණු කර දෙන ලෙස මා නැවතත් ගරු ඇමතිතමාගෙන් ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිමින් එම යෝජනාව සභාවට ඉදිරිපත් කරනවා.

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)
විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
*seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## කොත්මලේ කොට්ඨාශයේ විද්‍යාලවල ගුරු පුරප්පාඩු

## கொத்மலே தொகுதிப் பாடசாலைகளிலுள்ள வெற்றிடங்கள்

## VACANCIES IN SCHOOLS IN KOTMALE ELECTORATE

අ. භා. 3.43

**රණතුංග මයා.**
*(திரு. ரணதுங்க)*
(Mr. Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"කොත්මලේ ඡන්ද දායක කොට්ඨාශයේ තිබෙන විද්‍යාලවල හා මහා විද්‍යාලවල තිබෙන සියළුම පුරප්පාඩු පිරවීම සඳහා වහාම ක්‍රියා කළ යුතුයයි, මෙම මන්ත්‍රි මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කරමින් ගුරු හිඟය ගැන කථා කරන්නට පෙර අපේ විද්‍යාලවල තත්ත්වය නගා සිටුවීමට ගරු අධ්‍යාපන ඇමතිතුමා ගෙන ඇති පියවරවල් ගැන ප්‍රශංසා මුඛයෙන් වචනයක් කීම යුතුකමක් වශයෙන් මා සලකනවා. පසුගිය කාලසීමාව ඇතුළත විශේෂයෙන් අපේ වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා කොත්මලේ වගේ නොදියුණු කොට්ඨාශවල පාඨශාලා ගොඩනැගිලි හා ගුරු නිවාස ඇති කිරීම සඳහා ලොකු වෙහෙසක් හා විශාල වියදමක් දරා තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කළ යුතුයි. ඒ පහසුකම් සැලසුණත් අවාසනාවකට වාගේ—දෙපාර්තමේන්තුවේ යම් යම් නිලධාරීන්ගේ වරද නිසාදැයි මා දන්නෙ නැහැ—අපේ කොට්ඨාශවලට අවශ්‍ය පමණ ගුරුවරුන් නැහැ. අමාත්‍යාංශය මගින් මේ විද්‍යාලවලට ගුරුවරුන් පත් කර යවනත් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රණතුංග මයා.]

කොට්ඨාශ දුෂ්කර පළාත්ය, එහි නිවාස හිඟය තිබෙනවාය, ආදි වශයෙන් නොයෙක් දේවල් කියා රහසිගත අන්දමට දෙපාර්ත මේන්තුවෙන් ඒ මාරුවීම් අවලංගු කර ගන්නා බව අපට යම් යම් අවස්ථාවලදී දැන ගන්නට ලැබෙනවා. මේ හේතුව නිසා කාලයක් තිස්සේ අපේ විද්‍යාලවල ළමයින්ට විශාල පාඩුවක් සිදු වී තිබෙනවා. ඒ විධියේ දුක්ගැනවිලි අනන්තවත් අසන්නට ලැබෙනවා. මේ රටේ වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුව ගම්බද හා නගර බද සෑම ශිෂ්‍යයෙකුටම සම තත්ත්වයේ අධ්‍යාපනයක් ලැබෙන මේ වකවානුවේ කොත්මලේ වගේ කොඨාශයක අපේ දුප්පත් දරුවන්ට විශේෂඥ පුහුණුව ලැබූ ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනවා නම් එය ඉතා අසාධාරණයි. ගණිතය, විද්‍යාව ආදි විෂයයන් ඉගැන්වීමේ පුහුණුව ලැබූ ගුරුවරුන්ගේ හිඟයක් ඒ ප්‍රදේශයේ පවතින නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, නුවරඑළි දිස්ත්‍රික්කයට පත් කර යවන ගුරුවරුන් වරින් වර කඩින් කඩ හොර රහසේ පහසු ප්‍රදේශවලට මාරුවීම් ලබාගෙන එන්නේ කෙසේද යන්න සොයා බැලීමට අපක්ෂපාත පරීක්ෂණයක් පවත්වන්න කියා. ඒ අන්දමේ පරීක්ෂණයක් පවත්වා ඒ ගුරුවරුන්ට හිතුවක්කාරකම් කරන්නට ඉඩ නොදී, නිලධාරීන්ට ඕනෑ හැටියට ගුරුවරුන් මාරු කරන්නට අවස්ථාව නොදී, අපේ පළාත්වල දරුවන්ටත් එවැනි විශේෂඥ පුහුණු ගුරුවරුන්ගේ සේවය ලබා දෙන්නට යම් කිසි ක්‍රියාමාගර්යක් සකස් කරන ලෙස ඉල්ලමින් මගේ යෝජනාව සභාව ඉදිරියේ තබනවා.

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම යෝජනාව ස්ථිර කරමින් කරුණක් දෙකක් කෙරෙහි ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරවීමට මා අදහස් කරනවා. කොත්මලේ මෙන්ම හිනිදුම ආසනයත් දුෂ්කර ප්‍රදේශයක්. හිඟය තිබෙනවා. මේ නිසා ගුරු විද්‍යාලවල පුහුණුව ලබන හිනිදුම් පත්තුවේ ගුරු භවතුන් නැවතත් පුහුණුව අවසාන වීමෙන් පසුව හිනිදුම් පත්තුවටම පත් කරන ලෙස මේ සම්බන්ධයෙන් සලකා බැලූ ගාල්ලේ දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කාරක සභාව යෝජනාවක් සම්මත කර දෙපාර්තමේන්තුවට එවා තිබෙනවා. අප ඒ ඉල්ලීම කරන්නේ හිනිදුම ප්‍රදේශයත් දැන් දුෂ්කර ප්‍රදේශයක් වශයෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පිළිගෙන තිබෙන නිසයි. කොත්මලේ ප්‍රදේශයේ පමණක් නොව දුෂ්කර ප්‍රදේශවල සෑම ආසනයකම මේ ගුරු හිඟය තිබෙනවා. ගුරුවරුන්ගේ අවශ්‍යතාව වැඩිවීම නිසාත් මේ ප්‍රශ්නය පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ප්‍රදේශවල සේවය කළ සමහර මුල් ගුරු මහතුන් ශ්‍රේණි ලබාගෙන පිට පළාත්වලට මාරු වී ගියා. දැනට අපේ පළාත්වල ගුරු හිඟයක් තිබෙන නිසා ඒ ගුරු භවතුන් ද නැවතත් ඒ ප්‍රදේශවලටම මාරු කරන ලෙසත් ඉල්ලමින් මේ යෝජනාව මා ස්ථිර කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## හාල්වැලිතොටට පාලමක්
*ஹல்வெலித் தோட்டவில் பாலம்*
### BRIDGE AT HALVELITOTA

අ. භා. 3.45

**රණතුංග මයා.**
*(திரு. ரணதுங்க)*
(Mr. Ranatunga)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"කොත්මලේ උඩපනේ කෝරලේ හා මැදපනේ කෝරලේ සම්බන්ධ කෙරෙන පාලමක් හාල්වැලි තොට ඉදිකර ගමනාගමන පහසුකම් සැලැස්විය යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිට මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට සිද්ධ වුණේ, දිස්ත්‍රික්ක සම්බන්ධතා කමිටුව මගින් මේ යෝජනාව කිහිප වරක්ම රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව, මේ පාලම සහ පාර සෑදීම සඳහා විශාල වියදමක් යන නිසා දැනට තිබෙන මුදල් තත්ත්වය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුව මේ කටයුත්ත භාර ගැනීමට අපට පුළුවන්කමක් නැහැ කියා දෙපාර්තමේන්තුව දන්වා එවීම නිසයි. කොත්මලේ වැනි නොදියුණු පළාතක මෙවැනි පාලමක් ඉදි කිරීමෙන් නුවරඑළිය සහ නාවලපිටිය වැනි ප්‍රධාන නගර සම්බන්ධ කෙරෙන මහා මාර්ගය හැතැප්ම විස්සකින් තිහකින් කෙටි කරන්නට පුළුවන් වොතොත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවට කරන්නට පුළුවන් වටිනාම මෙහෙයත් එයම බව මේ ගරු සභාවට මතක් කරන්නට කැමතියි. මෙවැනි පාලමක් ඉදි කිරීමෙන් විශාල ලාභයක් ලැබෙනවා. කෝරළ දෙකක්, ගම් 36ක් එකට සා වෙනවා. මෙයින් විශාල ප්‍රදේශයක් හා කෙරෙනවා පමණක් නොව නුවරඑළිය සහ නාවලපිටිය වැනි ප්‍රධාන නගර යා කෙරෙන පාර හැතැප්ම 22 කින් කෙටි වෙනවා. මේ ගැන වැඩි විස්තර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ තිබෙනවා. පසුගිය කාලය තුළ මගේ ඡන්දදායක කොට්ඨාශය වෙනුවෙන් ඒ තරම් විශාල වැඩක් කරන්නට අවස්ථාවක් ලැබුණේ නැහැ. අවුරුදු ගණනාවකින් කොත්මලේ ප්‍රදේශයට විශාල සේවයක් වන වැඩක් මේ යෝජනාව යටතේ කරන්නට පළුවන් නිසා කරුණාකර අවශ්‍ය පරීක්ෂණ පවත්වා මේ පාලම ඉදි කර දුන්නොත් එය නුවරඑළිය, නාවලපිටිය සහ කොත්මලේ වැසියන්ට කරන උදාර සේවයක් වන බව මතක් කරන්නට මම කැමතියි.

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)

**විසින් ස්ථිර කරන ලදී.**
*ஆமோதித்தார்.*
*seconded.*

අ. භා. 3.47

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

The approximate cost of this bridge that the hon. Member refers to is Rs. 800,000 and at present there is a suspension bridge of 245 feet span in fairly good condition. But in view of what the hon. Member has said. I shall include this item in the next year's Budget proposals so that once it goes before the Treasury they will look into it a little more carefully, and if it is possible I will have the investigations set afoot for next year's Budget.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## තැපැල් කාර්යාලවලට දුරකථන හා ලියුම් බෙදීමේ පහසුකම්

## எல்லாத் தபால் நிலையங்களுக்கும் தொலைபேசி வசதிகளும், தபால் கொடுக்கும் வசதிகளும்

## TELEPHONE AND POSTAL DELIVERY FACILITIES TO ALL POST OFFICES

අ. භා. 3.48

**කා. පො. ඉරත්තිනම් මයා. (කිලිනොච්චි)**
*(திரு. கா. பொ. இரத்தினம்—கிளிநொச்சி)*
(Mr. K. P. Ratnam—Kilinochchi)

கௌரவ உப சபாநாயகரவர்களே, எனது பெயரிலுள்ள கீழ்வரும் பிரேரணையை நான் பிரேரிக்கிறேன் :

" தொலைபேசி வசதிகளும், வீடு வீடாகத் தபால் கொடுக்கும் வசதிகளும் கொடுக்கப்படாத எல்லாத் தபால் நிலையங்களுக்கும், உபதபால் நிலையங்களுக்கும் இவ் வசதிகளைக் கொடுப்பதற்கு, உடனே அரசாங்கம் நடவடிக்கை மேற்கொள்ள வேண்டுமெனவும் இவ்வாறு செய்து, சம வாய்ப்புக்கு வழி கோலிச் சமுதாய நீதி கால் கொள்ளச் செய்யும்வரை தபால் தொலைத் தொடர்புத் துறைகளில் வேறெவ்வகை ஆக்கத்துக்கும் இந்நாட்டுப் பணத்தைச் செலவு செய்யக் கூடாதெனவும் இச்சபை கருதுகிறது ".

இந்தப் பிரேரணை இரண்டு பகுதிகளை உடையதாக இருக்கிறது. வசதிக்குறைவான இடங்களிலே, பல ஆண்டுகளாக தொலைபேசி வசதிகளும், வீடு வீடாகத் தபால் பெறும் வசதிகளும் இழந்து இவ்வசதிகள் எங்களுக்குக் கிடைக்குமா என்று ஆண்டாண்டு தோறும் அவலப்படுகின்ற மக்களுக்காக

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉරත්තිනම් මයා.]

அவர்களுக்குத் தேவையான வாய்ப்புக் களைச் செய்து கொடுக்க வேண்டுமென்று கூறு கிறது ஒரு பகுதி. இந்நாட்டின் பணத்தைப் பெரும்பாலும் அவற்றுக்குத்தான் செலவு செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்ளு கிறது மற்றப் பகுதி.

அமைசரிடத்திலே நாங்கள் எதைக் கேட்டாலும், பணம் இல்லை என்று சொல்லு கிறுர். அதற்காக அமைச்சர்களை நாங்கள் குறை சொல்ல இல்லை. என்ருலும் பணத் தைச் செலவுசெய்யும் பொழுது, ஒரு நாட் டின் உடனடியான தேவையை நோக்கி, அந்த நாட்டிலேயுள்ள எந்தெந்தப் பகுதி மக்க ளுக்கு அதிகமான தேவை இருக்கிறதென்ப தைப் பார்த்துச் செலவு செய்ய வேண்டுமென் பதுதான் இந்தத் தீர்மானத்தின் அடிப்படை நோக்கமாகும். எனவேதான், வடக்கு, கிழக்கு அல்லது தெற்கு, மேற்கு என்ற வேறு பாடில்லாமல், இலங்கையிலேயுள்ள மக்கள் எல்லோருக்கும் பொதுவாக—இலங்கையிலே யுள்ள சமுதாய நீதி மறுக்கப்பட்டுத் துடி துடித்துக் கொண்டிருக்கின்ற மக்களுக்குப் பொதுவாக—இந்தப் பிரேரணையைக் கொண்டு வந்தேன். இக் கருத்தமைந்த, ஒரு தீர்மானம் அரசாங்கப் பாராளுமன்றக் கட்சிக் குழுக்கூட்டத்திலே என்னுற் கொண்டு வரப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது. ஆனுலும் அது நடை முறைப்படுத்தப்பட வில்லை. சமுதாய நீதி மறுக்கப்பட்ட மக்க ளுக்கு—கடற்கரைப் பகுதிகளிலேயுள்ள மக் களுக்கு—குடியேற்றப் பகுதிகளிலேயுள்ள மக் களுக்கு—பழைய கிராமங்களிலேயுள்ள மக்க ளுக்கு—இப்படிப்பட்ட தொலைபேசி, தபால் வசதிகள் இல்லாமல் பல ஆண்டுகளாகத் துன் பப்படுகின்ற மக்களுக்கு—ஒரு நல்ல வாய்ப் பை இந்த அரசாங்கம் செய்து கொடுக்க வேண்டுமென்ற நோக்கத்துடன்தான் அரசாங் கப் பாராளுமன்றக் குழுக் கூட்டத்திலே ஐந்து ஆண்டுத் திட்டமொன்றை எல்லா மா காணங்களிலேயும் அமைக்க வேண்டுமென்ற ஒரு தீர்மானமும் நிறைவேற்றப்பட்டது. என்னுடைய தீர்மானமே அது. ஐந்து ஆண்டுகளுக்கிடையிலே இன்ன இன்ன பகுதி களிலே இன்ன இன்ன ஆண்டுகளிலே தொலை பேசி வசதி கொடுக்க முடியுமென்று தீர்க்கப் பட வேண்டுமென்று தீர்மானிக்கப்பட்டது. அதைப் பாராளுமன்றக் குழு ஏற்றுக்கொண் டது. அதன்படி சில திட்டங்கள் அமைக்கப் பட்டன. அப்படி அமைக்கப்பட்ட திட்டங்க ளிலே சில உப தபால் நிலையங்களுக்குத் தொலைபேசி வசதி கொடுப்பதாகவும் ஒழுங்கு செய்யப்பட்டது. யாழ்ப்பாணக் கச்சேரியிலே நடந்த மாவட்ட இணைப்புக் குழுக் கூட்டதி லேகூட, இந்த ஐந்து ஆண்டுத்திட்டம் பின்பு நான்காண்டுத் திட்டமாக்கப்பட்டது. என்ரு லும், அது காகிதத் திட்டமாக இருக்கிறதே அன்றி, அது நிறைவேற்றப்படவில்லை. ஆகவே தான் மீண்டும் அதை இங்கே கௌரவ அமைச்சருக்கு சுட்டிக்காட்டுவதற்காக நான் இந்தப் பிரேரணையைக் கொண்டு வந்தேன்.

பட்டினங்களிலே வாழுகின்றவர்களுக்கு வேண்டிய வசதிகளைச் செய்து கொடுக்க வேண்டியது அவசியம்தான். என்ருலும், எங் களுடைய செலவுத் தொகை தொடர்பாக நோக்குகின்ற பொழுது, ஒருகோடியே அறு பத்தெட்டு இலட்சத்து ஐம்பத்தொன்பதினுயி ரத்து நூற்று நாற்பத்துநான்கு ரூபா மட்டுமே வரவு செலவுத் திட்டத்திலே அஞ்சல் திணைக்களத்துக்கு ஒதுக்கப்பட்ட செலவுத் தொகையாகக் காணப்படுகிறது. தொலைபேசித் தொடர்பு வசதிகளுக்காக 19 இலட்சம் ரூபா மாத்திரம் ஒதுக்கப்பட்டிருக்கிறது. ஏறக் குறைய 12 சதவீதம்தான் தொலைபேசித் தொடர்ப்பு வசதிக்கான மொத்தச் செலவுக்கு ஒதுக்கப்பட்டிருக்கிறது. இந்த 12 சதவீதத் தொகையில் பட்டணப் பகுதிகளுக்குச் செல விடப்பட்டு மிச்சம் எவ்வளவு இருக்குமென்று நாங்கள் சொல்ல முடியாது. எனவே, இவ் வாண்டிலே தொலைபேசித் தொடர்பு வசதிகளை மக்களுக்குக் கொடுப்பதற்காகச் செலவழிக் கப்படுவதிலே 1 சதவீதம்தான் பொதுவாகக் கிராமப்புற மக்களுக்குக் கொடுக்கத்தக்க அளவிலே அமைந்திருக்கிறது. ஏனைய செல வினங்கள் முழுவதும் பெரும்பாலும் பெரும் பட்டணங்களுக்குரிய வசதியைச் செய்யவும் வெளியிடங்களுக்கான வசதிகளைச் செய்து கொடுக்கவும்தான் செலவழிக்கப்படுமென்று வரவுசெலவுத் திட்டம் கூறுகிறது.

கொழும்பிலேயிருக்கின்ற ஒருவர் பதுளை யிலே இருக்கும் ஒருவருடனே காலியிலே இருக்கும் ஒருவருடனே நேரடியாகத் தொலைபேசி மூலம் பேசுவதை நான் வெறுக்க

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வில்லை. ஆனால், கொழும்பிலே இருப்பவர்களுக்கு இத்தகைய வசதிகளைக் கொடுப்பதற்கு முன் இத்தகைய வசதிகள் எதுவும் இல்லாமல் 15, 20 மைல் தூரம் நடந்து சென்று தந்தி அனுப்ப வேண்டிய நிலையிலிருக்கும் கிராம வாசிகளுக்கும் கடற்கரையோரங்களில் வாழ்பவர்களுக்கும் குடியேற்றத் திட்டங்களில் வதிபவர்களுக்கும் வேண்டிய வசதிகளைச் செய்து கொடுக்கவேண்டும். கிராமப்புற மக்கள் படும் இன்னல்கள் ஒரு வேளை பட்டணப் பகுதிகளுக்குப் பிரதிநிதித்துவம் வகிக்கும் அங்கத்தவர்களுக்குத் தெரியாமல் இருக்கலாம்; நன்கு முன்னேற்றம் அடைந்த தொகுதியிலேயுள்ளவர்களுக்கும் தெரியாமல் இருக்கலாம். எனக்குத் தெரிந்த வரையிலே வடக்கிலும் தெற்கிலும் முன்னேற்றத்தில் மிகவும் பின்தங்கியிருக்கும் கிராமப்புற மக்கள் தந்தி வசதி இல்லாமல், தபால்களை விடுவிடாகப் பெறும் வசதி இல்லாமல் மிகவும் இடர்ப்பட்டுக் கொண்டிருக்கிறார்கள்.

என்னுடைய தொகுதியிலே பல்லவராயன் கட்டு என்ற கிராமசபை ஒன்று இருக்கிறது. அந்தக் கிராமசபையின் முழுப் பகுதியிலும் தந்தி அனுப்ப முடியாது. அந்தக் கிராம சபை எல்லைக்குள் இருப்பவர்கள் தந்தி அனுப்புவதனால் 18, 20 மைல் தூரம் நடந்து போக வேண்டும். அவர்கள் பஸ் வண்டிக்குக் காத்திருந்து அது கிடைக்காமல் திரும்பிப் போகவும் வேண்டிய நிலையும் ஏற்படலாம். 1968 ஆம் ஆண்டிற்கூட இப்படிப்பட்ட ஒரு நிலை இலங்கையிலே இருக்கும் என்றால், அதுவும் கொழும்பிலுள்ளவர்கள் பதுளையிலுள்ளவர்களோடு நேரடியாகப் பேசக்கூடிய வாய்ப்புக்களைச் செய்து கொடுக்கும் சூழ்நிலை இருக்கும் நேரத்தில் இருக்கும் என்றால் அதைச் சமுதாய நீதி என்று சொல்ல முடியாது. ஆகையால், சாதாரண ஏழை மக்களுக்கு வேறு வசதி இல்லாமல் கிராமங்களில் இருக்கும் மக்களுக்கு இத்தகைய வசதிகளைச் செய்து கொடுக்க அரசாங்கம் முன்வர வேண்டும். இதற்காக வெளிநாட்டுப் பண உதவி கிடைத்தால் அதையும் பயன்படுத்துங்கள் என்று கூறுகிறேன். அப்படி வெளிநாட்டுப் பண உதவி வருகிறது. இங்கே Greater Colombo Area என்று சொல்லப்படுகின்ற பெரிய கொழும்புப் பகுதிக்குத் தொலைத் தொடர்பு வசதி செய்து கொடுப்பதற்கு 5 கோடியே 75 இலட்சம் ரூபாவை அரசாங்கம் செலவு செய்கிறது. இதற்கு வெளி நாட்டிலிருந்து கடனாக 3 கோடியே 66 இலட்சம் ரூபா கிடைக்கிறது. இந்நாட்டுப் பணம் இரண்டு கோடி ரூபாதான் இதற்காகச் செலவிடப்படுகின்றது. அதில் ஒரு கோடி ரூபாவை ஏழை மக்களுக்கு தொலைத் தொடர்பு வசதி செய்துகொடுப்பதற்கும் தபால்களை வீடுவீடாகக் கொண்டு சென்று கொடுப்பதற்கும் செலவு செய்தால் அவர்களுக்கும் இந்த நாட்டில் சம வாழ்வைப் பெறும் வாய்ப்பைக் கொடுப்பதாக இருக்கும்.

கௌரவ உப சபாநாயகரவர்களே, கௌரவ அமைச்சரவர்கள் என்னுடைய தொகுதிக்கு 1967 ஆம் ஆண்டு செப்டம்பர் மாதம் வருகை தந்தார்கள். அப்பொழுது அவருக்கு தர்மபுரத்தில் வரவேற்பு ஒன்று அளித்தோம். அதிற் கலந்து கொண்ட மக்கள் அவரிடம் ஒரேயொரு வேண்டுகோளை விடுத்தார்கள்: "எங்களுடைய உப தபால் நிலையத்தில் வீடு வீடாகத் தபால் கொடுக்க வசதி இல்லை. அந்த வசதியைச் செய்து தர வேண்டும்" என்று கேட்டார்கள். நிச்சயமாக அதைச் செய்து கொடுக்கிறேன். அடுத்த நிதி ஆண்டு தொடக்கம்—ஐப்பசி தொடக்கம்—அதைச் செய்து தருகிறேன் என்று அமைச்சர் அவர்கள் கூறினார்கள். ஆனால் ஒரு வருடம் முடிந்து விட்டது. தபால் கொடுப்பதற்கு தபால் ஊழியர்கள் ஒருவரும் நிய

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉරත් තිනම් මයා.]

மிக்கப்படாததால் மக்கள் தத்தளித்துக் கொண்டிருக்கிறார்கள். இது போலவே, கிராஞ்சி குடியேற்றத் திட்டத்திலே வாழும் மக்களும் தபால் பெற முடியாமல் ஒவ்வொரு நாளும் முறையிட்டுச் சலிப்படைந்து விட்டார்கள். அப்படித்தான் வவுனிக்குளத் திட்டத்திலும். அதிலுள்ள மக்கள் இன்னும் அரசாங்கம் எங்களுக்கு தபால் கொடுப்பதற்கு வசதி செய்யாவிட்டால் நாங்களே ஒருவரை நியமித்து தபால்களைக் கொடுக்கிறோம் என்கிறார்கள்.

குடியேற்றதிட்ட மக்கள் உணவு உற்பத்தியில் ஈடுபட்டிருக்கிறார்கள். அவர்கள் ஒவ்வொருநாளும் உப தபாற்கந்தோருக்குப் போய் தங்களுக்குத் தபால் வந்ததா என்று கேட்டுக் கொண்டிருக்க முடியாது. இவர்கள் அரசாங்கத்தைக் கேட்டுக் கேட்டு அலுத்து விட்டார்கள். மன்னார்த் தொகுதியிலும் இந்தக் குடியேற்றத் திட்டத்துக்குரிய ஒரு உப தபால் நிலையம் இருக்கிறது. அதற்கு வேண்டிய மதிப்பீடுகள் எல்லாம் இரண்டு மூன்று ஆண்டுகளுக்கு முன்னரே செய்யப்பட்டுவிட்டன. ஆனல், இன்னும் ஒரு தபால் ஊழியர் நியமிக்கப்படவில்லை . அரசாங்கத்தைக் கேட்டுக் கேட்டு அலுத்துப் போனபடியால்தான் அக்குடியேற்றத் திட்ட மக்கள் தாங்களே பணம் சேர்த்து தபால் ஊழியர் ஒருவரை நியமித்துக் கொள்கிறோம் என்று அரசாங்கத்தைக் கேட்கிற அளவுக்கு வந்து விட்டார்கள். இதை ஓர் உதாரணத்துக்காகக் குறிப்பிட்டேன்.

எனவே, கிராமப் புறங்களிலே, கடற்கரையை அடுத்துள்ள இடங்களிலே, குடியேற்றத் திட்டங்களிலே வாழ்கின்ற மக்களுக்கு வேண்டிய தொலைத் தொடர்பு வசதிகளைக் கொடுக்க வேண்டும். இந்த வசதிகளைச் செய்ய நாட்டின் பணத்தை அரசாங்கம் முதலில் செலவு செய்ய வேண்டும். விதிகள் அமைப்பதற்காக வெளிநாடுகளிலிருந்து பணம் கிடைக்கப் போவதாக அமைச்சர் அவர்கள் சொன்னார்கள். ஆகவே, பணம் இல்லாவிட்டாலும் கூட, வேண்டிய பணத்தை வெளிநாடுகளிலிருந்து பெற்று, பல ஆண்டுகளாக அடிப்படைத் தேவைகள் கிடைக்கப்பெருமல் மூலை முடுக்குகளில் வாழும் மக்களுக்கு வேண்டியனவற்றைச் செய்து கொடுக்கவேண்டுமென்றும் இதற்கான ஒரு திட்டத்தை அமைச்சர் அவர்கள் அமைக்கவேண்டுமென்றும் கேட்டு எனது உரையை முடித்துக்கொள்கிறேன்.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 4.30 P. M. On resumption, the Hon. Deputy Chairman of Committees will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 4.30 ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමාගේ [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] ප්‍රධානත්වයෙන් නැවත පවත්වන ලදී.**

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று. குழு உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.

*Sitting accordingly suspended till 4.30 P.M., and then resumed.* [MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *in the Chair.*

**එස්. බී. හේරත් මයා.** (හිරියාල)

*(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)*

(Mr. S. B. Herath—Hiriyala)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා සම්ර කරනවා. විශේෂයෙන්ම දුෂ්කර ප්‍රදේශවලට සිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලුම තැපැල් සේවා පහසුකම් සලස්වා දිය යුතුයි. හිරියාල දුෂ්කර ප්‍රදේශයක්. ගමන් පහසුකම් නැති, තැපැල් පහසුකම් නැති, ටෙලිපෝන් පහසුකම් නැති දුෂ්කර ප්‍රදේශවල රාජකාරි කටයුතු හරියාකාර ලෙස කරගෙන යන්නට බැහැ. හැතැප්ම තිහක්, හතළිහක් දික් වූ හිරියාල වැනි දුෂ්කර ප්‍රදේශවලට තැපැල් පහසුකම් හා ටෙලිපෝන් පහසුකම් නොඅඩුව ලබා දුන්නොත් ඒවායේ කටයුතු සතුටුදායක අන්දමින් කරන්නට පුළුවන් වෙනවා. ටවුමක සාදන එක ගොඩනැගිල්ලකට වියදම් කරන මුදල් ප්‍රමාණය දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇති මන්ත්‍රී කොට්ඨාශ දහයකට පහළොවකට වියදම් කළත් ඒ කොට්ඨාශවලට සතුටුදායක අන්දමින් තැපැල් හා ටෙලිපෝන් පහසුකම් ලබා දෙන්නට පුළුවනි. ඒ නිසා දුෂ්කර ප්‍රදේශවල දියුණුව සලකා ඒ දුෂ්කර ප්‍රදේශවල ලියුම් බෙදීමේ පහසුකම් හා දුර කථන පහසුකම් නැති සියලුම තැපැල් කාර්යාලවලට සහ උප තැපැල් කාර්යාලවලට ඒ පහසුකම් ලබා දීමට ක්‍රියා කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. [බාධාකිරීමක්] ඇමතිතුමා මේ අවස්ථාවේදී මේ ස්ථානයේ නැතත් එතුමා හැන්සාඩ් වාර්තාව කියවා මේ කටයුතු කර දෙතැයි අප විශ්වාස කරනවා. හිරියාල, යාපහුව වැනි ලංකාවේ දුෂ්කර ප්‍රදේශවල තැපැල් කාර්යාලයන්හි තිබෙන සියලුම අඩුපාඩු සපුරාලන ලෙස මා නැවත වරක් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

අ. භා. 4.33

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

**(Mr. Tudawe)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා (කා. පො. ඉරත්තිනම් මයා.) විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අපට පිළිගන්නට අමාරුයි. අපේ ප්‍රදේශවලත් උප තැපැල් කාර්යාලවල නොයෙකුත් අඩුපාඩුකම් තිබෙනවා. එහෙත් මේ යෝජනාවෙන් කියන්නේ තැපැල් කාර්යාලවල සහ උප තැපැල් කාර්යාලවල තිබෙන අඩුපාඩුකම් සකස් කර දෙන තුරු මෙරට මුදල් තැපැල් සහ විදුලි සංදේශ සේවයේ වෙනත් කිසිම කටයුත්තකට මුදල් නොදිය යුතු බවයි. එසේ හෙයින් මෙම යෝජනාව අනුමත කරන්නට බැරි බව කියන්නට සිදු වී තිබෙනවා. කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා කී දේවල් අප පිළිගන්නවා. යම් යම් තැපැල් කාර්යාලවල පහසුකම් නැති එක ඇත්තයි. ඉතින් ඒ නැති පහසුකම් ඇති කර දෙන ලෙස ඉල්ලනවා වෙනුවට ඒ පහසුකම් සකස් කර දෙන තුරු මෙරට මුදල් වෙනත් කටයුත්තකට යොදවන්නට එපා යයි කීම නම් අපට පිළිගන්නට බැහැ.

**නීල් ද අල්විස් මයා.**

*(திரு. நீல் டி அல்விஸ்)*

**(Mr. Neal de Alwis)**

තැපැල් පහසුකම් සැලසීමේදී විරුද්ධ පාර්ශ්වයටත් ආණ්ඩු පක්ෂයටත් සම සමව සලකන බව මේ ගරු ඇමතිතුමා මෙම ගරු සභාවෙහිදී මීට පෙර ප්‍රකාශ කර තිබෙනවා. 1966 අවුරුද්දේදී එතුමා දිස්ත්‍රික් ඒකාබද්ධ කොමිටිවලට පෝස්ට් මාස්ටර් ජනරාල්තුමාත් ගෙන්වාගෙන යම් යම් ප්‍රදේශවලට තැපැල් කන්තෝරු දීම සඳහා ලැයිස්තුවක් පිළියෙළ කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නිල් ද අල්විස් මයා.]

එහෙත් ඒවා ලැබුණේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආසනවලට පමණක් බව මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. මහජනතාවට නොයෙක් විධියේ පොරොන්දු මේ ආණ්ඩුව විසින් දී ඇතත් අද මහජනයා මේ ආණ්ඩුව හඳුනාගෙන සිටින්නේ පොරොන්දු ඉටු නොකරන ආණ්ඩුවක් හැටියටයි. මගේ කොට්ඨාශයේ කරදේවෙල උප තැපැල් කාර්යාලයට ටැලිපෝන් එකක් ලබා දෙන බවට 1966 අවුරුද්දේදී ගරු ඇමතිතුමා මට පොරොන්දුවක් දුන්නා. උප ඇමතිතුමාගෙන් මට ඒ පිළිබඳව ලියුමකුත් ලැබුණා. 1967/68 අවුරුද්දේදී ටැලිපෝනයක් දීමට තීරණය කර තිබෙන බව එහි කියා තිබෙනවා. එහෙත් එය ඉෂ්ට වුණේ නැහැ. එම නිසා මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ පොරොන්දුවලින්වත් ලියුම්වලින්වත් වැඩක් වන්නේ නැහැ. තැපැල් ඇමතිතුමා මට දුන් ඒ පොරොන්දුව අදත් ඉටු වී නැති බව, එතුමා දැන් මෙහි නැති නිසා මෙම ගරු සභාව මාර්ගයෙන් මා එතුමාට දැනුම් දෙන්නට ඕනෑ. වචනයෙන් පමණක් නොව ලියුම්වලින් පවා මහජනයාටත් මන්ත්‍රීවරුන්ටත් මේ විධියේ බොරු පොරොන්දු දී මන්ත්‍රීවරුනුත් මහජනතාවත් මුලා කරන, රවටන මෙවැනි ආණ්ඩුවක් කෙරෙහි මහජනයා තව දුරටත් විශ්වාසය නොතබන බව මා ප්‍රකාශ කරන්නට කැමැතියි.

අපගේ කාලය ගත කරන්නේ මහජන වැඩ සඳහායි. මේ විධියට ආණ්ඩුව බොරු පොරොන්දු දෙන විට අප ඒ වැඩ කරන්නේ කොහොමද? ඇමතිවරුන්ටත් උප ඇමතිවරුන්ටත් කාර් තිබෙනවා. සමහර ඇමතිවරුන් මේ කාලය තුළ කාර් තුන හතර පාවිච්චි කර තිබෙන බව අප දන්නවා. එහෙත් මහජන වැඩ සඳහා අපට කාර් ලබා ගන්නට බැහැ. ඇමතිවරුන්ගේ අඹුදරුවන්ට පවා කාර් ලබා ගන්නට පුළුවනි. පසුගිය ආණ්ඩුවේ මැති ඇමතිවරුන් කාර් පාවිච්චි කිරීම ගැන මේ උදවිය චෝදනා කළා. එහෙත් මේ අය දැන් කාර් තුන හතර පාවිච්චි කරනවා. අපට කිසිම පහසුකමක් සලසා දෙන්නේ නැහැ. බොරු පොරොන්දු දෙමින් මේ ආණ්ඩුව අප මුළා කරනවා. එම නිසා මේ විධියේ යෝජනා ඉදිරිපත් කිරීමෙන් කිසිම වැඩක් වන්නේ නැහැ. අද මේ ආණ්ඩුව කියන්නේ පට්ටපල් බොරු. මගේ ආසනයේ උප තැපැල් කාර්යාලයට ටැලිපෝන් ලබා දෙනවායයි පොරොන්දු වූ නමුත් අද වන තුරුත් එය ඉෂ්ට කර නැහැ. ඒ පිළිබඳ ලියුම් රාශියක් මා ළඟ තිබෙනවා. කොපමණ ලියුම් තිබුණත් ඒ ටැලිපෝන් සේවය ලබා දීමට මුදල් වෙන් කර නැත්නම් ඒ ලියුම්වලින් ඇති ප්‍රයෝජනය මොකක්ද? අද මේ ආණ්ඩුව මහජනයා රැවටීමේ වැඩ පිළිවෙළක් ගෙන යන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 4.40

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු සභාපතිතුමනි, තැපැල් කාර්යාලවලට දුරකථන හා ලියුම් බෙදීමේ පහසුකම් පිළිබඳව කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා (ඉරත්තිනම් මයා.) විසින් ඉදිරිපත් කර තිබෙන යෝජනාව ටිකක් හිත් අමාරුවකින් ඉදිරිපත් කළ යෝජනාවකැයි අපට කල්පනා කරන්නට පුළුවනි. හිත් අමාරුසහගත යෝජනා ඉදිරිපත් කිරීම ගැන සාමාන්‍යයෙන් විරුද්ධ වුවත් එතුමා ඉදිරිපත් කළ මේ යෝජනාවේ නම් සාධාරණත්වයකුත් තිබෙන බව අපට පෙනෙනවා. මා සඳහන් කළ ඒ සාධාරණ තත්ත්වය මොකක්දැයි ලුහුඬින් පැහැදිලි කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මීට අවුරුදු සියයකට විතර ඉස්සර වෙලා ලංකාවේ එක්තරා කොටසකට පමණයි ටෙලිපෝන් පහසුකම් ලැබුණේ. සංඛ්‍යාවෙන් ඊට වැඩි පිරිසක් ඇතත්, ලියුම් බෙදීම කරන ලද්දේ ඒ වාගේම එක්තරා පිරිසකට ප්‍රයෝජනය ලැබෙන ආකාරයට පමණයි. තමන්ගේ නමින් එවන ලද ලියමනක් පවා ලබා ගැනීම සම්බන්ධයෙන් තිබුණේ එවැනි තත්ත්වයක් බව තමුන්නාන්සේ දන්නවා. මීට අවුරුදු සියයකට පමණ පෙර ටෙලිපෝන් සේවයේත්, ලියුම් බෙදීමේ සේවයේත් ප්‍රයෝජනය ලැබුණේ එක්තරා පිරිසකට පමණයි. ක්‍රම ක්‍රමයෙන් පසුගිය කාලයේ ඒ පිරිස් සංඛ්‍යාව වැඩි වී තිබෙන බව අපට පිළිගන්නට පුළුවනි. අවුරුදු සියයක් තරම ගත වී ඇතත් තවම ඇතැම් ජනයාට තමන්ගේ නාමට තැපැල් කර එවන ලියුම් ලැබෙන්නේ නැහැ, පහසු අන්දමකට. ටෙලිපෝනයෙන් පණිවුඩයක් යවන්නට වුවමනාවක් ඇති වුණොත් අදත් ඇතැම් අයට හැතැප්ම පණහක් හැටක් යන්නට සිදු වෙනවා. එවැනි මහන්සියක් දැරීමෙන් පසුව වුවත් ඇතැම් අයට ටෙලිපෝන් පණිවුඩයක් ලබාගන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. අන්න එවැනි තත්ත්වයක් නිසා ඇති වූ හිත් වේදනාවක් උඩ ඉදිරිපත් කළ යෝජනාවක් හැටියටයි මේය මට පෙනෙන්නේ. එක් පැත්තකට යම් දෙයක් නැත්නම් ඇයි අනෙක් පැත්තට එය තිබෙන්නේ ? එක්තරා කණ්ඩායමක් ප්‍රයෝජනය ගන්නා අතර තවත් කණ්ඩායමකට ප්‍රයෝජනයක් ගන්නට ඉඩක් නැත්තේ ඇයි? ඇයි අපට මේ වාගේ සේවයක් නැත්තේ ? ඒ නිසා එක්තරා සාධාරණ හැඟීමක් උඩයි මේ ඉල්ලීම අඩංගු යෝජනාවක් ඉදිරිපත් කරන්නට ඇත්තේ. අනෙක් වැඩ සම්පූර්ණයෙන්ම අත් හැර දමා වුවත් මෙය කරන ලෙස ඉල්ලා සිටින්නේ ඒ නිසා විය හැකියි. කොයි තරම් කීවත් හැමදාම සිංවන්නේ ප්‍රයෝජනයක් ලැබෙන උදවියටම ප්‍රයෝජනය ලැබෙන අතර එසේ නැති උදවියට හැමදාම ප්‍රයෝජනයක් නොලැබෙන තත්ත්වයක සිටින්නට සිදු වීමයි.

අපේ ගම්බද ඇතැම් ප්‍රදේශවල තවමත් ලියුම් බෙදා දීමක් නම් කෙරෙන්නේ නැහැ. තමන්ගේ නමට ලැබුණු ලියමනක් වුවත් ලබාගැනීමට එක්කෝ හැතැප්ම දහය දොළහ මග ගෙවා තැපැල් කන්තෝරුවට යන්නට ඕනෑ. තවත් සමහර තැන්වල මිනිසුන්ට ලැබෙන ලියුම් කඩයක් භාරයේ එවන්ට සිදු වී තිබෙනවා. කඩේට ඇවිත් තමයි ලියුම් ලබා ගන්නට සිදු වන්නේ. ඒ බව තමුන්නාන්සේත් දන්නවා. ගම්බද ජනතාවට ටෙලිපෝන් පණිවුඩයක් ගැන වුවත්, ලියමනක් ලබා ගැනීම පිළිබඳව වුවත් ලොකු කරදරයක් විඳින්නට සිදු වෙනවා. මෙය නැවත නැවතත් මතක් කරන්නට සිදු වීම කනගාටුදායක දෙයක් නිසා හැම දෙනාටම සාධාරණය ඉටු වන ආකාරයේ විධිමත් වැඩ පිළිවෙළක් ඇතිකළ යුතුයි. මේ සම්බන්ධයෙන් වැඩි දියුණුවක් ඇති කරනවා නම් හොඳයි.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) ප්‍රකාශ කළ අන්දමට වැඩ සටහන් නම් අපටත් එවා තිබෙනවා. අපේ ආසනයේ වැඩ සටහන් ඇති කරනවායයි දන්වා තිබෙනවා. අසූවල් අවුරුද්දේදී අසූවල් තැන තැපැල් කන්තෝරුවක් විවෘත කරනවාය කියනවා. පස් අවුරුදු වැඩ පිළිවෙළක් අනුව වැඩ කරන්නට බලාපොරොත්තු වන ආකාරය දක්වෙන කොපි එවා තිබෙනවා. එහෙත් දැනටමත් ඔය පස් අවුරුද්දෙන් අවුරුදු තුනහමාරක් ගත වෙලා තමයි තියෙන්නේ. වැඩ නම් එකක්වත් සිද්ධ වෙලා නැහැ. ඒ වැඩ සටහන්වලට අනුව නියමිත දිනවලදී එකම අළුත් තැපැල් කන්තෝරුවක්වත් විවෘත වුණේ නැහැ ; එකම ටෙලිෆෝන් කම්බියක්වත් ඇදුණේ නැහැ ; ලියුම් බෙදන ගම් එකක්වත් වැඩි වුණේ නැහැ. අළුතින් ලියුම් බෙදෙන, ටෙලිෆෝන් පහසුකම් ලැබෙන, තැපැල් කන්තෝරු විවෘත වන ගම් එකක් බැගින්වත් අවුරුදුපතා වැඩි වෙනවා නම් අපට ඉවසන්නට පුළුවනි. එහෙත් ඒ විධියට කටයුතු නොකෙරෙන නිසා කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා නොඉවසිල්ලෙන් මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන බව කියන්නට පුළුවනි. සමහර කොට්ඨාශවල අයට එවැනි පහසුකම් ලැබෙද්දී අනෙක් අය ඒවා නොලැබ පීඩා විඳීම අසාධාරණයි. යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා නම් එය කාටත් සාධාරණව ක්‍රියාත්මක වන්නට ඕනෑ. එහෙත් අද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. තෙන්නකෝන් මයා.]
එවැනි සාධාරණත්වයකින් කටයුතු නො කෙරෙන නිසා, මේ යෝජනාව එක්තරා විධියක සාධාරණ එකක් බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 4.44

**වී. ඒ. අලගකෝන් මයා.** (මන්නාරම)
*(திரு. வீ. ஏ. அழகக்கோன்—மன்னூர்)*
(Mr. V. A. Alegacone—Mannar)

கௌரவ உப அக்கிராசனர் அவர்களே, கிளிநொச்சிப் பாராளுமன்ற அங்கத்தவர் (திரு. கா. பொ. இரத்தினம்) கொண்டுவந்துள்ள இந்தப் பிரேரணையை நான் முழு மனதுடன் ஆதரிக்கின்றேன். ஏனெனில், வடக்கு, கிழக்கு, தெற்கு, மேற்கு என்ற பாகுபாடில்லாமல் எல்லாப் பகுதிகளினதும் எல்லா இனத்தவர்களினதும் குறைகளைத் தீர்ப்பதற்காகத்தான் அவர் இந்தப் பிரேரணையைக் கொண்டு வந்துள்ளார்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගම්බද මංමාවත් තැනීමට විශාල මුදලක් වැය කිරීමට සිදු වෙනවා. අවුරුදුපතා ශ්‍රමදාන ව්‍යාපාර මගින් රුපියල් ලක්ෂ ගණනක් වැය කළ යුතු වැඩ කටයුතු කරනවා. එසේ වුණත් රජයේ සහයෝගය නැතුව ශ්‍රමදාන ව්‍යාපාර මගින්ම මේ කටයුතු කරන්න බැහැ. රජයේ කිසිම මෙහෙයවීමක් නැතුව පිටිගල ප්‍රදේශයේ ශ්‍රමදාන කඳවුරක් ආරම්භ කර එමගින් ප්‍රදේශයේ පාරවල් මංමාවත් සකස් කර ගෙන යනවා. එසේ වුණත් රජයේ සහයෝගය නැතුව ශ්‍රමදාන ව්‍යාපාර මගින් පමණක් මේවා කර ගෙන යාමට පුළුවන්කමක් නැහැ. මන්ත්‍රීවරයා මොන පක්ෂයකට අයත් වුණත් මොන මතයක් දැරුවත් සේවය කරන්නේ මේ රටේ ජනතාවට බව කල්පනා කරන්න ඕනෑ. එම නිසා, ප්‍රදේශයේ ජනතාව ගැන කල්පනා කර බලා අවශ්‍ය මංමාවත් පහසුකම් සැලසීමට ඇමතිවරයා පියවර නොගත්තොත් මේ රටේ ඉදිරිගමන කිසි ලෙසකින්වත් සාර්ථක වන්නේ නැති බව මතක් කරන්න ඕනෑ. පළිගැනීමේ චේතනාවෙන් ක්‍රියා කළොත් එයින් පහර වදින්නේ පොදුවේ මේ රටේ අසරණ ජනතාවට බව මතක් කරන අතරම පසුගිය අතුරු මැතිවරණයේදී ප්‍රදේශයේ ජනතාවට දුන් පොරොන්දු—විශේෂයෙන්ම ඇමතිතුමා එම ප්‍රදේශයට ගොස් ජනතාවට දුන් පොරොන්දු—ඉටු කිරීමට මේ වන තෙක් කිසිවක් කර නොතිබීම කනගාටුවට කරුණක් බව මතක් කර දෙන්න සිදු වී තිබෙනවා.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමාත් ඒ ප්‍රදේශයට ගිය නිසා දකින්න ඇතුව ඇති, එම ප්‍රදේශයේ මංමාවත් කොයි විදියේ තත්ත්වයකින්ද පවතින්නේ කියන කාරණය. තමුන්නාන්සේත් නොයෙකුත් පොරොන්දු ඒ අවස්ථාවේදී දුන්නා, නමුත් එයින් එකක්වත් අද වනතුරු ඉටු වී නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගමනාගමන පහසුකම් සැලසීම මේ රටේ ඉදිරි ගමනට, ජාතික සංවර්ධනයට බලපාන ඉතාමත්ම වැදගත් අංගයක් හැටියට මෙය පෙන්වාදෙන්න පුළුවනි. මංමාවත් නොමැති නම් ලැබෙන අස්වැන්න වෙළඳ පළට ගෙන යන්න පුළුවන්කමක් නැහැ. සැතපුම් හත අටක්, ඌරන් වගේ කුදලා ගෙන රෝගීන් රෝහල් කරා ගෙන යන්න ඒ ප්‍රදේශයේ ජනතාවට සිදු වී තිබෙනවා නම්, කොහොමද සංවර්ධනයක් ඇති වෙන්නෙ ? රජයේ වැඩ දෙපාර්තමේන්තුව වැඩ කරනවාය කියා මා කියන්නේ නැහැ. නමුත් අපේ ප්‍රදේශවලට නම් කර ඇති වැඩක් නැහැ. මෙහිදී ගරු පළාත් පාලන ඇමතිතුමා ගැනත් සඳහන් කරන්න කැම තියි. එතුමා, ඉදිරිපත් කරන වැදගත් යෝජනා ක්‍රියාත්මක කිරීමට ලොකු කැමැත්තක් දක්වනවා. ලබන 27 වනදා අපේ ප්‍රදේශයට එතුමා පැමිණෙන්න අද හස් කර ගෙන සිටින නිසා, එතුමා මගින් අපේ පළාතට කරවා ගන්නට බලාපොරොත්තු වන විශාල වැඩ පිළිවෙළක් සකස් කර එතුමාට ඉදිරිපත් කිරීමට අප සූදානමෙන් සිටිනවා. මා අදහස් කරනවා, එසේ ඉදිරිපත් කරන යෝජනා ක්‍රියාත්මක කරන්න එතුමා බලාපොරොත්තු වෙනවාය කියා. ඉටු කරනවායයි පොරොන්දු වෙන වාට වඩා එසේ ඉදිරිපත් කරන යෝජනා ක්‍රියාත්මක කිරීමට එතුමා පියවර ගනීවියයි මා විශ්වාස කරනවා. එසේ කියන්නේ, රජයේ වැඩ පිළිබඳ ඇමතිතුමාට වඩා දැනට දක්ෂ අන්දමින් එතුමා වැඩ කර ගෙන යන නිසයි. අපි මෙසේ සෙල්ලමෙන් හිනා වෙන් කතා කළාට මොකද ගම්බද ප්‍රදේශ වල දුප්පත් ජනතාව විඳින දුක් කරදර සිහිවන විට මේ හිනාව කොහෙන් කෙළවර වෙනවාදැයි කියන්නට බැරි තරමයි. ගම්බද ජනතාව විඳින දුක් කරදර මතක් වන විට අප සිත්වල ඇති වන වේදනාව කොතෙක්දැයි කියන්නට අමාරුයි. අපේ ඇමතිවරුන්ගේ නොසැළකිල්ල නිසා මෙම තත්ත්වය ඇති වී තිබෙන බව කියන්නට ඕනෑ. සමහර විට මීට කලින් පැවති ආණ්ඩුවේ ඇතැම් ඇමතිවරුන් ගැන පවා මා මේ වාගේම තදින් කතා කර තිබෙනවා. ඒ උදවියගේ දුර්වලකම්වලට පවා තදින් පහර දුන් අවස්ථා මට මතකයි.

මේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනාව ඉතා කාලෝචිතයි. මෙම රජයට මේ වැඩ පිළිවෙළ එක පාරටම සාර්ථක කරන්නට පුළුවන්කමක් නැති බව අප දන්නවා. එහෙත් මෙය හොඳ වැඩ පිළිවෙළක් බව කිව යුතුයි. අවුරුදු ගණනාවක් තිස්සේ ඉමහත් දුෂ්කරතාව යනට මුහුණ දී සිටින බව එතුමාගේ යෝජනාවේ ඇතුළත් වී තිබෙනවා. මා කියන්නේ ගත වර්ෂ ගණනාවක් තිස්සේ එහා මෙහා යන්නට පහසුකම් නැති කමින් අපේ ගම්බද ජනතාව දුක් විඳින බවයි. ඌරගහ ප්‍රදේශය, රංතොටුවිල ප්‍රදේශය වැනි ප්‍රදේශවල මහජනතාවගේ සැප සුව පිණිස, ඒ උදවියගේ ඉදිරි ගමන සාර්ථක කර දීම පිණිස මෙම කට යුත්ත සාර්ථක කර දෙන ලෙසයි මා කියා සිටින්නේ. ගංවතුරෙන් වැස්සෙන් එහෙම හානි වූ පාරවල් විශාල ගණනක් තිබෙනවා. එම පාරවල් ගැන තමුන්නාන්සේගේ විශෙෂ බැල්ම හෙලන්නැයි ඉල්ලා සිටිමින් මගේ කතාව අවසාන කරනවා.

අ. භා. 5.55

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා (ඉරත්තිනම් මයා.) ඉදිරිපත් කර තිබෙන්නේ මුළු ලංකාව තුළම පිහිටි පාරවල් වැඩි දියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්නැයි කියන යෝජනාවක් බව පෙනෙනවා. අවශ්‍ය මාර්ග පහසුකම් නොමැතිකම නිසා අවුරුදු ගණනාවක් තිස්සේ ඉමහත් දුෂ්කරතාවයන් මැද ජීවත් වන මහජනතාවට ගමනාගමන පහසුව ඇති කරන්නය කියන එකයි එම යෝජනාවෙහි හරය වන්නේ. මෙය ඉතා වැදගත් යෝජනාවක්. ලංකාවේ තිබෙන පාරවලින් කොටසක් රජයේ වැඩ ඇමතිතුමාටත්, අනික් කොටස පළාත් පාලන ඇමතිතුමාටත් භාර වී තිබෙනවා. පාරවල් පිළිබඳව වග කිවයුතු ඒ ඇමතිවරු දෙදෙනා දන් කිච්චුවෙන් වාඩි වී සිටින බව පෙනෙනවා. ඒ දෙපොළ පාරවල් ගැන කතා කරනවා නම් බොහොම හොඳයි. මේ ඇමතිවරුන් දෙපොළගේ ම අන්‍යෝන්‍ය සම්බන්ධතාවළු ඇතුවයි අපේ


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

රටේ පාරවල් වැඩි දියුණු කළයුතු වන්නේ. ඒ දෙපොළ දූත් වාගේම මිත්‍ර ලීලා වෙන් සාකච්ඡා පවත්වා මේ රටේ පාරවල් පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කළයුතුව තිබෙනවා. පාර්ලිමේන්තුව තුළදී මෙන්ම ඉන් පිටස්තරදීත් මේ ගැන හැඟීමක් ඇතුව ක්‍රියා කරන්නට ඕනෑ. අපේ පළාත් පාලන ඇමතිතුමා වාගේම රජයේ වැඩ පිළිබඳ ඇමතිතුමාත් ගම්බද ප්‍රදේශවලට ගොස් මහජන නියෝජිතයන්, පළාත් පාලන ආයතනවල නියෝජිතයන් යනාදී උදවිය සමග සාකච්ඡා පවත්වා මේ වැඩ කටයුතු සාර්ථක ලෙස කරන්නට කල් පනා කරනවා නම් බොහෝ දුරට මෙම යෝජනා ක්‍රියාත්මක වන බව කිව යුතුයි.

ගම්සභා යටතේ යි අද බොහෝ පාරවල් පාලනය වන්නේ. ඇතැම් පාරවල් නඩත්තු කර ගන්න ගම්සභාවලට ශක්ති යක් නැහැ. ඒවායේ ආදායම අඩු නිසායි එසේ වන්නේ. එසේ හෙයින් බොහෝ අවස්ථාවලදී ගම්සභාවලින් කියා සිටිනවා, රජයේ වැඩ අමාත්‍යාංශයට මෙම පාරවල් භාරගෙන වැඩිදියුණු කරන ලෙස. අද පාරවල් 3,000 ක් පමණම රජයේ වැඩ අමාත්‍යාංශයට භාරගෙන වැඩි දියුණු කරන් නැයි ඉල්ලා සිටින බව පෙනෙනවා. එහෙත් ඒ ඉල්ලීම ක්‍රියාත්මක වී නැහැ. එසේ හෙයින් ගම්සභාවලට වියදම් කර වැඩිදියුණු කරන්නට නොහැකි පාරවල් සම්බන්ධයෙන් රජයේ වැඩ අමාත්‍යාංශය සැලකිල්ලක් දක්වන්නට ඕනෑ. මෙම ප්‍රශ්න විසඳීම සඳහා මේ කියන අමාත්‍යාංශ දෙක එක්සත් වී වැඩ පිළිවෙළක් ගෙන යන්නට ඕනෑ. නගරබද පාරවල තත්ත් වය හොඳ වුවත් ඈත පිටිසර පාරවල තත්ත්වය ඉතා අසතුටුදායකයි. වරක් මා රජයේ වැඩ දෙපාර්තමේන්තුව භාර ඇමති තුමාට පාරක් ගැන කිව්වා. ඒ අවස්ථාවේ දී මා ඉදිරිපත් කළ ප්‍රශ්නය විසඳනවාය කියා එතුමා පොරොන්දු වුණා. ඒ පොරොන්දුව ඉෂ්ට කර තිබෙනවා. තවත් ඒ පාරේ සැතපුම් දෙකක් තිබෙනවා. කරුණා කර කෙසේ හෝ ඒ සැතපුම් දෙකත් හරි ගස්සා දෙන්න. මා එවැනි ඉල්ලීමක් කරන්නේ මේ නිසයි. විශේෂ යෙන්ම ඒ ප්‍රදේශයේ ජීවත් වන්නේ ගොවි ජනතාවයි.



**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

සැලැස්මක් ඇති කර තිබෙනවා. පළාත් පාලන ඇමතිතුමා පිළිතුරු දේවි. දෙන පිළිතුර සම්බන්ධව කරුණු මා එතුමාට කිව්වා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒක විශේෂයෙන්ම ගොවි ජනතාව ජීවත්වන ප්‍රදේශයක්. ආහාර වගාව නියම අන්දමට දියුණු කරන්නට නම් ගොවි ජනතාවට ගමනාගමන පහසුකම් සලස්වා දෙන්නට ඕනෑ. මාතර නගරාසන්න ප්‍රදේශයක්. නමුත් ටිකක් ඈතට වෙන්න, පිටිසරබද බොහෝ ප්‍රදේශවල ජීවත්වන මහජනතාවට ගමනාගමන පහසුකම් ඉතාම අඩුයි. ඒ ප්‍රදේශවල බස් ධාවනයක් නැහැ. එම නිසා ආහාර වගාව පිළිබඳ කටයුතු නියම අන්දමට ඉෂ්ට කරන්නට බැරිවී තිබෙනවා. ඒවාගේම ඒ ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ දරුවන්ට පාසල් වලට ඇතුළු වීමේදී නොයෙකුත් ප්‍රශ්න වලට මුහුණපාන්නට වී තිබෙනවා. මාතර ප්‍රධාන මහා විද්‍යාල තිබෙන්නේ නගරය තුළ බව තමුන්නාන්සේ දන්නවා. සෑහෙන බස් සේවාවක් නැත්නම් ඒ දරුවන්ට තමන් ගේ අධ්‍යාපන කටයුතු හරියාකාරව ගෙන යන්නට බැහැ. පාරවල් දියුණු කර, ඒවාට බස් සේවාවන් දමා මේ දුෂ්කර ප්‍රදේශ වල ජීවත්වන ගම්බද ගොවි ජනතාවට සහනයක් සැලසීම මේ අමාත්‍යාංශ දෙකේ ම, එනම් රජයේ වැඩ භාර අමාත්‍යාංශ යේත් පළාත් පාලන අමාත්‍යාංශයේත් යුතුකමයි. පළාත් පාලන ඇමතිතුමාගෙන් පිළිතුරක් ලැබේවිය කියා රජයේ වැඩ භාර ඇමතිතුමා කිව්වා. ඒ පිළිතුර සතුටු දායක පිළිතුරක් වේවි යයි මා විශ්වාස කරනවා. මේ අමාත්‍යාංශ දෙකේම සහ යෝගතාවයෙන් අපේ මේ ගම්බද ප්‍රදේශ වලට බලපාන ඉතාම වැදගත් ප්‍රශ්න නිරාකරණය කිරීමට කටයුතු යොදන මෙන් මා අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 6

**ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information & Broadcasting)

කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. විශේෂයෙන් ම ගම්බද ප්‍රදේශවලට, කෘෂිකාර්මික කටයුතු කෙරෙන ඈත පිටිසර නොදියුණු ගම්මාන වලට, පාරවල් සකස් කර දීමේ වැදගත් කම ගැනයි මේ යෝජනාවේ සඳහන් කර තිබෙන්නෙ.

මේ යෝජනාව යටතේ රජය වෙනුවෙන් මේ ගරු සභාවේ දැනගැනීම පිණිස මා වචනයක් කියන්නට සතුටුයි. තමුන් නාන්සේලා ටිකක් විවේකීව පරීක්ෂා කර බැලුවොත්—මා නම් පරීක්ෂා කර බලා තිබෙනවා—මේ රජය පිහිටෙව්වාට පසු පාරවල් සඳහා කවදාවත් වියදම් නොකළ මුදල් සම්භාරයක් පසුගිය අවුරුදු තුන හමාර ඇතුළත පළාත් පාලන අමාත්‍යාංශ යෙනුත් ඒවාගේම රජයේ වැඩ භාර අමාත්‍යාංශයෙනුත් වියදම් කර තිබෙන බව තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති. පාරවලට පමණක් නොවෙයි, අවශ්‍ය පාලම් වලටත් ඒවාගේම බෝක්කුවලටත් අප මේ මුදල් වියදම් කර තිබෙනවා.

පසුගිය අවුරුදු තුනහමාර ඇතුළත නොයෙක් කටයුතු සඳහා මා දිවයිනේ නොයෙක් ප්‍රදේශවලට ගියා. ඒ ගිය අවස්ථා වලදී මා දුටු සංවර්ධනය ගැන මතක් වන විට ඇත්ත වශයෙන්ම දේශපාලන භේද යක් උඩ ඒ සංවර්ධනය ඇතිවී තිබෙනවාද යන්න ගැන නම් මා තුළ සැකයක් ඇති වෙනවා. අවංකව කල්පනා කරනවා නම් කිසිවකුටවත් දේශපාලන භේදයක් උඩ එවැනි සංවර්ධනයක් ඇති වී තිබෙනවාය කියන්නට බැහැ.

ඉදිරිපත් කරන සියලුම ඉල්ලීම් අපෙන් ඉෂ්ට වේවි යයි බෙන්තර-ඇල්පිටිය ගරු මන්ත්‍රීතුමා බලාපොරොත්තු වෙනවා. බෙන්තර-ඇල්පිටිය ගරු මන්ත්‍රීතුමා එතුමාගේ ආණ්ඩුවෙන් කළ ඉල්ලීම් ගැන දන්නවා නොවැ. ඒ ඉල්ලීම් කොයි ප්‍රමාණයට ඉෂ්ට වුණාද යන්න ගැන දන්නවා නොවැ. එමනිසා රජයකට කරන්නට පුළුවන් ප්‍රමාණය ගැන එතුමා දන්නවා. ඒ අනුව කල්පනා කරන විට මේ ආණ්ඩුව විශේෂයෙන්ම මේ වැදගත් අවශ්‍යතාව ගැන සැලකිල්ලක් ඇතිව ක්‍රියා කරන බව මා කියන්නට සතුටුයි. මට මතකයි, මේ රජය පිහිටවූ අවස්ථාවේදී, අපේ සංවර්ධන කටයුතුවලදී නොදියුණු ප්‍රදේශවලට විශෙෂ තැනක් දිය යුතු යයි ගරු අගමැති තුමා ප්‍රකාශ කළ බව. නගර පමණක් සංවර්ධනය කරමින් සිටියොත් සංවර්ධන යේ නියම ප්‍රතිඵලයක් දකින්නට ලැබෙන්නෙ නැති බවත්, මංමාවත් වේවා, ජල සම්පාදනය වේවා, විදුලි බල සම්පාදනය වේවා, යම් කිසි ප්‍රදේශයක් දියුණු තත්ත්වයකට පත් කෙරෙන එවැනි වැඩ කටයුතු නගරවලට පමණක් සීමා කරන විට එවැනි පහසුකම් ගම් ප්‍රදේශවලට නොලැබීමෙන් මහජනයා ගම් අත්හැර දමා නගරවලට සංක්‍රමණය වීමෙන් ගම් පිරිහෙන අතර, අධික ජනාවාසය හේතු කොටගෙන ඒ නගරත් පරිහාණිය කරා ගමන් කරන බවත්, ඒ නිසා සංවර්ධන පහසුකම් රට පුරාම ඇති කර විශෙෂයෙන්ම ඈත පිටිසර නොදියුණු ගම්බද ප්‍රදේශ ගැන විශෙෂ සැලකිල්ලක් ඇතුව ක්‍රියා කළ යුතු බවත්, ගරු අග්‍රාමාත්‍යතුමා කීප වරක්ම ප්‍රකාශ කර තිබෙනවා.

එතුමා පළාත් පාලන කටයුතු සම්බන්ධයෙන් විශෙෂයෙන්ම සඳහන් කරන්නට යෙදුණ බව මා දන්නවා. එසේ සඳහන් කළා පමණක් නොවෙයි, මා මෙම ගරු සභාවටත්, මේ ගරු සභාව මගින් මුළු රටටත් සැල කර සිටින්න කැමතියි, එතුමාගේ ඒ උපදෙස් ක්‍රියාවට පරිවර්තනය කිරීම පිණිස, පළාත් පාලන අමාත්‍යාංශයට දෙන ආධාර මුදල් ප්‍රමාණය අවුරුද්දෙන් අවුරුද්ද වැඩි කළ බව. පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය තමුන්නාන්සේලා ටිකක් පරීක්ෂා කර බැලුවොත් තමුන්නාන්සේලාට ඒ බව පෙනී යාවී.

තමුන්නාන්සේලා මෙහිදී සඳහන් කරන්න යෙදුණා, මංමාවත් පිළිබඳ කටයුතු භාර එක් අමාත්‍යාංශයක්ය පළාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]

පාලන අමාත්‍යාංශය කියා. මෙම අමාත්‍යාංශය පළාත් පාලන ආයතන මඟින් ගම්බද පාරවල් තනවන බවත් තමුන්නාන්සේලා කිව්වා. එසේ නම් ඒ කටයුතු සඳහා මෙම අමාත්‍යාංශයට වැඩිපුර මුදල් දීම ඉතාමත් අවශ්‍යයි. ඒ අවශ්‍යතාව පරිදි මුදල් ලැබී තිබෙනවා. ඒකයි මා කියන්නෙ. පුදුම විධියට ඒ මුදල වැඩි කර තිබෙනවා. අගමැතිතුමාගේ ප්‍රතිපත්තිය එතුමා වචනයට පමණක් සීමා කෙළේ නැහැ. එතුමා හැකිතාක් දුරට පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අවුරුද්දෙන් අවුරුද්ද වැඩි කළා. ඒ වාගේම රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයටද වැඩිපුර මුදල් දුන්නා. ඒ මන්ද ? රටක නියම සංවර්ධනයක් ඇති වීම සඳහා අවශ්‍ය දේවල් අතුරෙන් මංමාවත් ප්‍රධාන අවශ්‍යතාවක් බව එතුමා පිළිගෙන තිබෙන නිසයි. රටේ ඈත පිටිසර ගම්බද ප්‍රදේශ විවෘත වීමට නම් පාරවල්, පාලම්, බෝක්කු ඉතාමත් අවශ්‍යයි. පාරවල් මඟින් මහජනයා එහා මෙහා යෑම පමණක් නොවේ. ඒ ඒ ඈත ප්‍රදේශවල කෙරෙන විවිධ නිෂ්පාදනත් එහා මෙහා ගෙන යෑම කෙරෙන බව අමුතුවෙන් පැහැදිලි කළ යුත්තක් නොවෙයි. ඒ නිසා පාරවල් හේතුකොටගෙන විශේෂ සංවර්ධනයක් ඇති වන බව පිළිගත් එතුමා ඒ සඳහා වැඩිපුර මුදල් වෙන් කළා. එසේ වැඩිපුර මුදල් වෙන් කර දීමෙන් හැඟෙන්නේ එතුමාගේ උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දුන් බවයි.

පළාත් පාලන අමාත්‍යාංශයේ ග්‍රාමීය වැඩ කටයුතු සඳහා මෙතෙක් තිබුණු කොයි ආණ්ඩුවත් දුන් වැඩිම මුදල රුපියල් ලක්ෂ 50යි. 1965න් පස්සේ තමුන්නාන්සේලා ඇස්තමේන්තු පරීක්ෂා කර බැලුවොත් තමුන්නාන්සේලාට පෙනී යාවි ඒ මුදල් ප්‍රමාණය ක්‍රමානුකූලව වැඩි කර ඇති බව. එක් වරක එක පාරටම ලක්ෂ 30කින් වැඩි කළා. පනස් ලක්ෂය තිස් ලක්ෂයකින් වැඩි කරල අසූ ලක්ෂය කළා. මා ඉතාමත්ම සන්තෝෂයි කියන්න මෙවර එය රුපියල් ලක්ෂ සියය දක්වා අගමැතිතුමා විසින් වැඩි කර තිබෙන බව. මේක වාර්තාවක්. ග්‍රාමීය වැඩ කටයුතු සඳහා තමුන්නාන්සේලාගේ කාලයේ වියදම් කළ රුපියල් ලක්ෂ පනහ අපි සියයට සියයකින් වැඩි කර තිබෙනවා.

මා දැන් දිස්ත්‍රික්ක 10 කට විතර ගිහින් තිබෙනවා. මා ඒ දිස්ත්‍රික්කයට ගිහින් තිබෙන නිසා මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවෙ මයා.) දන්නවා, දැන් අවශ්‍යතා අනුව වැඩ කටයුතු කරගෙන යන්නට පුළුවන් වී තිබෙන බව. තමුන්නාන්සේලා ඉල්ලන අන්දමට සියයට සියයක්ම ආධාර මුදල් දෙන්න පුළුවන්කමක් නැහැ. වහාම විවෘත විය යුතු පාර වහාම විවෘත විය යුතුයි, වහාම සකස් විය යුතු දේ වහාම සකස් කළ යුතුයි කියන ප්‍රතිපත්තිය අනුව පක්ෂ හෝ වෙනත් භේදයක් නැතිව, අවශ්‍යතාව අනුව ක්‍රියා කරන්නට අපට පුළුවන් වී තිබෙනවා. විරුද්ධ පාර්ශ්වය මේ ප්‍රතිපත්තිය අගේ කොට සලකයි කියා මා විශ්වාස කරනවා. ආණ්ඩු පක්ෂයේ සිටින අය විතරක් එකතුව මේ මුදල බෙදා ගන්නව නම් අගමැතිතුමාගේත් රජයේත් ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නට පුළුවන් කමක් නැහැ. එතුමාගේ ප්‍රතිපත්තිය මුළු රටේම සංවර්ධනයක් ඇති කිරීමයි. එතුමා ගෙන යන ගොවිකම් සංවර්ධන ව්‍යාපාරයේ දී වුණත් මන්ත්‍රීවරුන්ගේ පාට බලා, ඒ ඒ ප්‍රදේශවල මහජනයාගේ දේශපාලන අදහස් ගැන බලා නොවෙයි, ඒ ව්‍යාපාරය ගෙන යන්නේ. දේශපාලන අදහස් බොහොම ඉක්මණට වෙනස් වෙනවා. දේශපාලන අදහස් අනුව වැඩ කරන්නට ගියොත් රටේ සංවර්ධනය ලොකු අමාරුවකයි වැටෙන්නේ. පාරවල් වේවා, ජලය වේවා, විදුලි බලය වේවා, වෙනත් දෙයක් හෝ වේවා රටේ සංවර්ධනයට අදාළ සෑම දෙයක්ම කළයුතුව තිබෙන්නේ රටේ මහජනතාවට නියම ජීවන තත්ත්වයක් ලබා දීමේ අරමුණ ඇතුවයි. මගේ විශ්වාසයේ හැටියට රටේ ජනතාවට යම්කිසි ජීවනෝපායක් ලබා දෙන්නට ඉතාමත්ම අවශ්‍ය කාරණා 3 ක් සම්පාදනය කළයුතුයි. එනම්, පාරවල් —පාරවල් කියන කොට පාලම් හා බෝක්කුත් ඇතුළත් වෙනවා—ජල සම්පාදනය, විදුලි බල සම්පාදනය. මගේ කල්පනාව මේ තුන එකට එකතු කළාමයි සමාජවාදය ඇති වෙන්නේ. මා ඒක ඉංග්‍රීසියෙන් කියන්නම් "Roads plus water plus electricity equals socialism"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ සමාජවාදය ඇතිවන කාලය මම කියන් නම්. අපි සමාජවාදය යනුවෙන් අදහස් කරන්නේ මොකක්ද? හැම මනුෂ්‍යයෙකුටම කාටවත් වහලකු නොවී සවකීය ශ්‍රම ශක්තියෙන් ජීවත් වීමේ අවස්ථාවක් සලසා දීමයි. සමාජවාදය එතැනයි.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ධනය නිපදවන මාර්ග—

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
ධන නිපදවන මාර්ග පැන නඟින්නේ ජලයත් විදුලියත් එකට එකතු වුණු තැනයි.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
පෞද්ගලික අයිතිය නැති කරන්නට ඕනෑ.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
පෞද්ගලික අයිතිය නැති කළ යුතුය කියා මාතර ගරු මන්ත්‍රීතුමා කියනවා. මේ පෞද්ගලික අයිතිය නැති කරනවාය කියන්නෙ මොකක්ද? කාගේවත් අතේ තිබුණු අයිතියක් අරගෙන නිලධාරි පැලැන්තියට භාර දීමද? එහෙම නොවෙයි, තමන්ගේ දක්ෂ පක්ෂකම් අනුව, තමන්ගේ හපන්කම් අනුව ශ්‍රමය වශයෙන් හෝ වේවා මානසික වශයෙන් හෝ වේවා නිෂ්පාදනයට කාටත් අවස්ථාවක් සලසා දෙන්නට ඕනෑ.

අද අපේ රටේ තෙත් කලාපයේ හැම තැනින්ම වතුර ගලාගෙන යන බව පෙනෙනවා. එහෙත් ජල සම්පාදනයක් කෝ? කඳු හෙල්වලින් පවිත්‍ර වතුර ඇද හැලෙනවා ඒවා ඇළක් දොළක් බවට පත්වෙලා අපවිත්‍ර වෙමින් ගමන් කරනවා. සමහර ජල කඳන්වලින් අදත් විදුලිය නිපදවනවා. අද මේ රජයේ ග්‍රාමීය විදුලි සංවර්ධන වැඩ පිළිවෙළ අනුව ගම් විශාල සංඛ්‍යාවකට විදුලි බලය බෙදාගෙන යන බව තමුන්නාන්සේ දන්නවා. තමන්ගේ ශක්තිය අනුව, තමන්ගේ උත්සාහය අනුව, තමන්ගේ කල්පනා ක්‍රමය අනුව නොයෙක් නොයෙක් දේවල් නිෂ්පාදනය කරන්නට මේ රටේ පොදු මහජනතාවට අවස්ථාවක් ලැබුණේ මේ රජයේ වැඩ පිළිවෙළ අනුව බවයි මා කිව්වේ. ලැබී තිබෙන අවස්ථාව මොකක් දැයි සිතා බලන්න. දේශපාලන වශයෙන් විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලාත් අපත් අතර විරුද්ධ මත තිබුණත්, මේ රජයේ වගා ව්‍යාපාරය නිසා ගොවියාට වෙන කවරදාකටත් වඩා ආධාර, උපකාර, උපදෙස් ආදිය ලැබුණු බව නොපිළිගනු ඇතැයි මා හිතන්නේ නැහැ. මේ රජයේ වැඩ පිළිවෙළ නිසා වැඩි වුණු උනන්දුව හේතු කොටගෙන අද ඇති වී තිබෙන ප්‍රබෝධය දෙස බලන්න. අද මේ රටේ අනුක්‍රමයෙන් ඇතිවේගන එන නිෂ්පාදන ගැන කල්පනා කර බලන්න.

දින කීපයකට ඉස්සර වෙලා මම මඩකලපු දිස්ත්‍රික්කයේ සංචාරයක යෙදුණා. මීට අවුරුද්දකට පමණ පෙර මා එම ප්‍රදේශයට ගිය අවස්ථාවේ තිබුණු තත්ත්වයට වඩා අතිශයින්ම උසස් තත්ත්වයක් මේ කාල සීමාව තුළ ඇති වී තිබෙන අන්දම දුටුවොත් තමුන්නාන්සේ පුදුම වෙනවා ඇති. එදා නිකම් නිස්සාර බිම් හැටියට පැත්තකට දමා තිබුණු බිම් පෙදෙස් අද සාරවත් කුඹුරු බවට පත් වෙලා තිබෙනවා. ඕනෑම කෙනකුගේ සිත් සතන් පුබුදු කරවන ආකාරයේ දියුණුවක් ඒ ප්‍රදේශයේ ඇති වී තිබෙනවා. පළාතේ පොදු ජනතාව නොයෙකුත් දුෂ්කරතාවන් මධ්‍යයේ මොන තරම් උනන්දුවක් දක්වා ක්‍රියා කර තිබෙනවාදැයි ඕනෑම කෙනකුට බලා ගන්නට පුළුවනි. පොළොන්නරු දිස්ත්‍රික්කයේ සහ මඩකලපු දිස්ත්‍රික්කයේත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේත් වියලි කලාපයට අයත් තවත් බොහොමයක් ප්‍රදේශවලත් විශාල දියුණුවක් ඇති වී තිබෙනවා. පසුගිය කාලයේ මා පොළොන්නරු දිස්ත්‍රික්කයටත්, හම්බන්තොට දිස්ත්‍රික්කයටත් ගිය අවස්ථාවේ මට පුදුම හිතුනා. මීට වර්ෂයකට පමණ පෙර එහි ගිය වෙලාවේ තිබුණාට වඩා අමුතු වෙනසක් දැන් එහි දකින්නට තිබෙනවා. දේශපාලන වශයෙන් වේවා, ජාති වශයෙන් වේවා, ආගම් වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]

වේවා කිසිම භේදයක් ගැන කල්පනා කර නොවෙයි මේ රටේ පොදු මහත් ජනතාව වැඩ කර තිබෙන්නේ. මේ රජය යටතේ පොදු ජනතාවට තමන්ගේ ක්‍රියා ශූරත්වය පෙනෙන අන්දමට වැඩ කරන්නට නිසි අවස්ථාවක් ලැබුණා. මේ රජයේ වැඩ පිළිවෙළ අනුව එතෙක් ලැබුණු සහල් සලාකය සීමා වුණා. සමහර අතිරේක ආහාර ද්‍රව්‍ය පිටරටවලින් ගෙන්වීම තහනම් කළා. එසේ කිරීම නිසා තමන්ගේ උත්සාහයට සෑහෙන ප්‍රතිඵලයක් ලැබෙන බවත්, ලාභයක් ලැබෙන බවත් ඒ මගින් තමන්ගේ ජීවනෝපායත් සැලසෙන බවත් ජනතාවට පැහැදිලි ලෙස පෙනුනා. ඒ නිසා ඒ අය හැකි තරම් උත්සාහ කළා. අද අපේ වගා ව්‍යාපාරයේ සාර්ථකත්වය දකින්නට තිබෙනවා. මා ගිය ගිය තැන්වල, සමහර ඈත පිටිසර ප්‍රදේශවල පවා, විශාල උනන්දුවකින් වැඩ කෙරෙන බව මට ඉතාම හොඳින් පෙනී ගියා.

වගා ව්‍යාපාරය කොයි තරම් උසස් ලෙස කරගෙන ගියත්, ඈත පිටිසර ප්‍රෙද්ශවල ජීවත් වන ජනතාවටත් පොදු මහත් ජනතාවටත් එහි නියම ප්‍රතිඵලය ලබා ගන්නට යම් යම් අපහසුකම් තිබෙනවා. හොඳ පාරවල් නැත්නම්, පාළම් නැත්නම්, බෝක්කු නැත්නම් නිෂ්පාදනය කරන දේවල් එහා මෙහා ගෙන යෑමේදී කොයි තරම් කරදර විඳින්නට සිදු වෙනවාද? සමහර පළාත්වල අවුරුද්දේ මාස තුන හතරක කාලයක් තුළ ගම්මානයකට යන්නට බැහැ. හොඳ පාරවල් නැති නිසා, බෝක්කු නැති නිසා, පාළම් නැති නිසා නොයෙක් කරදරවලට මුහුණ පාන්නට සිදු වෙනවා. එවැනි ප්‍රදේශවල මහජන නියෝජිතයින්ගෙන් කරුණු විමසා බලා තොරතුරු ඈතගෙන අවශ්‍ය මුදල් යොදවා සංවර්ධන කටයුතු කරගෙන යනවා.

මා ළඟදී ගිය එක් ප්‍රදේශයක අක්කර අටදාහක පමණ බිම් ප්‍රමාණයක් කාලයක් තිස්සේ නියම විධියට වැඩට නොගෙනයි තිබුණේ. එයින් භාගයක්ම නිස්සාර භූමියක් හැටියට සලකා තිබුණා. දැන් විශාල බිම් ප්‍රමාණයක් පෙනෙන තෙක් මානයේ සරු වෙල් යායක් බවට හැරී තිබෙනවා. බලන්න ඇති වූ සංවර්ධනය. ඒ ප්‍රදේශයට යන්නට තිබෙන පාළම අබලන් නිසා නියම ප්‍රයෝජනයක් ගන්නට බැරිව තිබුණා. ඒ වාගේම අවුරුද්දේ මාස තුනක්ම පාරෙන් අඩක් වතුරට යට වෙනවා. ගම්බද බොහෝ පාරවල් සතුටුදායක තත්ත්වයක නැහැ. මටත් මෙය පෙනුනා. මගේ නිලධාරීන් මට මේ ගැන වාර්තා කර තිබුණා. තුන්දාහක් පමණ වූ සෙනඟකට අවශ්‍ය හාල් සලාකය ගෙන යන්නේ මේ පාළම උඩිනුයි. අර මා සඳහන් කළ තුන් මාසයේ මේ මිනිසුන් මොන තරම් දුකක් විඳිනවාද? මේ පාළම සෑදීමට රුපියල් පණස්දාහක් අවශ්‍යයයි මීට කලින් වාර්තා කර තිබුණා. මෑතකදී නිලධාරීන් නැවතත් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාවේ හැටියට මේ පාළම තැනවීමට ලක්ෂයක් යනවා. මේ කටයුත්ත ඉතාමත් වැදගත් බව මා පිළිගන්නවා. ඒ සඳහා ලක්ෂයක් වැය කළාට කමක් නැහැ. ප්‍රදේශයේ අවශ්‍යතාව අනුව සොයා බලා කටයුතු කරන්නට ඕනෑ. ඒ ප්‍රදේශය නියෝජනය කරන්නේ අපේ මන්ත්‍රීවරයෙක් නොවෙයි. නියෝජනය කරන මන්ත්‍රීවරයා කවුරුද කියන එක නොවෙයි ප්‍රශ්නය. ප්‍රදේශයේ අවශ්‍යතාවයි ප්‍රශ්නය. අවශ්‍යතාව අනුව වැඩ නොකළොත් මේ රට පොදුවේ දියුණු කරන්නට අමාරුයි. දේශපාලන වශයෙන් කොටු වන්නට හොඳ නැහැ. එහෙම දේශපාලන වශයෙන් කොටු වන්නට පටන් ගත්තොත්, පක්ෂ වශයෙන් කොටු වන්නට පටන් ගත්තොත් අපේ රට දියුණු කරන්නට බැහැ. නොයෙක් භේදවලට යට වී වැඩ කරන්නට පටන් ගත්තොත් අපේ ගරු අගමැතිතුමා කල්පනා කරන සංවර්ධනය එතුමාගේ බලාපොරොත්තුව අනුව ගෙන යන්නට අමාරුයි. එම නිසා, මේ රජයේ ඒ ප්‍රතිපත්තිය ගැන සැකයක් ඇති කර ගන්නට එපායයි මා කියනවා. ගරු අගමැතිතුමාත් එය ප්‍රකාශ කර තිබෙනවා; ක්‍රියාවෙන් ඔප්පු කර තිබෙනවා. ජල සම්පාදනය පිළිබඳ තත්ත්වයත් එයමයි. ඒ කාරණය මීට අදාළ නූණත්, නොදියුණු ප්‍රදේශ දියුණු කිරීම සඳහා ජල සම්පාදනය අවශ්‍ය බව මා කියන්නට ඕනෑ. ජල උල්පත් තිබෙන්නේ තෙත් කලාපයේ පමණක් නොවෙයි. අනුරාධපුරය, පොළොන්නරුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැනි වියළි කලාපීය ප්‍රදේශවල කොතරම් තද නියඟයකදීවත් නොසිඳෙන ජල උල්පත් අපට දැන් හමු වී තිබෙනවා. ඒවා ප්‍රයෝජනයට ගෙන කුඩා ජල සම්පාදන යෝජනා ක්‍රම ඇති කිරීමේ වැඩ පිළිවෙළක් දැන් මා යොදාගෙන යනවා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කථා කරන විට මේවා ගැන සැක පහළ කළා. මා කියන්නේ එවැනි සැකයකට ඉඩක් නැති බවයි.

අ. භා. 6.19

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please. Mr. Deputy Speaker will now take the Chair.

**අනතුරුව කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත්වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.**

அதன் பிறகு, குழு உப அக்கிராசனர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, உபசபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினூர்கள்.

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

පාරවල්—විශේෂයෙන්ම පළාත්බද පාරවල්—සම්බන්ධයෙන්ද මගේ අවධානය යොමු වී තිබෙනවා. ගම්බද පාරවල් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරවල් බවට පත් කිරීමේ ප්‍රශ්නය ගැන මෙම සාකච්ඡා වේදී මීට කලිනුත් කරුණු සඳහන් වන්නට ඇති. ප්‍රසිද්ධ වැඩ පිළිබඳ ගරු ඇමතිතුමා සමග මා මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. මේ පිළිබඳ කෙටි ඉතිහාසයක් තිබෙනවා. ඉස්සර ගම්බද පාරවල්, ඩී. ආර්. සී. පාරවල් හා පී. ඩබ්ලිව්. ඩී. පාරවල් යනුවෙන් පාරවල් තුන් වර්ගයක් තිබුණා. එහෙත් දැන් ඩී. ආර්. සී. පාරවල් නැහැ. එම නිසා, දැන් සිදු වී තිබෙන්නේ වී. සී. රෝඩ්ස් හෙවත් ගම්බද පාරවල් පී. ඩබ්ලිව්. ඩී. පාරවල තත්ත්වයට පත් කරන්නටයි. මෙය "ඩබල් ප්‍රොමෝෂන්" එකක්. ගම්බද පාරවල් පී. ඩබ්ලිව්. ඩී. පාරවල් තත්ත්වයට පත් කිරීමේදී සලකා බැලිය යුතු අංශ කීපයක් තිබෙනවා. ප්‍රසිද්ධ වැඩ පිළිබඳ ගරු ඇමතිතුමා මේ තත්ත්වය තේරුම් ගෙන තිබීම ගැන මා සන්තෝෂ වෙනවා. මෙහි අමාරුකම එතුමා අවබෝධ කරගෙන තිබෙනවා. මෙය එකපාරටම කළ හැකි දෙයක්යයි කවුරුන්වත් කල්පනා කරන්නට නරකයි. එසේ කරන ලෙස ඉල්ලීමත් සුදුසු නැහැ. කුමන පාරක් වුණත් ක්‍රම ක්‍රමයෙන් ඒ තත්ත්වයට පත් කළ යුතුයි. [බාධා කිරීමක්] දැන් හැම පාරක ම බස් යනවා. මා මෙය දේශපාලන වාසියක් තකා කියනවා නොවෙයි. අද සෑම දිස්ත්‍රික්කයකම ගම්බද කුඩා පාරවල පවා බස් ගමනාගමනය කෙරෙන බව, තමුන්නාන්සේලා ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් ධාවන මාර්ග පරීක්ෂා කර බැලුවොත් පෙනෙයි. එවැනි පාරවල බස් දුවවන්නට එපායයි මට කියන්නට බැහැ. ඒ වායෙත් බස් ගමන් කරවීම අවශ්‍යයි. එහෙත්, බස් ධාවනය වන විට ගම්බද පාරවල් කැඩෙනවා. ගම්බද පාරක් හදන්නට රජයෙන් රුපියල් දහ දොළොස් දාහක් දුන්නත්, නියම විධියට ඒ පාරවල් හැදීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ කොන්ත්‍රාත්කාරයන්ට ඇත්තේ නැහැ. ඔවුන් කරන්නේ එහෙත් මෙහෙන් තාර ටිකක් දමා යන්තමට එය සකස් කිරීම පමණයි. නිතර වහින ප්‍රදේශවල නම්, මේ මාසයේදී හැදූ පාර ලබන මාසය වන විට සේදී ගොස් අවසානයි. ඊළඟ අවුරුද්ද වන විට එහි පාරක් තිබුණාද යන වගවත් දැන ගන්නට බැරි තත්ත්වයකට පත් වෙනවා. මේක ලොකු ප්‍රශ්නයක්. මා ප්‍රසිද්ධ වැඩ කටයුතු භාර ඇමතිතුමා සමඟ මේ ගැන සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වෙනවා. ගම්කාර්ය සභා පාරවල් පී. ඩබ්ලිව්. ඩී. පාරවල් තත්වයට, එසේ නැත්නම් උසස් තත්ත්වයට ගෙන ඒම සඳහා රජයේ අනුමැතිය ඇතිව එතුමාගේ අමාත්‍යාංශයෙන් මගේ අමාත්‍යාංශයට යම් ආධාර මුදලක් ලබා ගන්නට පුළුවන් වේතැයි මා කල්පනා කරනවා. පළාත් පාලන ආයතන මාර්ගයෙන්ම ඒ උසස් තත්ත්වය ඒ පාරවලට ලබා ගන්නට පුළුවන් වේතැයි මා විශ්වාස කරනවා. යම් පළාත් පාලන ආයතනයකට වගකීම භාර දුන්නාම මුදල් ගෙන ඒ වැඩේ නොකර ඉන්නට පුළුවන් වන්නේ නැහැ. මුදල් ගෙන වැඩේ නොකර හිටියොත් මහජනයාගේ විවේචනවලට ලක් වන්නට සිදු වෙනවා. මහජනයා මට පැමිණිලි කරනවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගම්වලට පිවිසෙන මාර්ග වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීම

[ගරු ප්‍රේමදාස]

පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් හැම දිස්ත්‍රික්කයම සිටිනවා. ගම්කාර්ය සභාවකට රුපියල් දහදාහක් දුන්නොත් අදාළ දිස්ත්‍රික්කයේ සහකාර කොමසාරිස්තුමා ඒ මුදලින් වැඩ කෙරෙන ආකාරය ගැන මට වාර්තා කරන්නට ඕනෑ. මාස තුනෙන් තුනේ කොටස් අනුව ඒ මුදල් වියදම් කරන ආකාරය ගැන මට වාර්තා කරන්නට ඕනෑ. මුදල් සටහන අනුව වියදම් නොකෙරෙනවා නම් ඊට පසුව ඒ පළාත් පාලන ආයතනයට මුදල් දෙන්නේ නැහැ. සමහර ගම්කාර්ය සභා මුදල් ගෙන මොකුත් වැඩක් නොකර ඉන්නවා. ඒවා පුදුම ගම්කාර්ය සභා. මා මේ කියන්නේ පක්ෂ වාදයක් අනුව නොවෙයි.

එක් ප්‍රදේශයක ගම්කාර්ය සභාවකට පාලමක් සෑදීම සඳහා රුපියල් ලක්ෂ දෙකහමාරක් මේ රජයෙන් ලැබී තිබෙනවා. ඒ ගම්කාර්ය සභාවේ දේශපාලන මුහුණුවර අපේ දේශපාලන මුහුණුවර නොවෙයි. ඒ ගම්කාර්ය සභාවට රුපියල් ලක්ෂ දෙකක් දුන්නා. ඒ ගම්කාර්ය සභාව පාලම සෑදීම සඳහා ටෙන්ඩර් කැඳවා එය එක් කොන්ත්‍රාත්කාරයකුට භාර දුන්නා. ඒ කොන්ත්‍රාත්කාරයා එක්සත් ජාතික පක්ෂයට හිතවත් කෙනෙකැයි කියනවා. එය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයකු සිටින ගම්කාර්ය සභාවක් වුණත් කොන්ත්‍රාත්කාරයා එක්සත් ජාතික පක්ෂයට හිතවත් යයි කියනවා.

ඒ ඒ කටයුතුවලට මුදල් වියදම් කරන ආකාරය පිළිබඳ සටහනක් මගේ කාර්යාලයේ තිබෙනවා. යම් යෝජනා ක්‍රමයක් ඒ ඒ මාසයේදී ඉදිරියට ගොස් තිබෙන ආකාරය හැම මාසයේම පළමුවැනිදා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒ සටහනේ පෙන්නුම් කළ යුතුයි. මා අර රුපියල් ලක්ෂ දෙකහමාරක් දෙනු ලැබූ ගම්කාර්ය සභාව තිබෙන ප්‍රදේශයට ගිය විට මට දැනගන්නට ලැබුණේ කොන්ත්‍රාත්කාරයා පැනලා ගොස් ඇති බවයි. කොන්ත්‍රාත්කාරයා කවුදැයි මා සභාපතිතුමාගෙන් ඇසුවා. ඒ වාගේම කොන්ත්‍රාත්තුව අහෝසි නොකළේ මන්දැයි ඇසුවා. දෙපාර්තමේන්තුවෙන් ඒ ගැන තමාට දන්වා නැතැයි එවිට ඒ සභාපතිතුමා කීවා. මා හොඳ වෙලාවට දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා මාත් සමඟ කැඳවාගෙන ගියා. මේ කොන්ත්‍රාත්තුව අහෝසි කරන්නට උපදෙස් නොදුන්නේ මන්දැයි මා ඔහුගෙන් ප්‍රශ්න කළා. "මේ බලන්න, ඒ ගැන අප ලියුම් හතක් අටක්ම ගම්කාර්ය සභාපතිතුමාට එවා තිබෙනවා" යනුවෙන් එවිට දෙපාතීමේන්තු ප්‍රධානයා කීවා. බොරු කීවේ මන්දැයි එවිට මා සභාපතිතුමාගෙන් ඇසුවා. මේ කොන්ත්‍රාත්කරුට මේ වැඩේ භාර නොදෙන ලෙසට ඉන්ජිනේරු උපදෙස් ලැබී තිබෙනවා. කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලෙස දන්වා තිබෙනවා. ඒ කොන්ත්‍රාත්තුව අවලංගු කරන තුරු වෙනත් කෙනකුට එය භාර දෙන්නට බෑ. ඒ වාගේම මගේ දෙපාර්තමේන්තුවට එය භාරගෙන කරන්නටත් බෑ. ඒක ලක්ෂ දෙකහමාරක පාලමක්. ජාවාරමට පක්ෂ භේදයක් නැති බව මෙයින් පේනවා නේද? සල්ලිවලට පක්ෂ භේදයක් නෑ. මේක සියයට දහයේ ජාවාරමක්. මේ සියයට දහයේ ජාවාරමට ශ්‍රී ලංකා නිදහස් පකාෂයේ අය, එක්සත් ජාතික පක්ෂයේ අය යයි භේදයක් නැහැ. එතැන තියෙන්නේ වෙනත් හවුලක්. නොයෙක් ප්‍රදේශවල මේ සියයට දහයේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා.

කොන්ත්‍රාත් ක්‍රමය නිසා හරියට වැඩ කෙරෙන්නේ නැහැ. පාලම් සම්බන්ධයෙන් මේ තත්ත්වය හුඟක් දුරටම වෙනස් කරන්නට මට දැන් පුළුවන් වී තිබෙනවා. සියයට හැටක් පමණ වෙනස් කරන්නට පුළුවන් වී තිබෙන බව ප්‍රීතියෙන් ප්‍රකාශ කරනවා. කුඩා පාලම් පුළුවන් තරම් දුරට අර කොළඹ "ප්‍රී කාස්ට් කොන්ක්‍රීට්" ක්‍රමයට සකස් කර ගෙන ගොස් සවි කරන්නට දැන් වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. වියළි කලාපයේ මන්ත්‍රීවරුන්—ආණ්ඩු පක්ෂයේ මෙන්ම විරුද්ධ පක්ෂයේත්—ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයෙන් හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සමහර විට කුළියට පවා බුල්ඩෝසර් ආදිය ලබාගෙන ඒ ප්‍රදේශයේ පාරවල් බොහොම හොඳට හදාගෙන යනවා මා දැක තිබෙනවා. දකුණු පළාතේත් ඒ විධියට පාරවල් හදා ගන්නා හැටි මා දුටුවා. පාරවල් හැදීම සඳහා බුල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩෝසර්, රෝලර් වැනි යන්ත්‍ර අවශ්‍යයි. ගම් බද පාරවල් කැපීමේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා, ආරම්භයක් වශයෙන් ස්ථාන දෙකකට එවැනි යන්ත්‍රෝපකරණ ගැනීම සඳහා අද මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මට ලැබුණු බව බොහොම සන්තෝෂයෙන් මතක් කරනවා. ආරම්භයක් වශයෙන් රෝලර් 5 කුත් ලබාගෙන, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට අවශ්‍ය පරිදි හුවමාරු කර ගනිමින් පාවිච්චි කිරීමේ හැකියාව ලබා දෙන්නටත් මා බලාපොරොත්තු වෙනවා. මාතර දිස්ත්‍රික් සම්මේලනයේදී මතු වූ අදහස් අනුව කරුණු සොයා බලායි, මා ඒ තීරණයට බැස්සේ. එවිට ඒවා කුළියට ගන්නට, ගම් කාර්ය සභාවලට පුළුවන්කම ලැබෙනවා. අමාත්‍යාංශයේ සහකාර කොමසාරිස්වරයා භාරයේයි, ඒවා තබන්නේ. එවිට ගම්බද පාරවල් හැදීමේ කටයුතු වඩාත් පහසු වෙනවා. ඒවා පාවිච්චි කරන්නට බැරි ප්‍රදේශත් තිබෙන බව මා පිළිගන්නවා. එහෙත් දිස්ත්‍රික් ගණනාවකටම ඒවා පාවිච්චි කරන්න පුළුවනි. ඒ වැඩ පිළිවෙළ අනුගමනය කිරීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ගෙන්වා ගැනීම සඳහා දැන් කේබල් මාර්ගයෙන් ඇණවුම් යවා තිබෙනවා. පාරවල් හැදීම සම්බන්ධයෙන් ඒ විධියේ පියවරවල් ගන්නට බලාපොරොත්තු වන බව මතක් කරන්න කැමතියි.

මේ සම්බන්ධයෙන් රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා සමඟ මා සාකච්ඡා කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් එතුමාගේ සම්පූර්ණ සහයෝගය ලැබෙනවා. අමාත්‍යාංශ දෙක එසේ සම්බන්ධ වී කටයුතු කරගෙන යන විට, මේ ප්‍රශ්න සම්බන්ධයෙන් දැනට වඩා, කලින් තිබුණාට වඩා වේගයකින් කටයුතු කරන්නට පුළුවනි. ඒ පියවරවල් ගන්නා බව, රජය වෙනුවෙන් මේ අවස්ථාවේදී මා කියන්නට කැමතියි.

අ. භා. 6.30

**ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.** (හපුතලේ)
*(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)*
(Mr. W. P. G. Ariyadasa—Haputale)

නියෝජ්‍ය කථානායකතුමනි, කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා විසින් රටට ඉතා අවශ්‍ය, කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට මට අවකාශය ලබා දීම පිළිබඳව මා තමුන්නාන්සේට කෘතඥ වෙනවා.

එක්තරා අවධියක මාර්ග සෑදීම සඳහා වෙන්ව තිබුණේ රුපියල් 50,00,000 ක් නමුත්, එය රුපියල් 80,00,000 දක්වා ඉහළ නැඟ, අද රුපියල් 1,00,00,000 දක්වා ම ඉහළ නැඟ තිබෙනවා යයි පළාත් පාලන ඇමතිතුමා කීවා. ඒ ගැන අප සතුටු වෙනවා. ඒ අනෙකක් නිසා නොව, ඇත ගම්බද ප්‍රදේශවල පාරවල් හැදීම ඉතාමත් අවශ්‍ය දෙයක් නිසයි. ඒ අදහස අප පිළිගත්තා වාගේම දැන් එතුමන්ලාත් පිළිගැනීම සතුටට කාරණයක්. මඩකලපුව වැනි ප්‍රදේශවලට ගිය අවස්ථාවේදී සිදු වී තිබෙන විශාල වෙනස්කම් දැකගන්නට ලැබුණා යයි පළාත් පාලන ඇමතිතුමා වැඩිදුරටත් කීවා. අපේ ප්‍රදේශවලටත්—

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)
එනවා.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)
—ඇවිත්, මාර්ග අපහසුකම් පිළිබඳව සොයා බලා, අපේ ප්‍රදේශවලටත් සෑහෙන පහසුකම් සලසා දෙන හැටියට මා එතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. 1956 දක්වා හපුතලේ ප්‍රදේශය—මා නියෝජනය කරන ඡන්දදායක කොට්ඨාශය—පැවතුණේ, මාර්ග පහසුකම් ඉතාමත් අඩු ප්‍රදේශයක් වශයෙන් බව මෙහිදී සඳහන් කළ යුතුව තිබෙනවා. එහෙත් 1956 සිට මා පටන් ගත්තා, කිරිවනාගම, සොරගුණේ, රන්වන්ගුහාව, හරන්කපහ අලුත්වෙල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

උතුර, අලුත්වෙල දකුණ, දියතලාව-ඇල්ල ගම, හපුතලේගම යනාදි පාරවල් දියුණු කිරීමට.

මේ පාරවල වැඩ පටන් ගෙන කර ගෙන යන අතරම විශේෂයෙන් මා ගරු පළාත් පාලන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙයින් එක් පාරක වැඩ කටයුතු ඉක්මණින් කර දෙන ලෙසයි. සොරගුණේ පාර, ඒ කියන්නේ හල්දුම්මුල්ල නගරයේ සිට සොරගුනේ දේවාලය දක්වා ඇති පාර ඉක්මනින්ම සාදා දෙන ලෙසයි මා ඉල්ලා සිටින්නෙ. සොරගුනේ දේවාලය සම්බන්ධ ඉතිහාසය ගැන කථා කරනවා නම් කිව යුතු කරුණක් තමයි, මෙම දේවාලය කතරගම දේවාලයටත් වඩා පැරණි දේවාලයක්ය කියා ගැමි ජනතාව අතර මතයක් තිබෙන බව. මෙය ඒ තරම් පැරණි ඉතා වැදගත් දේවාලයක් බව සඳහන් කරන්න කැමතියි. පළාත් පාලන ආයතනය මගින් සැළකිය යුතු මුදලක් ලබා ගෙන මේ පාරේ වැඩ පටන් ගත්තා. මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ පළාතේ සංචාරය කරන අවස්ථාවක් ඇතොත් එම පාරේත් ඇවිත් බලන්නය කියා. තවම ඒ පාරේ තාර දමා නැහැ. ඇවිදින්න නම් ටිකක් අමාරුයි. ඒ නිසා ඒ පාරේ වැඩ කටයුතු අවසන් කිරීම සඳහා සැළකිය යුතු මුදලක් ලබා දුන්නොත් ඉතාමත් ප්‍රයෝජනවත් වන බව කියන්න සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හපුතලේ ඡන්දදායක කොට්ඨාශයේ 1956 සිට පටන් ගෙන වැඩ කර ගෙන ගොස් තිබෙන පාරවල් ගැන මා මුලින් කිව්වා. මගේ මිත්‍ර ප්‍රසිද්ධ වැඩ පිළිබඳ ඇමතිතුමාට මේ අවස්ථාවේදී චෝදනාවක් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. එම චෝදනාව කිරීමට මත්තෙන් මා එක් කරුණක් ගැන කියන්න ඕනෑ. එනම් මේ අලුත්වෙල දකුණ පාර සම්බන්ධවයි. මේ අලුත්වෙල දකුණේ පාරට ගල් තාර දැමීම සඳහා මුදල් ලබා ගෙන වැඩ පටන් ගත්තා. මේ අවස්ථාවේදී මතක් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. මා මුලින් පාරවල් ලැයිස්තුවක් ඉදිරිපත් කළා. මා දන්නවා මගේ මිත්‍ර ඇමතිතුමාට මේ පාරවල් සම්බන්ධයෙන් හොඳ දැනීමක් තිබෙන බව. මට දැන් එතුමාට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කිරීමට තිබෙන බවක් මා මුලින් කිව්වා. මේ අලුත්වෙල දකුණේ පාරට තාර දැමීමට එක්තරා පුද්ගලයෙකුට කොන්ත්‍රාත් එක භාර දුන්නා. සේනාරත්න කියන පුද්ගලයාටයි ඒ කොන්ත්‍රාත් එක භාර දී තිබුණේ. මේ පාර පල්ලම් සහිත පාරක්. මේ පාරට තාර දමා තිබියදී මගේ කාර් එකෙන් ඒ පාරේ ගමන් කළා. පාර හරහා හරකෙක් පැන්න නිසා මට "බ්රේක්" පාරක් ගසන්න සිදු වුණා. එවිට පාරේ තාර ටිකත් ගළවා ගෙන ලිස්සා ගොස් මගේ කාර් එක සම්පූර්ණයෙන්ම පල්ලමට වැටුණා. මේ සිද්ධියෙන් පසු මේ පාරට තාර දැමීම සඳහා මුදල් ගෙවීම තහනම් කරන්නය කියා විදුලි පුවතක් යැව්වා. නමුත් ටැලිපෝන් මාර්ගයෙන් මට කිව්වා, මුදල් ගෙවා අවසාන නිසා දැන් කරන්න දෙයක් නැත කියා. තමුන්නාන්සේ මේ ඊයේ පෙරේදා අලුත්වෙල ගිය නිසා ඒ පාර දකින්න ඇති. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සේනාරත්න නමැති පුද්ගලයාට මුදල් ගෙවීම තහනම් කිරීමට මා විසින් උත්සාහ දැරීම නිසා එම පුද්ගලයා විසින් අලුත්වෙල පාඨශාලාවේදී මට විරුද්ධව අස්ථාන චෝදනාවක් කර තිබෙනවා.

මා ප්‍රසිද්ධ වැඩ පිළිබඳ ඇමතිතුමාට කරන චෝදනාව මෙයයි. එතුමා මේ පාරවල් බැලීම සඳහා ගියා. එහිදී පවත්වන ලද රැස්වීමට මා ගියේ නැහැ. ඒ ඇමතිතුමා සහභාගි වෙන්න ඇති. මේ පාර ගැන ඒ රැස්වීමේදී කතා කර තිබෙනවා. එහිදී මේ සේනාරත්න කියන පුද්ගලයා මට විරුද්ධව තදින් චෝදනාවක් එල්ල කර තිබෙනවා. එම චෝදනාව කර තිබෙන්නේ ප්‍රසිද්ධ ස්ථානයකදීයි. එනම් පාඨශාලාවකදීයි. වෙන ඕනෑම තැනකදී මට විරුද්ධව චෝදනාවක් එල්ල කළාට මට කමක් නැහැ. නමුත් පාසැල පොදු ආයතනයක්. තමුන්නාන්සේ මූලාසනයේ ඉන්න අවස්ථාවේදී ඒ පුද්ගලයා විසින් මට විරුද්ධව එවැනි චෝදනාවක් කර තිබෙනවා. පාසැලක් වැනි පොදු ආයතනයක් පෞද්ගලික චෝදනා නැගීමේ ස්ථානයක් කර ගැනීමට ඉඩ දෙන්න බැහැ. එය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගම්වලට පිවිසෙන මාර්ග වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීම

කිසිසේත් සුදුසු දෙයක් නොවෙයි. ඒ පුද්ගලයාට විරුද්ධව කරන චෝදනාව එයයි. ගරු ඇමතිතුමා විසින් අලුත්වෙල උතුරේ පාඨශාලාවකදී එක්සත් ජාතික පක්ෂයේ ශාඛාවක් පිහිටුවීමට කටයුතු කර තිබෙනවා. ඕනෑම තැනක එක්සත් ජාතික පක්ෂයේ ශාඛා පිහිටුවූවාට අපට කමක් නැහැ. නමුත් මා රජයෙන් ඉතා කාරුණික වෙන් ඉල්ලා සිටින්නේ මේ ප්‍රසිද්ධ ආයතන ඔවැනි වැඩවලට "ගණිකා වෘත්තියට" යොදවා ගන්න එපාය කියායි. මම බොහොම කෙටියෙන් මේ චෝදනාව ඉදිරිපත් කරන්න කැමතියි. ඕනෑම තැනකට, ඕනෑම ස්ථානයකට හෝ ඕනෑම ගම්මානයකට ගොස් එක්සත් ජාතික පක්ෂයේ හෝ වේවා පෙඩරල් පක්ෂයේ හෝ වේවා ශාඛා පිහිටුවීම ගැන මා සන්තෝෂ වෙනවා මිස අසන්තෝෂයක් දක්වන්නේ නැහැ. එහෙත් පාඨශාලාවකට ගොස් ඇමතිවරයෙක් මූලාසනයේ සිටගෙන අර විධියේ තැනැත්තන් ලවා චෝදනා නංවමින් එම පාසැලේදී එක්සත් ජාතික පක්ෂයේ හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ ශාඛාවක් පිහිටුවනවා නම් එය, එම ප්‍රසිද්ධ ස්ථානයක ගණිකා වෘත්තියේ යෙදීමක් බව මා කියනවා. ඒ ගැන මා කණගාටු වෙනවා.

ගරු ඇමතිතුමා ඉදිරියේ මට චෝදනා කළ එම පුද්ගලයාට එම රු. 13,000 ක මුදල ගෙවන්නට එපාය කියා මා ටෙලිග්‍රෑම් එකක් යැව්වා. එහෙත් එය ගෙවා අවසානයි කියා පසුවදා මට ටෙලිෆෝන් මගින් දැනුම් දුන්නා. ඒ නිසා එම මුදලින් කිසිම ප්‍රයෝජනයක් වුණේ නැහැ. ඒ සමගම ගරු පළාත් පාලන ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. හොරගුණේ දේවාලයට වන්දනාකරුවන් විශාල පිරිසක් යන නිසා එම පාර—අනිකුත් පාරවල් වැදගත් නැහැ නොවෙයි, ඒවාත් ඉතාමෙ වැදගත්, ඒවා ගැන ප්‍රමාද කරතත්—ඉක්මණින් මෙම පාර සාදා දෙන ලෙස ඉල්ලනවා. එම පාරට තාර දැමීම පමණයි තවම ඉතිරිව තිබෙන්නේ. අනික් වැඩ සියල්ලම අවසානයි. ඒ නිසා එයත් කරදෙන හැටියට ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 6.40

**ගරු මොන්ටේගු ජයවික්‍රම**

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)

(The Hon. Montague Jayewickreme)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවසථාවේ වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට මාත් අදහස් කරනවා. අපේ දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමාගේ (වීරසේකර මයා.) යෝජනා දෙකකුත් තිබෙනවා ගල් අතුරා තාර දැමීම සම්බන්ධව. එහෙත් දැන් අපි අලුත් ක්‍රමයක් යොදාගෙන යන බව මේ අවස්ථාවේදී කියන්නට කැමතියි. ඒ අලුත් ක්‍රමය කුමක්ද කියා රත්මලානේ අපේ රසායනාගාරයට ගියොත් බලාගන්නට පුළුවන්. මෙපමණ කලක් ගම්බද පාරවල් සම්බන්ධයෙන් කළේ ගල් අතුරා තාර දැමීමයි. එය වියදම වැඩි අමාරුවෙන් කරන්නට සිදු වන වැඩක්. ඇතැම් පාරවල් සැතැප්මක් ගල් අතුරා තාර දැමීමට—බෝක්කුත් සමග—රුපියල් ලක්ෂයක පමණ මුදලක් වියදම් වෙනවා. එහෙත් මෙවර අයවැය ලේඛනයෙන් එවැනි පාරවල් සඳහා වෙන් කර තිබෙන්නේ රු. 60,00,000 යි. එහෙත් ගිය අවුරුද්දේ 1,10,00,000 ක් වියදම් කළා. ඒ නිසා මේ මුදල අවසාන වන විට නැවත වරක් ගිය අවුරුද්දේ මෙන් රු. 1,10,00,000 ක පමණ මුදලක් මුදල් ඇමතිතුමාගෙන් ලබාගෙන පාරවල් සඳහා වියදම් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. සුළු සුළු පාලම් බෝක්කු ආදියත් සමග සැතැප්මක ප්‍රමාණයක් ගල් අතුරා තාර දැමීමට රුපියල් ලක්ෂයක් පමණ වියදම් වෙනවා. බ්‍රිතාන්‍යයේ මෙයට සම්බන්ධ රසායනාගාරයේ අධ්‍යක්ෂ ඩොක්ටර් වූල් කියා මහත්මයෙක් ළඟදී මෙහි පැමිණියා. ඒ මහතා මා සමග මේ ගැන සාකච්ඡා කර කිව්වා දකුණු ආසියාවේ වෙන කිසිම රටක ලංකාවේ පමණ පාරවල් නැත කියා. එහෙත් එයින් අපි සතුටට පත් වන්නට වුවමනාවක් නැහැ. අපේ රටේ සෑම සතරැස් සැතැප්මකටම පාරවල් සැතැප්මක් බැගින් තිබෙනවා. For every square mile we have one mile of road. බුරුමයේ නානාපතිතුමා කීවා බුරුමයේ සතරැස් සැතපුම් 25 කට තිබෙන්නේ පාරවල් සැතැප්ම එකයි කියා. මේ රට ඒ තරම් දියුණු වී තිබෙනවා. එමෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මොන්ටේගු ජයවික්‍රම]

අපේ ස්වදේශ කටයුතු බාර ඇමතිතුමා උඩරට ගැමි පුනරත්ථාපන යෝජනා ක්‍රමය මගින් පාරවල කටයුතු සඳහා රුපියල් ලක්ෂ 42 1/2 ක් වෙන් කර තිබෙනවා. ගිය අවුරුද්දේත් යන්ත්‍ර සූත්‍ර ගෙන්වීම සඳහා ලක්ෂ 10 ක් වෙන් කළා. ඒ එතුමාගේ තනි උත්සාහයෙන්. එම මුදල්වලින් සියයට 95 ක් ම ක්‍රියාත්මක කරන්නේ මගේ අමාත්‍යාංශයෙන්. වැලිමඩ ආසනයේ ගම්සභාවක සභාපති කෙනකුට පාරවල් හැදීම සඳහා රුපියල් 83,000 ක් දී තිබෙනවා. නමුත් ඒ වැඩවලින් සියයට 85 ක් 90 ක් ක්‍රියාත්මක කරන්නේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන්. විරුද්ධ පාර්ශ්වයේ ආසනවලට අප වැඩ කරන්නේ නැත කියා බෙන්තර-ඇල්පිටියේ ගරු මන්ත්‍රීතුමා (කාරියවසම් මයා.) කිව්වා. සෑමාදාම විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් එක්කෙනකු හෝ දෙන්නකු මා හමු වන්නට එනවා. අසාධාරණ විධියට ඒ එක්කෙනෙකුගේ වැඩක්වත් කරන්නට බැරිය කිව්වද කියා අහන්න. දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) මා හමු වන්නට ආවා. එතුමා කී පාර බොහොම අවශ්‍ය පාරක්. මා ඒ සඳහා රුපියල් 1,50,000 ක් වෙන් කළා. කිසිම වෙනසක් කෙළේ නැහැ. සොරගුණේ පාර ගැන හපුතලේ ගරු මන්ත්‍රීතුමා (ආරියදාස මයා.) සඳහන් කළා. ඒ පාර රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අරගෙන අවසානයි. ලබන මාසයේ මා එය බලන්නට යනවා. ඒ ප්‍රසිද්ධ දේවාලයට යාම සඳහා ඒ පාර අවශ්‍යය කියා මා එයට මුදල් අනුමත කළා.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

එහෙම නම් මම ඒක හදන්නට ඕනෑ නැහැ.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

ඕනෑ නැහැ. ඒක මා කරන වැඩක්. පසුගිය උත්සවයට යාම සඳහා ඒ පාරට හියුම් පයිප්ප දමන්නට මම බොහොම වෑයම් කළා. නමුත් ඒ පයිප්ප සොයා ගන්නට බැරි වුණා. ඒ නිසා මම බෝක්කුවත් හදන්නය කිව්වා. ඒකට ඊට වඩා ටිකක් වියදම් යනවා. නමුත් හියුම් පයිප්ප නැත්නම් මොකද කරන්නෙ? මුළු ලංකාවටම හියුම් පයිප්ප හදන්නෙ පාලම් අංශයෙන්. පාලම් අංශයෙන් හදන්නට බැරි වුණොත් හියුම් පයිප්ප කොම්පැනියෙන් ගන්නට ඕනෑ. එතකොට ලොකු වියදමක් යනවා. හියුම් පයිප්ප නැත්නම් "රබල් කල්වර්ට්ස්" දමන්නය කියා මා කීවා. කිරිවනාගම පාර ගැන මම කියන්නම්. මහජනයාගේ ඉල්ලීම පිට මා එහි ගියා. මන්ත්‍රීතුමත් හිටියා.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

දෙන්නම එකටයි වැඩ කරන්නෙ. මෙතන බොරුවට රණ්ඩු වෙනවා.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

උන්නැහේ මගේ හිතවත් මිත්‍රයා. රැස්වීම්වලදී උන්නැහේ කියනවා, මේ මගේ හිතවත් ඇමතිතුමාය කියා. මා කියනවා, මේ මගේ හිතවත් මන්ත්‍රීතුමාය කියා. මා කිරිවනාගමට ගියාම එහි මහජනතාව ඉදිරිපිට මගේ කථාවෙදි කිව්වා, මේ පාරේ යාම පොල් ගහක් නගිනවා වගේය, යන්නට පුළුවන්ය, නගින්නට බැරිය කියා. යන්නට පුළුවන්, නගින්නට බැහැ.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

ඒ කථාවෙ තේරුම මොකක්ද? පුදුම වැඩක් නේ ඒක.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

Will the Hon. Minister please give way? I want to explain what I said.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
Not necessary. I am not going to argue with you.

මා ඒ මන්ත්‍රීතුමත් සමග වාද කරන්නෙ නැහැ. මා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඉන්ජිනේරුවන්ට කීව්වා, පාරක් කපනවා නම් මහජනයාට පහසුවෙන් යන්නට පුළුවන් පිළිවෙළට කොන්ටුවර් ක්‍රමයට පාර කපන්නට ඕනෑය කියා.

**ආරියදාස මයා.**
(திரு. ஆரியதாச)
(Mr. Ariyadasa)
අමාරුවෙන් හරි ඒ පාර කපාපු නිසා ඇමතිතුමා එදා ජීප් එකෙන් ගියා නේ ද?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
දුප්පත් මහජනයාට ජීප් තියෙනවා ද? මා ගියේ ජීප් එකෙන්. කොන්ටුවර් ක්‍රමයට මා දැන් පාරක් කපාගෙන යනවා. නගින්නටත් පුළුවන් විධියට, බහින්නටත් පුළුවන් විධියට ඒ පාර කපනවා.

හපුතලේ ගරු මන්ත්‍රීතුමා මට විරුද්ධව චෝදනාවක් කළා. ඒ චෝදනාව කිරීම වැරදි බව මා කියන්නට ඕනෑ. අලුත්වල මහජනතාව මට ආරාධනය කර තිබුණා. මා ගියා. ගුරු-දෙගුරු සංගම්වලින්, කාන්තා සමිතිවලින් නියෝජිතයන් පැමිණ සිටියා. ඒ අතරම ප්‍රදේශයේ ගම්බද මහජනතාව පැමිණ සිටියා. ආරාධනයක් අනුව එහි ගියා මිස එක්සත් ජාතික පක්ෂයේ ශාඛාවක් ඇති කිරීමට නොවෙයි මා ගියේ. එවැන්නක් පිහිටුවේ නැති බව මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි.

**ආරියදාස මයා.**
(திரு. ஆரியதாச)
(Mr. Ariyadasa)
මා එය පිළිගන්නවා.

ගම්වලට පිවිසෙන මාර්ග වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීම

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
මා කවදාවත් ආණ්ඩුවේ ගොඩනැගිල්ලක් එක්සත් ජාතික පක්ෂයේ ශාඛාවක් පිහිටුවීමට ප්‍රයෝජනයට ගන්නේ නැහැ. රජයේ ගොඩනැගිල්ලක එවැනි දෙයක් කරන්නේ නැහැ. ප්‍රදේශයේ මහජනතාව මට කීවා, ඒ අයට ඇති නොයෙක් දුෂ්කරතාවන් ගැන. හදිසියෙන්ම වාගෙයි මා ඒ ප්‍රදේශයට ගියේ. ඉන්ජිනේරු මහතකුවත් මා සමග ගියේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමා මට නියම කර තිබෙනවා, කෘෂිකර්ම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා, කෘෂිකර්ම ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා ගම්බද ප්‍රදේශවලට ඉතා ඉක්මනින් අවශ්‍යව ඇති පාරවල් සෑදීමට පියවර ගන්නටය කියා. වැලිමඩ, බණ්ඩාරවෙල ආසනවලට මා ගියා. ඒ හැර නොයෙකුත් ආසනවලට මා යනවා. අපේ රජයේ කෘෂිකාර්මික වැඩ පිළිවෙළින්ම නියම ප්‍රයෝජන ලබන්න නම්, වෙළඳපළට කරෙන් ද්‍රව්‍ය ගෙන එනවා වෙනුවට කරත්තවලින්, ලොරිවලින් ගෙන ඒමට අවශ්‍ය මාර්ග සකස් කර දිය යුතුමයි. එම නිසා අපේ පළාත්පාලන ගරු ඇමතිතුමා කීවා වගේම මෙයට මාස දෙකකට පමණ පෙර ගරු අගමැතිතුමා සමග මාත් මගේ අමාත්‍යාංශයේ නිලධාරීනුත් සාකච්ඡා කළා. ගරු අගමැතිතුමා මට උපදෙස් දුන්නා, අමාත්‍යාංශ තුනක් සම්බන්ධ කර කාරක සභාවක් පත් කරන්න. ඒ අනුව, රජයේ වැඩ පිළිබඳ අධ්‍යක්ෂවරයා මගේ අමාත්‍යාංශයෙනුත්, භාණ්ඩාගාරයෙන් එක් නිලධාරියෙකුත්, ගරු අගමැතිතුමාගේ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් එක් නිලධාරියකුත් යන ආකාරයට නිලධාරීන් තුන් දෙනකුගෙන් යුක්ත කාරක සභාවක් පත් කර තිබෙනවා. සභාපති වශයෙන් ක්‍රියා කරන්නේ රජයේ වැඩ පිළිබඳ අධ්‍යක්ෂවරයායි.

අපේ අදහසක් තිබෙනවා, අඩු ගණනේ සැතපුම් දහසක ප්‍රමාණයක් ගම්බද පාරවල් දියුණු කරන්න. එසේ කරන්නේ සැලැස්මක් අනුවයි. කෘෂිකර්ම ව්‍යාපාරය දියුණු වේගෙන යන හපුතලේ, වැලිමඩ, ආදී ප්‍රදේශවලින් [බාධාකිරීමක්]—අවුරුදු තුනකින් මෙම සැලැස්ම සම්පූර්ණයෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මොන්ටේගු ජයවික්‍රම]

ක්‍රියාත්මක කරන්න පුළුවන් යයි අප විශ්වාස කරනවා. මා කලින් කී ලෙස අප සැලැස්මක් අනුවයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නෙ. ඒ ඒ ප්‍රදේශවල දිසාපතිවරුන්ගෙන් දැනටමත් ලබාගෙන තිබෙනවා, කෘෂිකර්ම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ඉතාමත්ම ඉක්මනින් සකස් කළ යුතු මාර්ගවල ලැයිස්තුවක්. මෙම කාරක සභාව ඒ ලැයිස්තුව විමසා බලා, ඉතා මත්ම අවශ්‍ය යයි හැඟෙන සැතපුම් දහසක ප්‍රදේශය තෝරා ගෙන අමාත්‍යාංශයට දන් වනවා. ඒ පිළිබඳව තක්සේරුවක් කර, ඉන් පසුව පළාත් පාලන ඇමතිතුමාත් සමග සාකච්ඡා කරනවා. පළාත් පාලන ඇමතිතුමාත් සමග සාකච්ඡා කරන්නේ විශේෂයෙන්ම මෙම පාරවල් අයත් වන්නේ ගම්කාර්ය සභා ප්‍රදේශවලට නිසයි. පළාත් පාලන ඇමතිතුමාත් සමග සාකච්ඡා කර ගරු මුදල් ඇමතිතුමාවත් කැඳවා ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් නැවත වරක් සාකච්ඡා කර මුදල් අනුමත කර ගෙන වැඩ කටයුතු අරඹනවා. මේ සඳහා සෑහෙන මුදලක් වෙන් කර ගන්න අපට අපහසුවක් වන්නේ නැහැ. මා අදහස් කරන හැටියට අවුරුද්දකට සැතපුම් තුන් හාර සියයක් සකස් කරන්න පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෑම මන්ත්‍රීවරයකුම පාහේ යෝජනා කරන්නේ සෑම මාර්ගයක්ම ගල් දමා, තාර දමා සකස් කර දෙන ලෙසයි. නමුත් අපේ රත්මලාන, රසායනාගාරයේ දැනට තාර ගෙන යන පර්යේෂණ තරඹන ලෙස මා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ටත් ආරාධනා කරනවා. දැනට කර ගෙන යන සාර්ථක වූ අත්හදාබැලීම් අනුව හුණුයි—බොරලුයි මිශ්‍ර කර මාර්ගවලට යෙදීමෙන් කලක් පවතින අන්දමට මාර්ග සකස් කර ගන්න පුළුවනි. ඊට උඩින් තාරත් දම නවා. කිසිම කරදරයක් නැතුව අවුරුදු 8 ක් 10 ක් ගාලු පාර වාගෙ පාවිච්චි කරන් නට පුළුවනි. කරුණාකර මේ තත්ත්වය ගොස් බලන්නැයි මා තමුන්නාන්සේලා ගෙන් ඉල්ලා සිටිනවා. අපේ කෘෂිකර්ම සැලැස්ම සියයට සියයක්ම හරි යන්නේ දුප්පත් ගම්බද ජනතාවට තමන් නිපද වන කෘෂිකර්ම ද්‍රව්‍ය ගම්වල සිට නගරබද වෙළඳ සැල්වලට කරදරයක් නැතුව ගෙන එන්නට පුළුවන් වන අවස්ථාව පැමිණි පසුයි. ඒ සැලැස්ම අනුවයි අපි කටයුතු කරන්නේ. මා විශේෂයෙන් හපුතලේ ආසනයට ගොස් පාරක් දෙකක් හැඳුවොට තරහ වන්නට එපාය කියා හපුතලේ ගරු මන්ත්‍රීතුමාට (ආරියදාස මයා.) මා කියා සිටි නවා.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

අළුතෙන් පටන් ගන්න.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

මා සේරම පාරවල් බලන්නට ගියා. [බාධාකිරීමක්] දෙහිඕවිට ආසනයටත් එන්නම්. අද ගම්බද මහජනතාව පුළ පුළා බලා සිටින්නේ තමන් නිපදවන කෘෂිකර්ම ද්‍රව්‍ය නගරබද වෙළඳ සැල්ව ලට ගෙන ඒමේ පහසුව සැලසෙන තුරුයි. ඉතින් අර අන්දමේ විශෙෂයක් හපු තලේ ආසනයට කරනවායයි මා සමග තරහ වන්නට නම් එපා. තමුන්නාන් සේලා විසින් කියන ලද පාරවල් සේරම මා තමයි දැන් හදාගෙන යන්නෙ. ඉස් සර කිසිම හැදිල්ලක් තිබුණේ නැහැ. සැතපුම් කාල බාගෙ තමයි හදා තිබුණේ. [බාධාකිරීමක්] මා එපායැ බෙදන්න. සම හර උදවියට කොතරම් බෙදුවත් මදියි කියනවා. සමහර උදවියට ලක්ෂ 5, 6 බෙදුවත් උදේ සිට හැන්දෑ වන තුරුම කෙඳිරි ගානවා. කාටත් සාධාරණව බෙදිය යුතුයි.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

මහියංගන කොට්ඨාශයේ සැතපුම් 15ක් දුර ස්ථානයකට අවුරුදු 3 ක් යන තුරුත් ටෙලිෆෝන් එකක් හම්බ වුණේ නැහැ. එහෙත් මේ ඇමතිතුමා බොහොම ඉක්මනට මගේ කොට්ඨාශයට ටෙලි ෆෝන් දුන්නා. 5 වන ටෙලිෆෝනයත් දමා ආවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
මේ මන්ත්‍රීතුමා උපන්නේ රත්කරව්වෙයි. ඒ පළාතේ මන්ත්‍රීතුමා මීට මාස 6 කට පමණ පෙර මාව කැඳවා රත්කරව්වේ ටෙලිෆෝන් නයක් විවෘත්ත කළා. ඉතින් මා මොකද කරන්නෙ?

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)
තමුන්නාන්සේට එතනදි වැරදීමක් වුණු බව පෙනෙනවා. ඒක දැම්මේ හපුතලේ ආසනයේය කියා සිතාගෙනයි: පස්සෙයි දැනගත්තේ වැලිමඩ බව.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
මුන්නැගේ ඉපදුනේ රත්කරව්වේ බවත් රත්කරව්ව වැලිමඩ ආසනයට අයිති බවත් මා දන්නවා. වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (පර්සි සමරවීර මයා.) තමයි මගෙන් එම ඉල්ලීම කළේ. එම නිසා ඒක දුන්නා.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)
හපුතලේට තව 10ක් දෙන්න.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
හොඳයි, ඒව දෙන්න මා ලෑස්තියි.

අ. භා. 6.58

**ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදුව)
*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபறாதுவ)*
(Mr. Prins Gunasekera—Habaraduwa)
මා නැගී සිටින්නේ කිසිම ඇමතිවරයකුට චෝදනාවක් කරන්නවත් විවාදයකට සහභාගි වී තර්ක විතර්ක ඉදිරිපත් කරන්නවත් නොවෙයි. පුද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා සාකච්ඡාවට භාජන වන අද දින හැන්දෑවේ 7ට මිනිත්තු 2ක් වන මේ වේලාව වන තෙක් මන්ත්‍රී මණ්ඩලය තුළ මෙම රැස්වීම පවත්වාගෙන යාමට පුළුවන් වීම නිසා අද මෙම සාකච්ඡාවට සහභාගි වුණු සහ මෙම මන්ත්‍රී මණ්ඩලයට පැමිණි ගරු ඇමතිතුමන්ලාටත් ගරු මන්ත්‍රීවරුන්ටත් මෙම මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් මගේ ස්තුතිය හා ගෞරවය පුද කරන්නටයි මා නැගී සිටින්නේ. පසුගිය අවුරුදු තුන හමාර තුළ එක් දිනකවත්, පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ එක් දිනකවත් හිරු බැස යන තෙක් මේ මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම පවත්වාගෙන යන්නට බැරි වුණා. අපේ ස්ථාවර නියෝගවලට අනුව න්‍යාය පත්‍රයේ සාකච්ඡාවට ගත යුතුව තිබෙන යෝජනාවක් ගැන කලින් සාකච්ඡා කරන්නට බැරි බව මා දන්නවා. නමුත් 43 වන යෝජනාව ගැන සඳහන් කිරීමට පමණක් මට අවසර දෙන්න.

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*
(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)
ඒ කොහොමද?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
විවාද කරන්නට නොවෙයි. මගේ කථාව ආරම්භයේදීම මේ මන්ත්‍රී මණ්ඩලයේ තමුන්නාන්සේලාට මා ස්තුති කළේ එක්තරා කාරණයකටයි. මේ දක්වා පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ දිනය පිළිබඳව තිබුණු කණගාටුදායක තත්ත්වය නිසා මා පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ දිනය නැති කරන්නට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. 43 වන අංකය යටතේ තිබෙන්නේ එම යෝජනාවයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
To take it out of turn?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නැහැ. ඒක අරගෙන විවාද කරන්නට නොවෙයි; යන්තම් සඳහන් කිරීමට පමණයි.

එතැනට ආවාම මන්ත්‍රී මණ්ඩලයේ අවසරය ඇතිව ඒක ඉල්ලා අස් කර ගන්නට හෝ ඒ ගැන වෙනයම් වුවමනා දෙයක් කරන්නට පුළුවනි. නමුත් මා නැගී සිටියේ මෙපමණ කාලයක් තිස්සේ කණගාටුදායක තත්ත්වයක් පැන නැගී තිබුණත් අද පැන නැගුණු අළුත් තත්ත්වය ගැන සඳහන් කිරීමටයි. රජයේ වැඩ ඇමති තුමා යනවා. එතුමා තව ටිකක් සිටිනවා නම් මා බොහොම සතුටු වෙනවා.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

ගමනක් යන්නට තිබෙනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

හපුතලේ යන්නද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගෙත්, මාතර ගරු මන්ත්‍රීතුමාගෙත් (තුඩාවේ මයා.) දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙත් (වී. බී. තෙන්නකෝන් මයා.) නම්වලින් තිබෙන 43 වන යෝජනාව කියවෙන්නේ මෙහෙමයි:

"අංක 21 දරණ සථාවර නියෝගය සංශෝධනය කිරීම,—පෞද්ගලික මන්ත්‍රීන්ගේ කටයුතු සඳහා වෙන්කර ඇති දිනයේදී ගණපූරණයක් පවා නොලද හැකි තැනට අද කටයුතු සිදුවී ඇති බැවින්ද, ඒ සඳහා විශේෂ දිනයක් වෙන්කිරීම මහජන මුදල් නාස්තියක් බැවින්ද, වෙන කිසියම් ප්‍රයෝජනවත් පොදු කාරියකට එම දිනය යෙදවිය හැකි බැවින්ද, පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාද ඉදිරිපත් කිරීමේ දින වකවානුවට අනු පිළිවෙලින් න්‍යාය පත්‍රයට ඇතුළත් කොට මන්ත්‍රී මණ්ඩලයෙන් සෙසු වැඩ ක්ටයුතුද සමග සලකා බලන පරිදි 21(6) වෙනි නියෝගය සහමුලින්ම ඉවත්කර සථාවර නියෝගය සංශෝධනය කළ යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

මෙම යෝජනාව ගෙනෙන්නට හේතුව මන්ත්‍රී මණ්ඩලයේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ දිනයේදී කවදාවත් නියමිත වේලාව වන තුරු රැස්වීම පවත්වාගෙන යන්නට බැරි වූ නිසයි. නමුත් අද ඉතිහාසගත වන දිනයක්, වාර්තාගත වන දිනයක් හැටියට සලකන්නට පුළුවනි.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

විරුද්ධ පක්ෂයේ පසුපස ආසනවල කවුරුවත් නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඔව්. විරුද්ධ පක්ෂයේ පසුපස ආසනවල මන්ත්‍රීවරුන් කිසිවකුත් නැති බව ඇත්තයි. නමුත් ඔබතුමාට මතක ඇති මා ඊයේ කළ ඉල්ලීම. දෙපක්ෂයේම සහයෝගය ඇතිව ගණපූරණය තබාගෙන පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා ගැන සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්නය කියා මා ඊයේ පක්ෂ නායකයින්ගේ රැස්වීමේදී ඉල්ලීමක් කළා. ඒ රැස්වීමේදී ඒ ගැන තීරණයක් ගන්නට බැරි වුණා. නමුත් අප ඉදිරිපත් කළ ඒ අදහස ගැන සැලකිල්ලක් දක්වා අද මන්ත්‍රී මණ්ඩලයේ ගණපූරණයක් නැතත් ඒ බව මූලාසනයේ අවධානයට ලක් නොකොට මේ සාකච්ඡාව දිගටම ගෙන යන්නට ඉඩ හැරීමට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් වීම ගැන අප සතුටු වෙනවා. ඒ මූලික කාරණය ගැන සඳහන් කරමින් දැන් විවාද වෙමින් පවතින යෝජනාව යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මා අදහස් කරනවා.

රජයේ වැඩ ඇමතිතුමාට මා ආරාධනයක් කරනන්ටයි සිටියෙ. "හපුතලේ අලුතෙන් වඩින්නට යන කතරගම දේවාලෙ ටිකක් අමතක කරන්න. ඔය දේවාලෙ වඩින්න ඔපමණ ඈත යන්න එපා, එතුමා හොඳට දන්න හඳුනන හබරාදුවට එන්න" ය කියා මා රජයේ වැඩ ඇමතිතුමාට පෞද්ගලික ආරාධනයක් කරන්නටයි සිතාගෙන සිටියෙ. ඕනෑ දේවාලයක් හරි ගස්සා දෙන්නම්. උන්නැහේ කැමති විධියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගම්වලට පිවිසෙන මාර්ග වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීම

වදින්න පුදන්න දේවාලයක් හරි ගස්සා දෙන්නම්. ඔය හපුතලේ වාගේ නගින්න බැරි කඳු නගින්න යන්න ඕනෑ නැහැ. උන්නැහේ කිව්වා, එක පාරට නැග්ගොත් ඉක්මනට බහින්නත් ඕනෑය කියා. උන්නැහේගේ ආසනය අල්ලපු ආසනය වූ වැලිගමයි. [බාධාකිරීම්] මේ ඇමතිවරුන් යම් යම් ආසනවල සංචාරය සඳහා යෑම නිසා ඒ පළාත්වලට ටැලිපෝන් සේවා ලැබෙනවා නම්, උන්නැහේලා ගමන් කරන පාරවලට තාර වැටෙනවා නම්, උන්නැහේලා යන ප්‍රදේශවලට වෙනත් මොන විධියක හෝ සංවර්ධනයක් දියුණුවක් යහපතක් ඇති වෙනවා නම් මේ වර්තමාන කැබිනට් මණ්ඩලයේ ඒ ඒ ඇමතිවරුන්ට මා බුලත් දී ආරාධනා කරනවා, කරුණාකර හබරාදුව ආසනයටත් වඩින්නය කියා. ඕනෑම දේවාලයක් වඩින්න. ඕනෑම පාරක ගමන් කරන්න. ඕනෑම කුඹුරකට බැස පැළ සිටුවන්න; වල් නෙළන්න. වප් මඟුල්වලට සහභාගි වෙන්න. ඕනෑම දෙයක් කරන්න.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
කෝ ආරාධනාවක් නැහැ නෙ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)
ආරාධනා කරන්නම්. මා දැන් මේ කරන්නේ පොදුවේ කරන ආරාධනයක්. ගරු පළාත් පාලන ඇමතිතුමා එතුමාගේ කථාවේදී සමාජවාදය පිළිබඳව අලුත් විග්‍රහයක් කළා. මා ඒ ගැන රණ්ඩු වෙන්න යන්නේ නැහැ. ඒක අපට වෙන තැනකදී වෙන වෙලාවක කරන්න පුළුවන්. වතුර, පාරවල්, විදුලි එළිය යන තුන සම්පූර්ණ වුණාම සමාජවාදය බිහිවෙනවාය කියා එතුමා කිව්වා. ඒත් කමක් නැහැ. ඒ සමාජවාදය කරුණාකර හබරාදුවටත් දෙන්න. සමාජවාදය අංග සම්පූර්ණ වුණේ නැහැ කියා මා රණ්ඩු වෙන්න යන්නෙ නැහැ. බඩගින්නෙ ඉන්න සමාජවාදයක් වෙන්න ඇති, වතුර බිබී විදුලි එළියෙන් පාර දිගේ ගමන් කරන සමාජවාදය.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)
නිෂ්පාදනයත් ඇති වෙනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)
ඔව්, නිෂ්පාදනයත් ඇති වෙන්න පුළුවන්. සමහර විට එක්සත් ජාතික පක්ෂයේ සමාජවාදයට මේ අංග තුන පමණක් ප්‍රමාණවත්ය කියා සිතන නිසා වෙන්න ඇති හාල් සේරු දෙක එකක් කර කන්න නොදී සමාජවාදය කරන්නේ.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)
දැන් අපේ හාල්. සිංහල හාල්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)
මා ඒ ගැන රණ්ඩු වෙන්න යන්නේ නැහැ. මේ තුන මට ඇති. කරුණාකර මේ වර්තමාන රජය විශ්වාස කරන ඒ සමාජවාදයටත් අපේ පළාත්වලට ලබා දෙන්නට පියවරක් ගන්නවා නම් මා ඒ ප්‍රමාණයෙන් සන්තෝෂයට පත් වෙනවා.

පළාත් පාලන ඇමතිතුමා සහ රජයේ වැඩ ඇමතිතුමා යන දෙන්නම එකතු වී පාරවල් පිළිබඳ ප්‍රශ්නය විසඳීමට ගන්නා පියවර ගැන මට ප්‍රථම වතාවට අසන්න ලැබුණේ අදයි. ඒ පියවරෙන්වත් ගම්බද දියුණුවට සෑහෙන රුකුලක් ලැබෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමනි, මින් පෙර කවදාවත් නොවූ විරූ තරම් උනන්දුවකින් මෙම ආණ්ඩුවේ ඇමතිවරුන් පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා පිළිබඳව කරුණු ගෙන හැර දක්වා පිළිතුරු දුන්නා. මේ තරම් සැලකිල්ලක් දක්වා මෙම විවාදයට එතුමන්ලා සහභාගි වුණා වාගේම මෙම යෝජනාවල අඩංගු ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහාත් එතුමන්ලාගේ සහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
යෝගය විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ටත් ලැබෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ලබන සතියේ කිසියම් දවසක පළාත් පාලන ඇමතිතුමා අපේ ප්‍රදේශයේ යම් කිසි සාකච්ඡාවකට එන බව මට දන්වා තිබෙනවා. එම සාකච්ඡාවේදී ඒ ප්‍රදේශයේ අඩුපාඩුකම් එතුමාට දන්වන්නය කියා අපෙන් ඉල්ලා තිබෙනවා. එම නිසා මේ අවස්ථාවේදී පළාතේ අවශ්‍යතාවන් ගැන කියන්නට මා අදහස් කරන්නේ නැහැ. අද මේ පෞද්ගලික මන්ත්‍රීන්ගේ දිනයේදී ආණ්ඩු පක්ෂයේ ඉදිරි අසුන්වල සිටින ගරු ඇමතිවරුන් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන්ගේ යෝජනාවන් විෂයෙහි දැක්වූ සැලකිල්ලටත් වැඩි සැලකිල්ලක් ඒ යෝනාවන් ක්‍රියාවට නැගීමේදී දක්වනවා ඇත කියන බලාපොරොත්තුවෙන් එතුමන්ලාට මම නැවත වරක් ස්තුති කරනවා.

අ. භා. 7.9

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
**(Mr. Weerasekera)**
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිවරුන්ටත්, පාර්ලිමේන්තු ලේකම්වරුන්ටත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් මේ ඓතිහාසික සිද්ධිය ඇති කිරීමට සහයෝගය දැක්වීම සම්බන්ධයෙන් මා මගේ කථාව පටන් ගැනීමේදී ස්තුතිය පුද කරන්නට කැමතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන ඇමතිතුමා එකල පාර්ලිමේන්තු ලේකම් වශයෙන් මගේ කොට්ඨාශයේ ගම්සභා කාර්යාලයක් විවෘත කරන්නට ගිය අවස්ථාවේදී තමයි, ප්‍රථමවරට මේ අළුත් සැලැස්ම ගැන විස්තර සහිතව ප්‍රසිද්ධ කථාවක් කරන්නට යෙදුණේ. එතුමා ඒ අවස්ථාවේදී අදහස් දෙකක් ඉදිරිපත් කළා. ඉන් එකක් පාරවල් පිළිබඳවයි. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට ගම්සභා පාරවල් පවරා දෙන්නට බැරි නම්, ගම්සභාවලට විශේෂ මුදලක් ලබා දී ගම්කාර්ය සභා මාර්ගයෙන් ඒවා සකස් කරන්ට ක්‍රමයක් යොදන බව එතුමා කිව්වා. මා ඒ ගැන බොහොම සන්තෝෂ වුණා. ඕවර්සියර් ක්‍රමයෙන් තොරව, මහජන ඡන්දයෙන් තෝරන නියෝජිතයන් මගින් මේ කටයුතු කිරීමේදී—අඩු වශයෙන් ඡන්දය නොලැබෙයි කියන භයෙන් හෝ—ඕවර්සියර් ක්‍රමයෙන් සිදුවන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් වැඩ ඒ මුදල්වලින් කර ගැනීමට පුළුවන්ය කියන අදහසිනුයි මේ ක්‍රමය ක්‍රියාත්මක කරන්නට යන්නේ. ඇමතිතුමා තව එකක් කිව්වා. ගම්කාර්ය සභාවලට මුදල් දීමේදී ලොකු අඩුපාඩුවක් සිදු වී තිබෙනවා. ලොකු පළාත් පාලන ආයතනවලටත්, කුඩා පළාත් පාලන ආයතනවලටත්, දියුණු ඒවාටත්, නොදියුණු ඒවාටත් එක සමාන මුදලක් දීම නිසා දියුණු පළාත් පාලන ආයතනවල තත්ත්වය තවත් දියුණුවන අතර නොදියුණු පළාත් පාලන ආයතනවල තත්ත්වය තවත්——

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
**(The Hon. Premadasa)**
ඒක වෙනස් කළා.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
**(Mr. Weerasekera)**
පළමුවර ඒ ප්‍රකාශය කරන අවස්ථාවේදී සිටි කෙනෙකු හැටියට ඇමති පදවියට පත්වීමෙන් පසුව ඒ පොරොන්දුව ඉටු කිරීම ගැන මා සන්තෝෂ වෙනවා. මේ මාසයේ 17 වෙනිදා අපේ ප්‍රදේශයටත් ගරු ඇමතිතුමා පැමිණෙන්නට අදහස් කරන නිසා අපේ ප්‍රදේශවල අඩුපාඩුකම් ඒ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඇමතිතුමා කොතරම් හොඳින් කථා කළත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ මෙතෙක් සිදු වී තිබෙන ආකාරය ගැන කල්පනා කරන විට මට මගේ අදහස් වෙනස් කරන්නට පුළුවන්කමක් නැහැ. ඇමතිතුමා අද ප්‍රකාශ කළ අදහස් උඩත්, අගමැතිතුමාගේ නායකත්වයෙන් ඇතිවන අළුත් ක්‍රම අනුවත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කටයුතු මීට වඩා හොඳින් සිදු වෙයි කියන බලාපොරොත්තුව උඩ ඒ දෙපාර්තමේන්තුව අද මා විවේචනය කරන්නට අදහස් කරන්නේ නැහැ. එහෙත් එක පාරක් ගැන පමණක් මතක් කරන්ට ඕනෑ. 17 වෙනිදා ගරු ඇමතිතුමා කෑගලු දිස්ත්‍රික්කයට ආවාම මගේ ආසනයේ අඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාඩු ඉදිරිපත් කරන්නට මා අදහස් කර නවා. එහෙත් මම නියෝජනය කරන දෙහි වල-ගල්කිස්ස නගර සභා සීමාව තුළ තිබෙන ප්‍රශ්නයක් මතක් කළයුතුව තිබෙනවා. ගාලු පාරේ සිටි කළුබෝවිල ඉස් පිරිතාලයට යන "ඉස්පිරිතාල පාර" කියන පාර පළල් කිරීම කර තිබෙන්නේ පුදුමා කාර විධියටයි. මේක රජයේ වැඩ දෙපාර්ත මේන්තුවට අයිති පාරක්. පාර පළල් කිරී මේදී පාර දෙපස තිබුණු පදික වේදිකා නැති කර කානුත් වසා දමා තිබෙනවා. දැන් අතුරු මාවත්වලින් ගලා එන වතුර ඔක් කොම එන්නේ ඒ පාරටයි. ඒ පාර දැන් කානුවක් බවට පත්වෙලයි තිබෙන්නේ. ගන්දස්සාරෙ පාරෙ යන්නට බැරි තත්ත් වයක් තිබෙනවා. ඒ මදිවාට ඉස්පිරිතාල යේ ජරා වතුරත් ඒ පාර දිගේ ගාලු පාර දක්වා ගලනවා. මේක ඉතා වැදගත් ප්‍රශ් නයක්. නගර සභාවෙනුත් කරුණු ඉදිරිපත් කර තිබුණු නමුත් එයිනුත් කිසිම ප්‍රයෝ ජනයක් ලැබී නැහැ. මෙවැනි දේවල් ප්‍රමාද කරන්නට පුළුවන්කමක් නැහැ. මහජන යාගේ සෞඛ්‍ය තත්ත්වයට බල පාන දේ වල් එයින් මතු වෙනවා. ඒ නිසා ඒ සම් බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කර දෙන් නට ඕනෑ. මෙය හදිසි ප්‍රශ්නයක් හැටියට සලකා ඉක්මනින් ක්‍රියා කරන්නැයි දැන් මෙහි සිටින මේ ඇමතිතුමාගේ මාර්ගයෙන් ඒ ඇමතිතුමාට මතක් කරන්නට කැම තියි. මේ ගැන අප්‍රමාදව සොයා බලා කට යුතු කරන්නැයි මා ඉල්ලා සිටිනවා. ඉස් පිරිතාලය දක්වා පාර පළල් කර තිබෙන වා. ඉන් එහාට පාර පටුයි. කොහුවල හන් දියට යන පාර පටුයි. ඒ නිසා බස් රිය ධාවනය කරන්නෙත් බොහොම අමාරුවෙ නුයි. ඒ කොටස පළල් නොකළොත් පළල් කළ කොටසිනුත් නියම ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. ඒ ගැන ක්‍රියා කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ඕවර්සියර් ක්‍රමය නවත්වන්නට දැන් කාලය පැමිණ තිබෙන බව කවුරුත් පිළිගන්නවා. දැනටමත් එය ප්‍රමාද කළා වැඩියි. රජයේ වැඩ දෙපාර්තමේන්තුව යම් යම් වැඩ සඳහා කොයි තරම් මුදල් වෙන් කළත්, ඕවර්සියර් ක්‍රමය නැති කරන්නේ නැත්නම් ඒ වෙන් කරන මුදලින් නියම ප්‍රයෝජනයක් ගන්නට පුළුවන් වෙතැයි මා නම් හිතන්නේ නැහැ. ඕවර්සියර් ක්‍රමය නැති කර රුපියල් දෙසියයක් ඔය නවා නම් එය ඕවර්සියර් ක්‍රමය තිබියදී රුපියල් විසිදාහක් දෙනවාට වඩා හොඳයි කියන්නට පුළුවනි. ඕවර්සියර් ක්‍රමයෙන් තොරව වැඩ කරන්නට පටන් ගත්තොත් ඉතා විශාල වැඩ ප්‍රමාණයක් කරවා ගන් නට ඒ මුදලින්ම පුළුවන් වේවි. රජය පටන් ගන්න සංවර්ධන වැඩ වෙනුවෙන් අපේ සම්පූර්ණ සහයෝගය දෙන්නට සැම වේලාවේම අප ලෑස්තියෙන් සිටින බව කියන්නට කැමතියි. අප විරුද්ධ පාර්ශ්ව යේ මන්ත්‍රීන් වුවත් රජයේ සංවර්ධන වැඩ වලදී ඒවා කඩාකප්පල් වන ආකාරයට කටයුතු කරන්නේ නැහැ. අප පිළිගන්න මතය අනුව රට හදන්නටයි අපත් උත්සාහ කරන්නේ. රට හදන්නට ගන්න උත්සා හයේදී විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය සම්පූර්ණයෙන්ම රජයට ලැබෙනවා. ඕවර් සියර් ක්‍රමය වෙනස් කර අලුත් ක්‍රමයක් ඇති කර ඒ මගින් ගම්කාර්ය සභා යටතේ තිබෙන පාරවල් හෝ වේවා, රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් පාලනය කරනු ලබන පාරවල් හෝ වේවා, වැඩි දියුණු කර මින් රට දියුණු කරන්නට රජය ගන්න යම් පියවරක් වේනොත් ඊට විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය දෙන බව පොරොන්දුවක් හැටියට ඉදිරිපත් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு பிரேரணை ஏற்றுக்கொள்ளப் பட்டது.*

*Question put, and agreed to.*

## නොදියුණු පෙදෙස්වල පාසැල්වලට ගුරුවරියන් හා ඉංග්‍රීසි ගුරුවරු

*முன்னேற்றமடையாத பகுதிகளிலுள்ள பாடசாலைகளுக்கு ஆங்கில ஆசிரியர் களும் ஆசிரியைகளும்*

## ENGLISH TEACHERS AND LADY TEACHERS FOR SCHOOLS IN BACKWARD AREAS

අ. භා. 7.15

**ඉරත්තිනම් මයා.**

*(திரு. இரத்தினம்)*

(Mr. Ratnam)

*உப சபாநாயகரவர்களே, இன்னுமொரு பிரேரணை என்னுடைய பெயரிலேயிருக்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉරත්තිනම් මයා.]

கின்றது. இதுபற்றி நான் அதிக நேரம் விளக்க வேண்டியிருக்கிறது. பிரேரணை வருமாறு :

"இலங்கையில் முன்னேற்றமடையாத பகுதிகளிலுள்ள பாடசாலைகள் ஒவ்வொன்றுக்கும் மாணவர்களின் தொகையைக் கருதாமல் ஓர் ஆங்கில உதவி ஆசிரியரும் ஓர் ஆசிரியையும் உடனே நியமிக்கப்படல் வேண்டுமென இச்சபை கருதுகிறது."

கிராமப் புறங்களிலே உள்ள மக்கள் போதிய வாய்ப்புக்கள் இல்லாதிருப்பதன் காரணமாகவே நான் இப்பிரேரணையை இச்சபையில் சமர்ப்பிக்கின்றேன். ஓர் ஆசிரியர் ஒரு பாடசாலையிலே கற்பிக்க வேண்டுமானால், 27 வரவுச் சராசரி இருக்க வேண்டுமென்று விதிக்கப்பட்டிருக்கிறது. இதனால் சில பள்ளிக்கூடங்களிலே ஓர் ஆசிரியர் மட்டுமே இருக்கிறார். அத்தகைய பள்ளிக்கூடங்களிலே நான்காம் அல்லது ஐந்தாம் வகுப்புகளிலே படிக்கின்ற பெண்பிள்ளைகள்கூட ஒரு கிழிந்த துணியைத் தைக்க முடியாத நிலையிலே படிக்க வருகிறார்கள். இத்தகைய கிராமப் புறங்களிலே, ஒரு பெண்பிள்ளை அதன் கிழிந்த துணியைத் தைக்க முடியாத நிலையிலே பள்ளிக்கூடம் வருகின்ற சூழல் இருக்குமானால் இதைப்பற்றி—இவர்கள் பெறும் கல்வியைப் பற்றி எப்படிச் சொல்வது என்று தான் எனக்குத் தெரியவில்லை. பாடசாலை நிலைபற்றி அவர்களிடம் கேட்டால் ஒரு ஆசிரியர் தான் இருக்கிறார் என்று சொல்லுவார்கள். பத்து ஆசிரியர்கள் அல்லது பதினைந்து ஆசிரியர்கள் இருக்கின்ற பள்ளிக்கூடங்களிலே ஓர் ஆசிரியர் இல்லாவிட்டால் நட்டம் இல்லை. ஆனால், தொகையான பிள்ளைகள் இல்லாத பள்ளிக்கூடங்களுக்கு பெண் ஆசிரியைகள் நியமிக்கப்பட வேண்டியது மிக இன்றியமையாதது.

அடுத்ததாக, ஆங்கில ஆசிரியர்களை நான் கேட்டிருக்கின்றேன். எங்களுடைய எதிர்க்கட்சி நண்பர்கள் ஆங்கிலத்தை வெறுத்துக் கொண்டிருந்தாலுங்கூட இன்று இலங்கை முழுவதும் ஆங்கிலம் ஒரு பிரதான பாடமாகக் கற்பிக்கப்படுகிறது. ஆகவே, பட்டணங்களிலேயும் நகரங்களிலேயுமுள்ள பிள்ளைகள் படித்து முன்னேறும் போது கிராமப் புற மக்கள் ஐந்தாம் வகுப்பு வரையும் ஆங்கிலத்திலே படிக்க வசதியில்லாமல் கஷ்டப்படுகிறார்கள். தப்பித் தவறி ஒரு மகா வித்தியாலயத்துக்குப் போய்விட்டால், அங்கேயும் படிக்க முடியாத நிலையிலேயிருக்கிறார்கள். ஆங்கிலம் இப்பொது ஏற்றுக் கொள்ளப்பட்டிருக்கின்ற கொள்கையின் அடிப்படையிலே பட்டணங்களிலேயும் நகரங்களிலேயுமிருக்கின்ற வாய்ப்புக்கள் கிராமப் புற மக்களுக்கு வழங்கப்பட வேண்டுமென்ற பரந்த நோக்கத்துடன்தான் இதை நான் எடுத்துக் கூற விரும்புகிறேன். பெரிய பட்டணங்களிலே ஆசிரியர்கள் குறைவாக இருந்தாலும் கூட அது அந்தப் பாடசாலைகளிலேயுள்ள கல்வித் தரத்தைச் சிறிதும் பாதிக்காது. சிறிய பாடசாலைகளிலே 27 பிள்ளைகள் இல்லாதபடியால் —வரவுச் சராசரியில்லாதபடியால்— ஆசிரியர்களை நியமிக்க முடியாதென்றிருக்கின்ற அந்தக் குறையை நீக்கி, அங்கே ஓர் ஆசிரியை கற்பிக்கக்கூடியதாகச் செய்து பாடசாலைகள் எல்லாவற்றுக்கும் வேண்டிய வசதிகளைச் செய்துகொடுத்தால்தான் கல்வித்துறையிலே எல்லா மக்களுக்கும் ஒரு சமத்துவத்தை நாங்கள் கொடுத்தவர்களாக இருப்போம். எல்லாத் தொகுதிகளிலேயுமுள்ள மக்களின் குறைகளை இப்பிரேரணையின் மூலம் இச்சபையிலே எடுத்துக்கூறுவதற்காகத்தான் நான் இப்பிரேரணையையும் இச்சபையில் சமர்ப்பித்தேன். எனவே, கௌரவ கல்வி அமைச்சரவர்கள் உடனடியாக இதுபற்றிக் கவனித்து வேண்டிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டு எனது உரையை முடிக்கின்றேன்.

අ. භා. 7.18

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

*(திரு. பிறின்ஸ் குணசேக்கர)*

(Mr. Prins Gunasekera)

කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙන යෝජනාව ඉතාම ප්‍රශංසනීයයි. එසේ වුවත්, මෙහි පොඩි වෙනසක් කරන්නට එතුමා කැමති වෙනවා නම් අප වඩාත් සන්තෝෂ වෙනවා. යෝජනාවෙන් කියැවෙන්නේ, "දිවයිනේ නොදියුණු පෙදෙස්වල පිහිටි සෑම පාසලකටම, එම පාසලට පැමිණෙන ළමුන් සංඛ්‍යාව ගැන නොතකා ගුරුවරියක සහ ඉංග්‍රීසි උප ගුරුවරයකු පත් කළ යුතු" බවයි. ඉංග්‍රීසි ගුරුවරයකු ඒ පළාතට ගෙන්නා ගන්නාට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. මෙම යෝජනාවේ "ගුරුවරියක" යන්නට ඉදිරියෙන් "සිංහල ගුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වරියකත්" යන වචන යෙදීමට කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා කැමති වෙනවාදැයි මා දැන ගන්නට කැමතියි.

**ඉරත්තිනම් මයා.**
*(திரு. இரத்தினம்)*
(Mr. Ratnam)

Add "Tamil" also.—[*Interruption*]. No school can afford to have four English teachers. They are small schools.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මගේ විරුද්ධත්වයක් නැහැ. උතුරු පැත්තෙන් ඕනෑ තරම් ද්‍රවිඩ පාඨශාලාචාර්යවරියන් අපේ පළාත්වලට එවන්න. මගේ පළාතට දෙමළ ඉස්කෝල හාමිනේලා එවනවාට මා බොහෝම කැමතියි. මාත් ඉතා අමාරුවෙන්, තතන තතනා, එක් එක්කෙනාගෙන් අහගෙන මේ ගරු සභාවෙහිදී දෙමළයෙන් කථා කරන්නට උත්සාහ කරනවා. එම නිසා උතුරේ සිටින දෙමළ ඉස්කෝල හාමිනේලා අපේ පළාත්වලට ඇවිත් දෙමළ කථා කරන්නට අපට උගන්වනවාට මා බොහෝම කැමතියි. එහෙම වුණොත්, කල්තියා ලෑස්ති වීමක් නැතිවම තමුන්නාන්සේලාට දෙමළයෙන් පිළිතුරු දෙන්නට අපට පුළුවන් වෙනවා. එම නිසා උතුරු පළාතට සිංහල ගුරුවරියන් ගෙන්වා ගැනීමටත් කැමති වන්න. ඊට විරුද්ධ වන්නට වුවමනාවක් නැහැ. පසුගිය දවස්වල ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය, දෙමළ උදවිය සිංහල ඉගෙනීම ගැන විරුද්ධ වූ නමුත්, එම පක්ෂය වර්තමාන ආණ්ඩුවට බැඳුණාට පසු රාජ්‍ය භාෂාව පිළිගන්නා නිසා ඒ පළාත්වලට සිංහල ඉස්කෝල හාමිනේලා ගෙන්වා ගැනීමට කැමති වන්න. කැමැති නේද? එතුමා පිළිතුරු දෙන විට කියයි. ඒ දවස්වල ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය රජයේ ද්‍රවිඩ සේවකයන් සිංහල ඉගෙනීම ගැන විරුද්ධ වීම නිසා අද එම සේවකයන් කොයිතරම් ලොකු අමාරුවකට වැටී සිටිනවාද ? උතුරට සිංහල ඉස්කෝල හාමිනේලා ගෙන්වා ගන්නට තමුන්නාන්සේලා කැමති වුණොත්, අමාරුවේ වැටී සිටින එම සේවකයන්ටත් එය ලොකු උදව්වක් වෙනවා. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයට ඕනෑ තරම් සිංහල ඉස්කෝල හාමිනේලා අපි දෙන්නම්. ඒ අයට කරදර නොකර, තමුන්නාන්සේලා නිසා අමාරුවේ වැටී සිටින ද්‍රවිඩ සේවකයන්ටත් ද්‍රවිඩ ළමයින්ටත් සිංහල ඉගෙන ගැනීමට පුළුවන් වන අන්දමට මේ යෝජනාව සංශෝධනය කරන ලෙස කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

අ. භා. 7.22

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවෙන් අදහස් කෙරෙන්නේ, ඉංග්‍රීසි භාෂාව ගම්බද දරුවන්ටත් පුළුවන්තරම් දුරට ඉගැන්වීමයි. ඉංග්‍රීසි උගැන්වීම පිළිබඳව රජයේ ප්‍රතිපත්තිය කුමක්ද යන වග මෙම ගරු සභාවෙහිදී ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් නොයෙක් අවස්ථාවලදී පැහැදිලි කර දී තිබෙනවා. සෑම ගමකම සෑම පාඨශාලාවකටම ඉංග්‍රීසි ගුරු මහත්වරුන් ලබා දීමයි රජයේ අදහස. ඒ කොයි හැටි වෙතත් අමාරුකම වෙලා තියෙන්නේ කට යුත්තට වුවමනා ගුරුවරුන් සොයා ගැනීම සම්බන්ධයෙනුයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

වයස් සීමාව වෙනස් කළොත් සොයා ගන්නට පුළුවන් වේවි.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ඔව්, ඒ ගැනත් අපි කල්පනා කරනවා. විශ්‍රාම ගත් අයවත් සොයා ගන්නට පුළුවන්දැයි කල්පනා කරගෙන යනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒ තරම් දුරට යන්නට කිසිම වුවමනාවක් නැහැ. දැන් නියම කර තිබෙන උපරිම වයස් වන අවුරුදු තිස් පහ වෙනුවට අවුරුදු 40ක් යෙදුවොත් අවශ්‍ය ගුරුවරුන් සොයා ගන්නට පුළුවන් වේවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ඒ ගැනත් සොයා බලන්නට පුළුවනි. එහෙත් අමාරුවකට තිබෙන්නේ මෙයයි. කිලිනොච්චියේ ගරු මන්ත්‍රීතුමා වුවත් මෙය ඉදිරිපත් කර තිබෙන්නේ සමහර විට මෙය තේරුම් අරන් නොවෙන්නට පුළුවනි. ඉංගිරිසි උගන්වන්නට ගුරුවරුන් සොයා ගැනීම අමාරු දෙයක් වෙලා තියෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**
*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*
(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

ඉංගිරිසි මාධ්‍යයෙන් ඉගැන්වීම නතර කළාට පස්සේ ඉංගිරිසි හොඳට දන්න අය සොයා ගැනීම අමාරුයි.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ශිෂ්‍ය ගුරුවරුන් තෝරා ගැනීම සඳහා පසුගිය දා පැවැත්වුණු විභාගයේදී නොයෙක් නොයෙක් අංශවලින් තෝරා ගන්නා සංඛ්‍යාව සීමා කරන්නට සිද්ධ වුණා. විශාල පිරිසක් සිටියා ඒ තනතුරුවලට. එහෙත් ඉංගිරිසි දත් අය සිටියා නම් කිසිම සීමාවක් ඇති කරන්නේ නැතිව ඔවුන් බඳවා ගැනීමට අපේ ගරු ඇමතිතුමා සූදානම් වෙලා සිටියා. ඒ කොයි හැටි වෙතත්, අවශ්‍ය තරම් ඉංගිරිසි දන්නා ගුරුවරුන් සොයා ගන්නට බැරි වුණා. ඊට හේතුව කුමක්දැයි නමුන්නාන්සේලා දන්නවා. පසුගිය කාලයේදී ඉංගිරිසි ඉගැන්වීම අවශ්‍ය නැති කටයුත්තක් හැටියට රටේ හැඟීමක් ඇති වී තිබුණා. ඒ නිසා ඉංගිරිසි ඉගෙනීම ගැන උනන්දුව අඩු වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙනුයි දැන් මෙවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ. නමුත් ඒ ප්‍රතිපත්තිය අපි භාර ගන්නවා. නොදියුණු කියා හෝ දියුණු කියා හෝ භේදයක් ඇතිකර ගන්නට මෙහිදී වුවමනා කරන්නේ නැහැ. පුළුවන් තරම් ඉක්මනින් අපේ පාසල්වලට අවශ්‍ය ගුරුවරුන් සොයා ගැනීමේ කටයුත්ත ඉටු කරන්නට අපේ ආණ්ඩුව භාර ගෙන තිබෙනවා. පුළුවන් තරම් ඉක්මණින් ඒ අනුව ඒ කටයුත්ත කරන්නට අපේ අමාත්‍යාංශය භාර ගන්නා බව ප්‍රකාශ කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## දිගෝව - ඉඹුල්පිටිය පාර වැඩි දියුණු කිරීම

*திகோவ—இம்புல்பிட்டிய வீதியைச் செப்பனிடல்*

## IMPROVEMENTS TO DIGOWA-IMBULPITIYA ROAD

අ. භා. 7. 25

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

මගේ නමින් තිබෙන, පහත දැක්වෙන යෝජනාව මම ඉදිරිපත් කරනවා. ඒ ගැන කටයුතු කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

"දිගෝව-ඉඹුල්පිටිය පාරේ දිගෝව සිට මානික්කන්ද දක්වා වූ කොටසට ගල් අතුරා තාර දැමීම සඳහා ක්‍රියා කළ යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
**විසින් ස්ථිර කරන ලදී.**
*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## නූරිය - පොල්ගස්වත්ත පාර වැඩි දියුණු කිරීම

*நூரிய—பொல்கஸ்வத்த வீதியைச் செப்பனிடல்*

## IMPROVEMENTS TO NOORIYA-POLGASWATTA ROAD

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

මගේ නමින් තිබෙන, පහත දැක්වෙන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළුබෝවිල—කොහුවල පාර වැඩි දියුණු කිරීම

"රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් නුරිය පොල්ගස්වත්ත පාරේ කන්දකඩේ සිට පොල්ගස්වත්ත දක්වා වූ කොටසට ගල් අතුරා තාර දැමීම සඳහා ක්‍රියා කළ යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
**විසින් ස්ථිර කරන ලදී.**
*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කළුබෝවිල - කොහුවල පාර වැඩි දියුණු කිරීම

*களுபோவில—கொஹுவல வீதியைச் செப்பனிடல்*

## IMPROVEMENTS TO KALUBOWILA-KOHUWALA ROAD

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
මගේ නමින් තිබෙන, පහත දැක්වෙන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

"කළුබෝවිල-කොහුවල පාරේ කළුබෝවිල රෝහල අසල සිට කොහුවල දක්වා වූ කොටස පටු හෙයින් එය පුළුල් කිරීමට වහාම ක්‍රියා කළ යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
**විසින් ස්ථිර කරන ලදී.**
*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

කෑ/හාරදහ විද්‍යාලයට ගොඩනැගිල්ලක්

## දැරණියගල පුරාණ විහාරයට විදුලි බලය සැපයීම

*தெரணியகல புராண விகாரைக்கு மின்சாரம்*

## ELECTRICITY FOR DERANIYAGALA PURANA VIHARA

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
පහත දැක්වෙන යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"දැරණියගල පුරාණ විහාරයට විදුලිබලය ලබාදීම සඳහා වහාම ක්‍රියා කළ යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි"

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
**විසින් ස්ථිර කරන ලදී.**
*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කෑ/හාරදහ විද්‍යාලයට ගොඩනැගිල්ලක්

*கேஜீ/ஹாரதாஹ வித்தியாலயத்துக்குக் கட்டடம்*

## BUILDING FOR KG/HARADAHA VIDYALAYA

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
මගේ නමින් තිබෙන, පහත දැක්වෙන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

"කෑ/හාරදාහ විද්‍යාලයට ස්ථිර ගොඩනැගිල්ලක්, ගොවි උපකරණ හා ක්‍රීඩා භාණ්ඩ සැපයීමට වහාම ක්‍රියාකළ යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
විසින් ස්ථිර කරන ලදී.

அனுவதித்தார்.
*seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා. (බිබිලේ)
(திரு. ஆர். எம். தர்மதாச பண்டா—பிபிலே)
(Mr. R. M. Dharmadasa Banda—Bibile)
There is no Quorum.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
I do not think it is fair, having disposed of Government Members' Motions, that we should raise "No Quorum" when Opposition Members' Motions are being taken up. I do not think it is fair. If you insist, of course, I will have to ring the Quorum Bell, but I feel it is not fair because they did not raise "No Quorum" when Government Members' Motions were being discussed.

## දැරණියගල නගරයට ජලනල සේවයක් යනාදිය

தெரணியகல நகருக்கு நீர் விநியோகம் முதலியன

## Pipe-Borne Water Supply, Etc., for Deraniyagala Town

වීරසේකර මයා.
(திரு. வீரசேக்கர)
(Mr. Weerasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නමින් තිබෙන ඊළඟ යෝජනාව මා දැන් ඉදිරිපත් කරනවා.

"දැරණියගල නගරයට ජලනල සේවාවක් ලබා දීමටත් කාණු සහ කසල කාණු සෑදීමටත් වහාම පියවරක් ගත යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."



තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
විසින් ස්ථිර කරන ලදී.

அனுவதித்தார்.
*seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## පාඨශාලා පොත්පත් ආදියේ මිල පාලනය

பாடசாலைப் புத்தகங்கள் முதலியன

## Price Control of School Books, Etc.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නමින් තිබෙන පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"පාඨශාලා ශිෂ්‍යයන්ගේ භාවිතය සඳහා නියමිත පොත් පත්, ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් උපකරණ මිළ පාලනයට යටත් කළ යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

වීරසේකර මයා.
(திரு. வீரசேக்கர)
(Mr. Weerasekera)
විසින් ස්ථිර කරන ලදී.

அனுவதித்தார்.
*seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## නාවිමන උතුරට උප තැපැල් කාර්යාලයක්

வடக்கு நாவிமனவுக்கு உப தபால் நிலையம்

## Sub-Post Office for Nawimana North

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මා නමින් තිබෙන ඊළඟ යෝජනාව මම ඉදිරිපත් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

“ මාතර ජන්දදායක කොට්ඨාශය තුළ ගමනාගමන දුෂ්කරතාවය ඇති නාවිමන උතුරේ පදිංචි මහජනයාගේ පහසුව සලකා එහි උප තැපැල් කාර්යාලයයක් පිහිටුවිය යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි. ”

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## වල්ගම සෞඛ්‍ය මධ්‍යස්ථානය සංචාරක බෙහෙත් ශාලාවක් කිරීම

*வல்கம சுகாதார நிலையத்தை வட்டார மருந்தகமாக மாற்றல்*

CONVERSION OF WALGAMA HEALTH CENTRE INTO A CIRCUIT DISPENSARY

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඊළඟට මා නමින් තිබෙන පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

“ මාතර රෝහලට දිනපතා පැමිණෙන බාහිර ලෙඩුන්ගේ සංඛ්‍යාව වැඩිවී ඇති හෙයින්ද, මඩිහ, වැවහමන්දුව, වල්ගම, කනත්තෙගොඩ, වෙලේගොඩ හා ඉසදීන් නගරය යන ප්‍රදේශයන්හි ජන ගහනය සලකා එම ප්‍රදේශයන්හි ජනතාවට පහසුකම් සැලැසීම රජයේ යුතුකම හෙයින්ද, සංචාරක බෙහෙත් ශාලාවක් සඳහා අවශ්‍ය සියලු උපකරණ පරිත්‍යාග කිරීමට මඩිහ, ගොඩගම ගම්කාර්ය සභාව කැමැත්ත පළ කොට ඇති හෙයින්ද, මාතර ජන්දදායක කොට්ඨාශය තුළ වල්ගම පිහිටි සෞඛ්‍ය මධ්‍යස්ථානය සංචාරක බෙහෙත් ශාලාවක් බවට පරිවර්තනය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය වහාම ක්‍රියා කළ යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි. ”

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*



## මාතර ජන්දදායක කොට්ඨාශයට කොහු කර්මාන්ත ශාලාවක්

*மாத்தறைத் தொகுதிக்குத் தும்புத் தொழிற்சாலை*

COIR FACTORY FOR MATARA ELECTORATE

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා නමින් න්‍යාය පත්‍රයේ සඳහන් වී තිබෙන ඊළඟ යෝජනාව මම ඉදිරිපත් කරනවා.

“ මාතර ජන්දදායක කොට්ඨාශය තුළ මඩිහ, පොල්හේන, වල්ගම යන ගම් ප්‍රදේශයන්හි පොල් ලෙලි පල් කිරීම බහුල වශයෙන් කැරෙන හෙයින් එහි කොහු කර්මාන්ත ශාලාවක් පිහිටුවිය යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## මාතර ආරෝග්‍යශාලාවට ලේ බැංකුවක්

*மாத்தறை ஆசுபத்திரிக்கு இரத்த வங்கி*

BLOOD BANK FOR MATARA HOSPITAL

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඊළඟට මේ යෝජනාව මා ඉදිරිපත් කරනවා.

“ මාතර ආරෝග්‍ය ශාලාවේ ලෙඩුන් සඳහා ලේ බැංකුවක් පිහිටුවීමට වහාම ක්‍රියා කළ යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි. ”

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මාතරට රජයේ දුව ගබඩාවක්

மாத்தறைக்கு அரசாங்க மரக்காலை

## GOVERNMENT TIMBER DEPOT FOR MATARA

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

මා නමින් තිබෙන අනික් යෝජනාවත් මා දැන් ඉදිරිපත් කරනවා.

"මාතර නගරය තුළ රජයේ දුව ගබඩාවක් පිහිටුවීමට වහාම ක්‍රියා කළ යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**වීරසේකර මයා.**

*(திரு. வீரசேக்கர)*

(Mr. Weerasekera)

**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## වල්ගම-වැවහමන්දුව පාර ර. වැ. දෙ. ට ගැනීම

வல்கம—வவஹமந்துவ வீதியை

அ. க. வே. ப. வீதியாக்கல்

## CONVERSION OF WALGAMA-WEWAHAMANDUWA ROAD INTO A P. W. D. ROAD

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

න්‍යාය පත්‍රයේ ඊළඟට තිබෙන මගේ මේ යෝජනාව මා දැන් ඉදිරිපත් කරනවා.

"මාතර දිස්ත්‍රික්කයේ ජන්දදායක කොට්ඨාශය තුළ මඩිහ ගොඩගම ගම්කාර්ය සභාවේ පාලනය යටතේ පවත්නා වල්ගම-වැවහමන්දුව පාර රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පවරා ගත යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**වීරසේකර මයා.**

*(திரு. வீரசேக்கர)*

(Mr. Weerasekera)

**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது*

*Question put, and agreed to.*

## රජය පිළිගත් වෘත්තීය සමිතිවලට රැස්වීම් සඳහා පාසල් ගොඩනැගිලි ඉඩ දීම

அங்கீகரிக்கப்பட்ட தொழிற் சங்கக் கூட்டங்களுக்குப் பாடசாலைக் கட்டடங்களைப் பாவித்தல்

## USE OF SCHOOL BUILDINGS FOR MEETINGS OF APPROVED TRADE UNIONS

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

මේ යෝජනාව මා දැන් ඉදිරිපත් කරනවා.

"රජය පිළිගත් සියලු වෘත්තීය සමිතිවල රැස්වීම් සඳහා කේන්ද්‍රීය විරහිතව පාසැල් ගොඩනැගිලි ඉඩ දිය යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**වීරසේකර මයා.**

*(திரு. வீரசேக்கர)*

(Mr. Weerasekera)

**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question proposed.*

අ. භා. 7.30

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාඨශාලා ගොඩනැගිලි වෘත්තීය සමිතිවල රැස්වීම් පැවැත්වීම සඳහා පාවිච්චි කිරීමට ඉඩ දෙන්නැයි මේ යෝජනාවෙන් ඉල්ලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. 1957 සැප්තැම්බර් මාසයේ 3 වන දින අංක 39 දරන චක්‍රලේඛයේ මේ පාඨශාලා ගොඩනැගිලි පාවිච්චි කිරීම සම්බන්ධයෙන් සඳහන් වන්නේ මේ විධියටයි :

" සියලුම රජයේ පාසල්වල ප්‍රධානීන් වෙතටයි,

රජයේ පාසල් ගොඩනැගිලි පාවිච්චි කිරීම

පාසල් කාලයෙන් පිටත එම දවසේ එම වේලා වේදී එම ඉඩම හෝ ගොඩනැගිල්ලම පාවිච්චි කිරීමට අධ්‍යාපන, නිලධාරි තැන විසින් වෙන යම් පක්ෂය කට කලින් අවසර දී නැත්නම් පහත දැක්වෙන කරුණු සඳහා පාසල් ගොඩනැගිලි පාවිච්චි කිරීම සඳහා අවසර දීමට රජයේ පාසල්වල ප්‍රධානයන්ට මින් බලය දෙමි.

(අ) එම පාඨශාලාවේ ප්‍රධාන තැනගේ අනුමැතිය ඇතිව පිහිටුවන ලද ගුරු දෙගුරු සමිතිවල රැස්වීම්.

(ආ) මහිලා සමිති හා කාන්තා සමිති රැස්වීම් ඇතුළුව ග්‍රාම සංවර්ධන සමිතිවල රැස්වීම්.

(ඇ) හදිසි තත්ත්වය යටතේ රජයේ දෙපාර්ත මේන්තු විසින් පවත්වනු ලබන රැස්වීම්.

(ඈ) සමුපකාර සමිතිවල රැස්වීම්.

(ඉ) ඉරිදා පාසල්, ආගමික රැස්වීම් හා ආගමික පරීක්ෂණ.

(ඊ) ඒ ඒ පාඨශාලාවල ප්‍රධානියන්ගේ අනුමැතිය ඇතිව පිහිටුවන ලද ආදි ශිෂ්‍ය සමිතිවල රැස්වීම්.

අනික් සෑම කරුණක් සම්බන්ධයෙන් පාඨශාලා ගොඩනැගිලි පාවිච්චි කිරීම සඳහා කර ඇති ඉල්ලීම් අධ්‍යාපන නිලධාරි තුමාට ඉදිරිපත් කළයුතුය. ග්‍රාම සංවර්ධන සමිති, මහිලා සමිති හා කාන්තා සමිති රැස්වීම් සම්බන්ධයෙන් එවන ඉල්ලුම් පත්‍ර ඒ සමිතිවල ලේකම්වරයන් විසින් ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. පාසල් ගොඩනැගිල්ල පාවිච්චි කිරීමට වෙනත් සමිතියකට අවසර දුන් විට ඒ බව ඔබ විසින් අධ්‍යාපන නිලධාරි තැනට දැන්විය යුතුයි.

අංක 38 හා 1949 ඔක්තෝබර 10 දරන මගේ චක්‍ර ලේඛය, මේ චක්‍ර ලේඛයෙන් අවලංගු වේ.

එස්. ඒෆ්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

පාසල් ගොඩනැගිලි රැස්වීම් සඳහා පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අද බල පවත්වන්නේ ඒ නීතියයි. හොඳට පරීක්ෂා කර බලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොයෙක් විට කියන බණ්ඩාරනායක ප්‍රතිපත්තිය අනුව ඒ නීති සකස් කර තිබෙනවා යයි මා හිතනවා. ඒ නීති තේරුමක් නැති, අදට ගැළපෙන්නේ නැති කාරණා සොයා නොබලා සැඩු ඒවා ලෙස තමුන්නාන්සේලා කල්පනා කරන්නේ නැතැයි මා හිතනවා. පාඨශාලා ගොඩනැගිල්ලක් ඇතුළේ සිදු වන කටයුතු විනය ගරුක ඒවා වන්නට ඕනෑ. විනය නැති වන්නට ළමුන්ට වැරදි හැඟීම් ඇති වන්නට කිසිම ඉඩක් තබන්නට නරකයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

රැස්වීම පැවැත්වෙන්නේ ළමයින් ඉදිරියේ නොවෙයි.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

පාඨශාලා ඇතුළේ සිදු වන දේවල් ළමයින්ටත්, ඔවුන්ගේ දෙමාපියන්ටත්, පළාත්වාසීන්ටත් දැනගන්නට ලැබෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

පාර්ලිමේන්තුවේ කථා කෙරෙන දේවලුත් දැනගන්නට ලැබෙනවා.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ඒ අනුව කල්පනා කර බලන විට පාඨශාලා ගොඩනැගිලි තුළ වෘත්තීය සමිති රැස්වීම් පැවැත්වීමට ඉඩ දීම සතුටුදායක නොවේ යයි මා හිතනවා. [බාධාකිරීම්] පාඨශාලා ගොඩනැගිල්ලක් තුළ වන සිද්ධීන් පළාත්වාසී සෑම දෙනාටම දැනගන්නට ලැබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

Who is going to be responsible for the buildings and furniture ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Will the hon. Member consent to an adjournment of the discussion on this Motion so that we can dispose of the other seven non-controversial Motions ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

"විවාදය දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
**විසින් ස්ථිර කරන ලදී.**
*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ඊට අනුකූලව විවාදය කල් තබන ලදී. එතැන් සිට විවාදය 1968 දෙසැම්බර් 7 වන සෙනසුරාදා පවත්වනු ලැබේ.**

*விவாதம் ஒத்திவைக்கப்பட்டது. மீளத் தொடங்கு வது 7 டிசம்பர் 1968.*

*Debate accordingly adjourned: to be resumed on Saturday, 7th December, 1968.*

## මඩිහ-ගොඩගම ගම් කාර්ය සභා ප්‍රදේශයට හා නාවිමන-මාකාවිට ගම් කාර්ය සභා ප්‍රදේශයට ජල නළ සේවාවක්

*மடிஹ—கொடகம கி. ச. பகுதிக்கும் நாவிமன—மாகாவிற்ற கி. ச. பகுதிக்கும் குழாய்மூல நீர் வசதி*

PIPE-BORNE WATER SERVICE FOR MADIHA-GODAGAMA V. C. AREA AND NAVIMANA-MAKAWITA V. C. AREA

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මගේ නමින් තිබෙන පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා :

"මඩිහ-ගොඩගම ගම්කාර්ය සභා ප්‍රදේශයට හා නාවිමන-මාකාවිට ගම්කාර්ය ප්‍රදේශයට ජලනල සේවාවක් ලබා දීම සඳහා වහාම ක්‍රියා කළ යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
**විසින් ස්ථිර කරන ලදී.**
*அனுவதித்தார்*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ඉසදීන් නගරයට ජල නළ සේවාවක්

*இஸ்ஸதீன் பட்டத்துக்கு குழாய்மூல நீர் வசதி*

PIPE-BORNE WATER SERVICE TO ISADEEN TOWN

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මගේ නමින් තිබෙන පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා :

මාතර නගර සභා පාලනය යටතේ පවත්නා ඉසදීන් නගරයට ජල නළ සේවාවක් ලබා දීම සඳහා ක්‍රියා කළ යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
**විසින් ස්ථිර කරන ලදී.**
*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මාතර ඡන්දදායක කොට්ඨාශයේ ජල ගැල්මෙන් පීඩාවට පත්වන්නන්ට ඉඩම්

*மாத்தறைத் தொகுதியில் வெள்ளத்தால் பாதிக்கப்பட்டோருக்குக் காணி*

LAND FOR THOSE AFFECTED BY FLOODS IN MATARA ELECTORATE

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මගේ නමින් තිබෙන පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා :

"මාතර ඡන්දදායක කොට්ඨාශය තුළ නිරන්තර ජලගැල්මෙන් පීඩාවට පත් වන මහජනයාට උස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බිම් ලබා දිය යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினு எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මෙයින් තමුන්නාන්සේ අදහස් කරන්නේ ගංවතුරින් යටවෙන හැම ගෙයකම—

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගංවතුරෙන් යටවන ප්‍රදේශවල සිටින උදවියට අවුරුදු පතා ආණ්ඩුවෙන් සහනාධාර වශයෙන් විශාල මුදලක් වැය කරනවා. සමහර විට අවුරුද්දකට දෙතුන් වරක්ම මේ ගංවතුර ගැලීම් සිදු වෙනවා. ඒ නිසා ගංවතුර ගලන ප්‍රදේශවල සිටින අයට ගංවතුර නොගලන ප්‍රදේශවලින් ඉඩම් ලබා දෙන ලෙසයි මා ඉල්ලා සිටින්නෙ. මෙය සාධාරණ යෝජනාවක්.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினு விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මාර/තල්පාවිල මහා විද්‍යාලයට දන්ත චිකිත්සාගාරයක්

### எம்ஆர்/ தல்பாவில மகா வித்தியாலயத்திற்குப் பல்வைத்திய நிலையம்

### DENTAL CLINIC FOR MR/TALPAWILA MAHA VIDYALAYA

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

" මාතර ඡන්දදායක කොට්ඨාශය තුළ තල්පාවිල මහා විද්‍යාලය, තල්පාවිල කණිෂ්ඨ විද්‍යාලයය, කොකාවල විද්‍යාලයය, නාවිමන විද්‍යාලයය, වේරදුවේ බණ්ඩාරනායක විද්‍යාලයය, නාවිමන උතුර විද්‍යාලයය, මොටාගෙදර මහා විද්‍යාලයය, මොටාගෙදර කණිෂ්ඨ විද්‍යාලයය, කැකණදූරේ විද්‍යාලයය යන විද්‍යාලයන්හි පන්දහසක් පමණ වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා මාර/තල්පාවිල මහා විද්‍යාලයයෙහි දන්ත චිකිත්සාගාරයක් පිහිටුවිය යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අවට විද්‍යාල ගණනාවක්ම තිබෙනවා. ශිෂ්‍ය සංඛ්‍යාව 2,000 කටත් වැඩියි.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මාර/පඹුරන ශාරිපුත්‍ර මහා විද්‍යාලයට රසායනාගාරයක්

### எம் ஆர்/பம்புறண சாரிபுத்திர மகா வித்தியாலயத்திற்கு ஆய்கூடம்

### LABORATORY FOR MR/PAMBURANA SARIPUTRA MAHA VIDYALAYA

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

" මාර/පඹුරන ශාරිපුත්‍ර මහා විද්‍යාලයට සියලු උපකරණ වලින් සමන්විත රසායනාගාරයක් ලබාදීමට වහාම ක්‍රියා කළ යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*
*seconded.*

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

විද්‍යාගාරයකින් ප්‍රයෝජන ලබා ගැනීමට සෑහෙන තරම් ළමයින් ප්‍රමාණයක් සිටින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]
වා නම් මුදල් ලැබුණ විගසම එය කර දෙන්න බලන්නම්.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## මාර/නාවිමන මහාරාජ විද්‍යාලය

## எம்ஆர்/நாவிமன மகாராச வித்தியாலயம்

## MR/NAWIMANA MAHARAJA VIDYALAYA

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ගරු නාවිමන සමිද්ධි හිමියන් විසින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරා ඇති ඉඩමේ මාර/නාවිමන මහාරාජ විද්‍යාලයට අවශ්‍ය ගොඩනැගිලි තනා එතැනට එම විද්‍යාලය ගෙනයාමටත්, එය මහා විද්‍යාල තත්ත්වයට පත් කිරීමටත් වහාම ක්‍රියාකළ යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ස්වාමීන් වහන්සේ නමක් විසිනුයි මේ ඉඩම ආණ්ඩුවට පවරා දී තිබෙන්නෙ. එම ඉඩමේ නාවිමන මහා විද්‍යාලයට අවශ්‍ය ගොඩනැගිලි තනා එය මහා විද්‍යාලයක තත්ත්වයට උසස් කරන ලෙසයි මේ යෝජනාවෙන් ඉල්ලා සිටින්නේ.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
**විසින් ස්ථිර කරන ලදී.**

அனுவதித்தார்.
*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப் பெற்றது.
*Question proposed.*

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
ගොඩනැගිලි මහ විද්‍යාල කරන්නද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගොඩනැගිලි නොවෙයි. විද්‍යාලය මහා විද්‍යාලයක් කරන්නයි ඉල්ලා සිටින්නෙ. ඒ අවට ප්‍රදේශයේ මහා විද්‍යාලයක් ඇත්තේම නැහැ.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
අටවැනි පංක්තියෙන් ඉහළ පංක්තිවල ළමයින් කී දෙනෙක් සිටිනවාද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මම හරියටම දන්නෙ නැහැ. මේ පළාතේ මහා විද්‍යාලයක් නොමැති නිසා මෙහි සිටින ළමයින්ට ඈත ප්‍රදේශවල මහා විද්‍යාලවලට යාමට සිදු වී තිබෙනවා.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
මෙවැනි යෝජනා මේ විධියට ඉදිරිපත් කරනවාට වඩා, හොඳට කරුණු සොයා බලා අධ්‍යක්ෂතුමාත් සමග සාකච්ඡා කිරීමෙන් පසුව ඉදිරිපත් කිරීම හොඳයි කියා මා සිතනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මේ ගැන හොඳට කරුණු සොයා බැලීමෙන් පසුව තමයි මේ යෝජනාව මා ඉදිරිපත් කර තිබෙන්නෙ.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
නමුත් ළමයින් කොයි තරම් ඉන්නවාද දන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මට කියන්න පුළුවනි. මෙය ඉක්මනින් අවසන් කරන්න කිව් නිසා තමයි, මා බොහොම කෙටියෙන් කිව්වෙ. ඒ ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේට ලියා එවන්න මට පුළුවනි. මගේ යෝජනාව භාර ගන්නවා නම් මට විස්තර ලියා එවන්න පුළුවනි.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

වුවමනා තරම් ශිෂ්‍ය සංඛ්‍යාවකුත් සිටිනවා නම්, සල්ලිත් තිබෙනවා නම් බඩු ලබා දෙන්න පුළුවනි.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## පොලිස් ස්ථානවල තිබෙන බංකු වෙනුවට පුටු සැපයීම

*பொலிஸ் நிலையங்களில் முறையிட வருவோருக்கு நாற்காலிகள் வழங்குதல்*

## PROVISION OF CHAIRS FOR COMPLAINANTS AT POLICE STATIONS

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා.

"දිවයිනේ පොලිස් ස්ථානවලට පැමිණිලි සඳහා පැමිණෙන මහජනයාට වාඩිවීමට තිබෙන බංකු වෙනුවට, පුටු සැපයීමට වහාම ක්‍රියා කළ යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන වචනයක් කිව යුතුව තිබෙනවා. පොලීසියට ගිය ඕනෑම කෙනෙකුට වාඩිවෙන්න ලැබෙන්නේ බංකුවක් මිස පුටුවක් නොවෙයි. සමහර විට හොඳ ඇඳුමක් ඇඳ ගෙන ගිය කෙනෙකුට නම් මන්ත්‍රීවරයකු වැනි කෙනෙකුට නම් පුටුවක් දෙන්න පුළුවනි. එහෙම නැතුව සාමාන්‍ය කෙනෙක් ගිය විට වාඩි වෙන්න ලැබෙන්නෙ බංකුවක මිස පුටුවක නොවෙයි. මේ බංකුවල වාඩි වෙන පුද්ගලයන්ට තමන්ට නොසලකනවාය යන හැඟීමක් ඇති වෙනවා. ඒ නිසා බංකු වෙනුවට පුටු සපයන්න කියායි මේ යෝජනාවෙන් ඉල්ලා සිටින්නෙ.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

විසින් ස්ථිර කරන ලදී.
அனுவதித்தார்.
*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
வினா எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

**ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. ஆர். எம். தர்மதாச பண்டா)*
(Mr. R. M. Dharmadasa Banda)

ඒ ගැන මට කරුණක් දැන ගන්න තිබෙනවා. මෙයින් අදහස් කරන්නේ පුටුත් බංකුත් දෙවර්ගයම සපයන්න කියා ද? ඒ විධියට කරන්න ගියොත් සමහර විට අපේ සමාජවාදයට පහරක් වැදෙන්න පුළුවනි. සමහර අයට පුටුත් සමහර අයට බංකුත් දෙන්න ගියොත් එවැනි තත්ත්වයක් ඇති වෙන්න පුළුවනි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බංකු සැපයීම සම්පූර්ණයෙන්ම අත්හැර පුටු පමණක් සපයන ලෙසයි අපි යෝජනා කරන්නෙ.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැන් සම්මත කළේ 32 වැනි යෝජනාවයි. ඒ නිසා වැඩ කටයුතු නතර කර සභාව කල් තැබීම සුදුසුයි කියා මා හිතනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

I move,

"That the House do now adjourn."

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව ප. ව. 7.42 ට 1968 නොවැම්බර් මස 8 වන සිකුරාදා ප. ව. 2 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி சபை பி. ப. 7.42 மணிக்கு, 1968 நவம்பர் 8, வெள்ளிக்கிழமை பி. ப. 2. மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*Adjourned accordingly at 7.42 P.M. until 2 P.M. on Friday, 8th November 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් ඉදිරිපත් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த.பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு1)செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org